සිංහල සාහිත්‍ය නිර්මාණ තරගාවලිය
2023

ජයග්‍රාහී නිර්මාණ සමුච්චය

# පියුම්මාකර

තෙවැනි වෙළුම

# පියුමාකර

ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමය

සංවිධාන කරන

**සිංහල සාහිත්‍ය නිර්මාණ තරගාවලිය**

2023

**ජයග්‍රාහී නිර්මාණ සමුච්චය**

අලෙවිය සඳහා නොවේ.

සාහිත්‍ය කලා හැකියාවෙන් පිරිපුන් සහෘද බැංකුකරුවන්ගේ නිර්මාණශීලීත්වය සාහිත ලැදි පාඨකයන් වෙත සමීප කරවීමේ අරමුණෙන් මෙම කෘතිය මුද්‍රණය කරන ලදි.

**සංස්කරණය**
තරිඳු වනිගසූරිය

**කවර නිර්මාණය**
තිලංක පතිරණ

**පිටු සැකසුම**
ශාලින්ද විතාරණ

**තාක්ෂණික සහය**
සාලිංග කොඩිකාර
ලක්ෂාන් රණගල
අනුරාධ ප්‍රේමවර්ධන

ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමය
සංවිධාන කළ
සිංහල සාහිත්‍ය නිර්මාණ තරගාවලියේ
සම්මාන ප්‍රදානෝත්සවය වෙනුවෙන්
2024 පෙබරවාරි මස 09 වැනි දින මුද්‍රණද්වාරයෙන් එළිදක්වන ලදි.



## ලංකා බැංකුවේ මහා කළමනාකාරතුමාගේ සුබපැතුම් පණිවිඩය

ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමයේ වාර්ෂික නිර්මාණ තරගාවලියේ ජයග්‍රාහී නිර්මාණ ඇතුළත් "පියුමාකර" කෘතියේ තුන්වැනි වෙළුම වෙනුවෙන් සුබපැතුම් ගෙන එන්නට අවස්ථාව ලැබීම ඉමහත් සතුටකි. සහකම්පනයෙන් යුතු මානව ධර්මතා අගයන සමාජයක් බිහිකිරීමට කලාව සහ සාහිත්‍ය තුළින් දැවැන්ත පිටුබලයක් ලබා දේ. එනිසාම කාර්යබහුල, වගකීම්සහගත වෘත්තීය ජීවිතයක් ගතකරන අතර පවා නිර්මාණකරණයේ යෙදෙන්නට, කලාව සාහිත්‍ය ඇසුරු කිරීමට ලංකා බැංකු පවුලේ සහෝදර කාර්ය මණ්ඩල සාමාජික සාමාජිකාවන් කටයුතු කරනු දැකීම ඉමහත් සතුටකි. එය ඔවුන්ගේ පෞද්ගලික ජීවිතයේ සාර්ථකත්වයට මෙන්ම සමස්තයක් ලෙස ආයතනය සතු මානව සම්පතෙහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමටද හේතුවන බව මාගේ විශ්වාසයයි.

ලංකා බැංකුවේ වාර්ෂික සිංහල සාහිත්‍ය නිර්මාණ තරගාවලියේ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් සියළු දෙනාට හෘදයාංගම සුබපැතුම් පිරිනැමීමට මෙය අවස්ථාවක් කරගනිමි. එමෙන්ම මෙම තරගාවලියට නිර්මාණ ඉදිරිපත් කළ සැම දෙනාගේම නිර්මාණශීලී දායකත්වය ඉතා ඉහළින් අගය කරන අතර තවදුරටත් නිර්මාණකරණයේ යෙදෙමින් හරවත්, ගුණාත්මක නිර්මාණ සමාජයට දායාද කිරීමට ඔබ සියළු දෙනාට ශක්තිය ධෛර්යය ප්‍රාර්ථනා කරමි.

ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමය ඇසුරේ කටයුතු කරමින් මෙරට සාහිත්‍ය ක්ෂේත්‍රයේ කීර්තිමත් මෙහෙවරක යෙදුණු, යෙදෙන ලංකා බැංකු පවුලේ පුරෝගාමී සාහිත්‍යවේදීන් පිරිසක් ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමයේ 60 වැනි සංවත්සරයේදී ප්‍රණාම සම්මානයෙන් පිදුම් ලැබූ ආකාරය මේ මොහොතේ සිහිපත් කරමි. ඔවුන්ගේ පුරෝගාමී මෙහෙවරද ආදර්ශයට ගනිමින් වර්තමානයේ ලංකා බැංකු පවුලේ සාහිත්‍ය නිර්මාණවේදීන් අතරින් වැඩි පිරිසක් ජාතික තලයේ සාහිත්‍ය ක්ෂේත්‍රය තුළ කැපී පෙනෙන කාර්ය භාරයක් ඉටුකරනු දැකීම අපගේ අපේක්ෂාවයි. එමෙන්ම දෙමව්පියන්ගේ අඩි පාරේ යමින් නිර්මාණකරණයට පිවිසුණු ලංකා බැංකු කාර්ය මණ්ඩලයේ ආදරණීය දූ දරුවන් සියළු දෙනාට මාගේ හදපිරි සුබපැතුම් පිරි නමමි.

ඔබ සියළු දෙනාට සාර්ථකව, සඵලදායී ලෙස කලාව, සාහිත්‍ය ඇසුරු කරමින් ජන මනස පෝෂණය කරන නිර්මාණ අස්වනු නෙලාගන්නට ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

**රසල් ෆොන්සේකා**
මහා කළමණාකාර - ලංකා බැංකුව
(අනුශාසක ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමය)

## ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමයේ සභාපති නිලංග වරුෂවිතාන මහතාගේ පණිවිඩය



1986 වසරේ සිට අඛණ්ඩව පවත්වාගෙන යනු ලබන සිංහල සාහිත්‍ය නිර්මාණ තරගාවලිය මෙවරද සාර්ථකව පැවැත්වීමට හැකිවීම සම්බන්ධයෙන් නිහතමානීව සතුටු වන අතර ඒ සඳහා සහභාගී වූ සහ ජයග්‍රහණ හිමිකරගත් කාර්ය මණ්ඩල සාමාජිකයන් හා ඔවුන්ගේ දූ දරුවන්ට ප්‍රථමයෙන්ම මාගේ ස්තුතිය හා සුබ පැතුම් පුද කරමි.

සිංහල සාහිත්‍ය සංගමයේ පුස්තකාල කමිටුවේ නිලධාරීන්ගේ ස්වේච්ඡා දායකත්වයෙන් පවත්වාගෙන යනු ලබන හරවත් ග්‍රන්ථ 10,000 කට අධික ප්‍රමාණයකින් සමන්විත පුස්තකාල සේවාව සඳහාත්, වසර පුරා වරින්වර සංවිධාන කරනු ලබන සිනමා රසවින්දන, නාට්‍ය දර්ශන, ගීත රසාස්වාදන, විද්වත් කතිකාවත් මෙන්ම, කාර්ය මණ්ඩල සහෘදයන්ගේ ගායන, වාදන, නර්තන, නිවේදන හැකියාවන්ගෙන් වර්ණවත් වූ ප්‍රාසාංගික වැඩසටහන් ඉදිරිපත් කිරීමටත්, වාර්ෂික වැඩසටහන් අතර ප්‍රමුඛතම අංගයක් වන නිර්මාණ තරගාවලිය පැවැත්වීමටත් සහයෝගය ලබා දෙන ගරු ලේකම් තරිඳු වනිගසූරිය ඇතුළු සියලුම වත්මන් නිලධාරී මහත්ම මහත්මීන්ට මෙන්ම, සාහිත කෙත පෝෂණය කිරීමට ඇප කැප වූ අප පුරෝගාමීන් සහ ආරම්භක නිලධාරී මණ්ඩලවල සිට මේ දක්වා නියෝජනය කළ සියලු නිල දරුවන්ට මගේ අවංක ආදර ස්තුතිය පිරිනැමීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

ලංකා බැංකුවේ සාහිතකාමී, රසකාමී කාර්ය මණ්ඩලීය සහෘදයන් වෙනුවෙන් වාර්ෂිකව මෙවැනි නිර්මාණ සමුච්ඡයක් එළිදැක්වීමට සිංහල සාහිත්‍ය සංගමයට හැකි වීම අපට මහත් අභිමානයක් වන අතර ඒ සඳහා නිරන්තර අවවාද අනුශාසනා මෙන්ම ඉඩහසර සලසා දෙනු ලබන මහා කළමනාකාරතුමා ප්‍රමුඛ අනුශාසක මණ්ඩලයටත්, ආයතනික හා විධායක කළමනාකාරිත්වයේ මහත්ම මහත්මීන්ටත් අපගේ ගෞරවාදරය පිරිනැමිය යුතුමය.

සහෝදර කාර්ය මණ්ඩලයේ නිර්මාණශීලී හැකියාවන් වැඩිදියුණු කරගන්නා අතර සතුටින් සිය රාජකාරී කටයුතු කිරීමට අවශ්‍ය පරිසරය සලසාදීමට අප සමග සහයෝගයෙන් කටයුතු කළ සමස්ත සාමාජිකත්වයටත්, ලංකා බැංකුවේ අලෙවි අංශය හා tvBOC කණ්ඩායමටත්, පුහුණුකිරීම් දෙපාර්තමේන්තුවේ සහෘදයන්ටත්, සුබසාධක දෙපාර්තමේන්තුවේ රොහාන් කොඩිකාර මහතා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමි.

අවසාන වශයෙන් තවදුරටත් සාහිත්‍යකරණයේ යෙදී මානසික සුවයෙන් යුතුව රාජකාරියේ යෙදීමට ඔබ සැමට ශක්තිය ධෛර්යය ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

## සිංහල සාහිත්‍ය නිර්මාණ තරගාවලියේ
## විනිශ්චය මණ්ඩලය



**ගීත රචනා**

රාජ්‍ය සම්මානලාභී, ප්‍රවීණ ගේය පද රචක, කිවියර

**ආචාර්ය රත්න ශ්‍රී විජේසිංහ මහතා**



**පද්‍ය රචනා - නිසඳැස්**

සම්මානිත ලේඛක (කාව්‍ය සහ නවකතා දෙඅංශය සඳහාම රාජ්‍ය සම්මාන, ගොඩගේ සාහිත්‍ය සම්මාන සහ විද්‍යෝදය සාහිත්‍ය සම්මානලාභී)

සන්ථව ප්‍රකාශන ආයතනයේ අධිපති

**මහින්ද ප්‍රසාද් මස්ඉඹුල මහතා**



**පද්‍ය රචනා - සඳැස්**

විද්‍යෝදය සහ ගොඩගේ සාහිත්‍ය සම්මානලාභී ලේඛක

**රුවන් බන්දුජීව මහතා**



**කෙටිකතා**

රාජ්‍ය සම්මානලාභී ප්‍රවීණ ලේඛක, ජාතික රූපවාහිනී සංස්ථාවේ විශ්‍රාමික නියෝජ්‍ය අධ්‍යක්ෂ, ගොඩගේ ප්‍රකාශන ආයතනයේ උපදේශක සහ ව්‍යාපෘති සම්බන්ධීකාරක

**අනුරසිරි හෙට්ටිගේ මහතා**



**ඡායාරූප (කළු සුදු සහ වර්ණ)**

කැළණිය විශ්වවිද්‍යාලයේ ලලිත කලා අධ්‍යයනාංශයේ,

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**ආචාර්ය උදිත ගයාෂාන් ගුණසේකර මහතා**

## සිංහල සාහිත්‍ය නිර්මාණ තරඟාවලියේ විනිශ්චය මණ්ඩලය



**කාර්ය මණ්ඩලීය චිත්‍ර**

කලා ඉතිහාසඥ, චිත්‍රශිල්පී, ග්‍රැෆික් නිර්මාණ ශිල්පී,
සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලයේ දෘශ්‍ය කලා පීඨයේ

**මහාචාර්ය ජේ.ඒ.වී.එන්.ජයතිලක මහතා**



**ළමා චිත්‍ර**

ජාතික අධ්‍යාපන ආයතනයේ සෞන්දර්ය අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

**ඥානසිරි ගමගේ මහතා**



**ළමා පද්‍ය රචනා**

ගීත රචක, පරිවර්තක, ළමා සාහිත්‍ය නිර්මාණවේදී, කිවියර

**වෛද්‍ය නුවන් තොටවත්ත මහතා**



**ළමා රචනා - ළමා කෙටි කතා**

ගොඩගේ සාහිත්‍ය සම්මානලාභී ලේඛිකා

**සඳිනි ප්‍රාර්ථනා තෙන්නකෝන් මෙනෙවිය**

## සංස්කාරක සටහන

ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමයේ වජ්‍ර ජයන්ති සැමරුමට සමගාමීව 2022 වසරේ පැවැත්වූ අන්තර් බැංකු සාහිත්‍ය තරගාවලිය හරහා බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ නිර්මාණවේදීන් හට සදානුස්මරණීය මතකයක් ඉතිරි කළ අප ඉන් අනතුරුව එළඹුණු 2023 වර්ෂය තුළ සුපුරුදු පරිදි ලංකා බැංකුවේ කාර්ය මණ්ඩලය සහ ඔවුනගේ දූ දරුවන් වෙනුවෙන් වාර්ෂික සිංහල සාහිත්‍ය නිර්මාණ තරගාවලිය සංවිධාන කරන ලදි.

1961 වසරේ ආරම්භ කෙරුණු ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමයේ වාර්ෂික වැඩසටහන් අතර ප්‍රමුඛතම ස්ථානය හිමිවන සාහිත්‍ය නිර්මාණ තරගාවලිය මුල් වරට සංවිධාන කෙරෙන්නේ 1986 වසරේ සංගමයේ රජත ජයන්තියට සමගාමීවය.

තරග අංශ තුනකින් ආරම්භ වූ මෙම තරගාවලිය මේ වන විට තරග අංශ අටක් යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම දූ දරුවන්ගේ නිර්මාණ තරගාවලිය යටතේද වයස් කාණ්ඩ කිහිපයක් යටතේ චිත්‍ර, රචනා, පද්‍ය රචනා සහ කෙටිකතා තරග ක්‍රියාත්මක කරමින් නවක නිර්මාණවේදීන් දිරිගැන්වීම සඳහා වන අපගේ ප්‍රයත්නය අනවරතව දැරීමට හැකිවීම ඉමහත් සතුටකි.

2023 වසරේ නිර්මාණ තරගාවලියේ ජයග්‍රාහී නිර්මාණ ඒකරාශී කරමින් ඔබ අතට පත්වන "පියුමාකර" තුන්වැනි වෙළුමද මෙහි පළමු සහ දෙවන පියවර මෙන්ම සාහිත්‍යකාමී පාඨක හදවත්, දෙනෙත් සනසාලන පියුම් විලක්ම වනු ඇතැයි විශ්වාස කරමි.

මෙම නිර්මාණ එකතුව ඔබ අතට පත්කිරීමේදී අපගේ ගෞරවනීය විනිශ්චය මණ්ඩලයේ දායකත්වය වෙසෙසින්ම සිහිපත් කළ යුතුය. ඔවුන් ඉතා අපක්ෂපාතී ලෙස සියලු නිර්මාණ ඇගයීමට ලක් කරමින් මෙම ජයග්‍රාහී නිර්මාණ සමුච්චය තෝරාගැනීම සඳහා කටයුතු කළ අතර ඔවුන් විසින් ඇගයුමට ලක් කළ ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් නම් වශයෙන් සහ පුද්ගලයන් වශයෙන් ඔවුන් හඳුනාගනු ලබන්නේ සම්මාන ප්‍රදානෝත්සවයේදී වීම අප තරගාවලියේ ඇගයුම් ක්‍රියාවලියේ පවතින පාරදෘශ්‍යභාවයට කදිම නිදසුනකි.

තරගාවලියට අදාළ තාක්ෂණික කරුණු කිහිපයක් දැනුම්දීම සඳහාද මෙය අවස්ථාක් කරගනිමි.

ආධුනික නිර්මාණකරුවන් වැඩි ප්‍රමාණයකට අවස්ථාව ලබාදීමේ අරමුණින් සඳැස් සහ නිසඳැස් ලෙස තරග අංශ දෙකක් නම් කිරීමට අප සංවිධායක මණ්ඩලය කටයුතු කළත් පද්‍ය රචනා විනිශ්චය සඳහා එක්වූ ප්‍රවීණයන් දෙපළගේ

මතය වූයේ කවිය සඳැස්, නිසඳැස් ලෙස ආකෘතිගත කර ඇගයීමට ලක් කිරීම එතරම් උචිත නොවන බවයි. කෙසේ නමුත් අපගේ අරමුණ සමග එකග වෙමින් ඔවුන් ලැබී තිබූ නිර්මාණ අතරින් නිර්මාණශීලීත්වයෙන්, ආකෘතියෙන්, තේමාවකින් වඩාත් කැපී පෙනෙන නිර්මාණ තෝරාදීමට කටයුතු කරන ලදි.

එමෙන්ම අපගේ තරගාවලි ආකෘතිය අනුව සෑම තරගකරුවෙක්ටම එක් එක් තරග අංශය සඳහා නිර්මාණ දෙක බැගින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දී තිබේ. නමුත් ඇගයුම් ක්‍රියාවලියෙන් පසු ජයග්‍රාහී නිර්මාණ ලැයිස්තුගත කිරීමේදී යම් තරග අංශයක එකම තරගකරුවෙකුගේ නිර්මාණ දෙකම ඉහළම ලකුණු ලද නිර්මාණ අතරට එක්ව තිබූ අවස්ථාවලදී ඒ අතරින්ද ඉහළම ලකුණු ලැබූ නිර්මාණය ඉතිරි කර, අනෙක් නිර්මාණය වෙනුවෙන් ලකුණු සටහනේ ඊළග ස්ථානයට සිටින නිර්මාණයට අවස්ථාව ලබා දීම සිදු කිරීම අප මේ දක්වා ක්‍රියාත්මක වූ පිළිවෙලයි. මේ කරුණ විශේෂයෙන් සඳහන් කළේ මෙම නිර්මාණ සමුච්ඡයට ඇතුළත් නොවුණද ජයග්‍රාහී නිර්මාණවේදීන්ගේ තවත් ප්‍රශස්ත නිර්මාණ පැවති බව සිහිපත් කිරීමටය.

සාමාන්‍යයෙන් මෙම තරගාවලියේ නිර්මාණ විනිශ්චය වෙත යොමුකිරීමේදී සෑම නිර්මාණයක් සමගම තරගකරුවන්ගේ කිසිඳු පෞද්ගලික තොරතුරක් ඇතුළත් නොකර කේත අංකයක් සමග පමණක් නිර්මාණ යොමුකරන අතර, ළමා තරග අංශවල පමණක් කේත අංකයට අමතරව දරුවාගේ වයසද සඳහන් කරන ලද්දේ වයසට සාපේක්ෂව නිර්මාණය සඳහා වන ඇගයීම ලබාදෙමින් වඩාත් නිරවද්‍ය සහ සාධාරණ විනිශ්චයක් ලබාදීමට ගරු විනිසුරුවරුන්ට හැකිවනු පිණිසය.

ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමයේ නිලධාරී මණ්ඩලය ඇතුළු සමස්ත සාමාජිකත්වයට මෙම තරගාවලිය අඛණ්ඩව පැවැත්වීමට කාලයෙන්, ශ්‍රමයෙන් මෙන්ම මූල්‍යමය වශයෙන් දායකවීම වෙනුවෙන් මාගේ හදපිරි ප්‍රණාමය පුදකරමි. එමෙන්ම ඉතා කෙටි කාලයක් තුළ මහත් පරිශ්‍රමයක් දරමින් මෙම නිර්මාණ යළි කියවමින් අඩුලුහුඬුකම් නිවැරදි කළ ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමයේ හිටපු ගරු සභාපතිවරයෙක් වන ප්‍රවීණ සාහිත්‍යවේදී දේ.වි.ගාල්ලගේ මහත්මාට කෘතඥතාපූර්වක ප්‍රණාමය පුදකරමි.

කාර්යබහුල වෘත්තීය ජීවිතයට මඳ ඉසිඹුවක් ලබාදෙන මෙම තරගාවලියෙන් සවි ලබා ජාතියේ මහා පහන්ටැඹේ සෙවණෙහි සිරිලක කලා කෙත පෝෂණය කරන නිර්මාණවේදීන් තව තවත් බිහිවෙනු දැකීම අපගේ එකම පැතුමයි.

**තරිඳු වනිගසූරිය**

ලේකම් - ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමය

## පටුන

### ගීත රචනා


අප්පච්චියේ දැන් නැගිටින් මං ආවා 13
කිතුල් මල් කවි 14
දන් දීම් දියණිය 15
කඳුළු විසිදැල එළුණු තීරය 16
සංසාරයයි නුඹ මගේ 17
දිවි ඇති තුරා 18
ආදරය පිදුමක් 19
චන්ද්‍ර මණ්ඩලේ සාවි 20


### පද්‍ය රචනා - නිසඳැස්


සිංහයාගේ අවනඩුව 21
ප්ලේටොනික් ප්‍රේමය 22
ගිමන් හරින සුසුම්පොදක් 23
අත්තාගේ තුන් මාසේ පිංකම 24
තාමත් පරක්කු මං 25
සදාකාලික 26
මටත් මල්ලියෙක් 27
ලෙයින් තෙත් වුණු සඳ මඬල 28
බඳුලු බබා 29
කැන්ටිමේදී දැකපු ඔයාට 30


### පද්‍ය රචනා සඳැස්


ජියෙකොන්ඩෝ ඩෙල් ලීසා 31
නෝක්කාඩු මාලය 32
මමයි මනමේ කුමරුගේ හද හරහා ගිය ඒ අසිපත 35
අප්‍රකාශිත ප්‍රේමය 37
අප්පච්චී 38
හදේ ඇනුණයි නෙළුම් කටුවක් 39


### කෙටි කතා


කුලවමියෝ 42

විරහව 55
සමන්මලී ගේ මරණය 60
නිකිණි වැහි 66
තල බෝල 75
ලියුම 92
කැර(ළ)ලිකාරයෝ 99

**ළමා පද්‍ය රචනා (වයස අවු.09-12 කාණ්ඩය)**

අම්මා ගෙදර නෑ 107
අහසෙයි මුහුදෙයි යාළුවො දෙන්නා 108
නංගියේ 110
අලියා 111
කුරුළු ලෝකය 112

**ළමා රචනා (වයස අවු.09-12 කාණ්ඩය)**

මම සමනලයෙකු වෙමි 113

**ළමා කෙටිකතා (වයස අවු.13-15 කාණ්ඩය)**

සැබෑ මිතුදම 114

**කළුසුදු ඡායාරූප -තරග අංශය**

සමුද්‍රිමත් 118
මට මහළු වයසේ බැරිද වෙන වාදනා පෙරසේ 119
Happiness 120
ලෙන් වියන් 121
පිළිකන්න 122
තුරු අතරින් අහස්ගැබ 123

**වර්ණ ඡායාරූප තරග අංශය**

ගනඳුර විනිවිද 124
උරගාලංකාර 125
Coming out from Sand 126

රැල්ලයි, වෙරළයි, බෝලෙයි, මමයි 127
කිරි දරුවෝ 128
දෙන්නෙ නෑ දෙන්නෙම නෑ 129


**කාර්ය මණ්ඩලීය චිත්‍ර තරග අංශය**


චක්‍ර 130
පාසල් දිවියේ සොඳුරුම පන්ති-අඹ ගහ යට 131
අවුරුද්ද 132
සෙනෙහසක අරුත 133
මහමෙරක් තරම් වූ මව් සෙනෙහස 134
ගැමි අසිරිය 135
නාරි 136
ජීවිතය 137


**ළමා චිත්‍ර (වයස අවු.03-05 කාණ්ඩය)**


මගේ අම්මා, තාත්තා, මම සහ අක්කා 138
බළල් පොරය 139
මමයි, මගේ යාළුවා සතුකියි 140
ඔරු පදිමු 141
මම 141
අම්මා 142
පෙරහැර 142
අපි නිවාඩුවට ගමේ යනවා 143


**ළමා චිත්‍ර (වයස අවු.06-10 කාණ්ඩය)**


නංගිට උණ හැදිලා අම්මයි, මමයි බෙහෙත් ගේන්න යනවා 144
අවුරුද්දේ මම වැඩියෙන්ම සතුටු වූ දවස 145
අපේ ගෙදරට හාමුදුරුවෝ නමක් පිඬුසිඟා වැඩියා 146
ඇති යන්තම් ශිෂ්‍යත්ව විභාගය ඉවරය 147
අපේ ගමට බොම්බයි මොටයිකාරයෙක් ආවා 148
ගහ උඩ සෙල්ලම් ගෙදර 148
පාට පාට ගිරා පැටියා 149

වනයේ අසිරිය 149
සිරි මාමගෙ ගොවිපල 150
අපේ බුදුන් අපි වැන්දා 150
වැසි දිනයක අක්කයි මමයි 151
මගේ යාළු මාළු 151

**ළමා චිත්‍ර (වයස අවු.11-14 කාණ්ඩය)**

අලුත් පාසලට මං ගියදා 152
නිවාඩු කාලේ සෙල්ලම් ලෝකේ 153
වනයක අසිරිය 154
නයි නටවනවා 155
සන්නිදර්ශන - සොබාදහම් අසිරිය 155
අවුරුදු කාලය 156
යහළුවන් සමඟ මුහුදු පතුලේ සංචාරයක් 156
මගේ ගෙවත්ත මම ආසම විදිහට 157

**ළමා චිත්‍ර (වයස අවු.15-18 කාණ්ඩය)**

යුද්ධය සහ ළමා මනස 158
හෙළ කුල කත 159
සුන්දර පරිසරයක අසිරිය 160

## ගීත රචනා තරග අංශය
# ප්‍රථම ස්ථානය

### "අප්පච්චියේ දැන් නැගිටින් මං ආවා"

කුරහන් යාය එපිටින් බොල් පිනි බෑවා
සඳ ගිනි අරන් වැලපෙනු ඇයි සඳ සාවා
දෙමළිති රෑන් හරි හරියට ගතු කීවා
අප්පච්චියේ දැන් නැගිටින් මං ආවා//

සිහිනෙන් මාව දුටුවලු අම්මා කීවා
ගිනියම් කොළඹ අහසේ අසරණ වූවා
ඉනි වැට ළඟදි පපු මැද ගිනි දළු ලෑවා
අප්පච්චියේ දැන් නැගිටින් මං ආවා//

ලණු ඇඳ කතාවක් කිරි කිරියෙන් කීවා
තෙල් බෙහෙතක සුවඳ හුළඟට මුහු වූවා
පමා වුණා පට පිළි මත් ගෙන ආවා
අප්පච්චියේ දැන් නැගිටින් මං ආවා//

**-සුරංජි නිල්මිණී ප්‍රේමරත්න-**
(පරිපාලන සේවා දෙපාර්තමේන්තුව)

## දෙවන ස්ථානය

# "කිතුල් මල් කවි"

සෝලි ගන්නට කාරි නෑ වෙද
ආල පිරුවට මං හිතින්
දෙපා සැරසුව සිලම්බුවෙ හඬ
වාරු නෑ යන්නට අහන්
කාරි නෑ මට ආයෙ කියපන්
වලව් අකැපයි කියූ වග මට
කුමාරිහාමී පුංචි කුමාරිහාමී

පිච්ච කැකුලක් වාගෙ හිමිදිරි
හීන් හිරිපොද වැටී ඇහැරුණ
මුවැත්තියකගෙ ලීලෙ පානා
හරවහරවා සිඟිති ඇහැ කන
ඔහොරි පොට බැඳ රනින් කන කර
දේව රූ සිහි වුණා වෙද මට
කුමාරිහාමී පුංචි කුමාරිහාමී

රැන කිතුලට උනා වරලස
පීරපීරා උන්නු උඹෙ හැඩ
වාර ගණනක් දුටුව මුත් ඉඩ
දෝර ගැලුවා ආල හිත අද
වරය දුන්නේ අපේ වරිගෙට
හීන කුල මට තරහ අවසර
කුමාරිහාමී පුංචි කුමාරිහාමී

හකුරු තෙලි දිය කපන පිහි තුඩ
පපු කැනැත්තට ඇන්න හේමා
ගිනි ගහන අව් ගින්දරට මයෙ
දෑස ගිනි කණ වැටුණු හේමා
පාත් වී ඉහ නමා අහකට
නොවී කොහොමෙයි නම්බු පාලා
කුමාරිහාමී පුංචි කුමාරිහාමී

**-නදීශා පෙරේරා-**
(අගනුවර ශාඛාව- චාරිකා අංශය)

## තෙවන ස්ථානය

# "දන් දීම් දියණිය"

සිලෝ ගී මැද
මඟුල් බෙර හඬ
දසත වැයෙනා සුබ යමේ
පාවාඩ මත
නුඹ පෝරුවට
නංවන්න යන වෙලාවේ
අත නොවේ මගෙ
හිතත් ගැහුණා
රන් හුයෙන් නුඹ බැඳි වෙලේ
කුරවි කෙවිලිය
ඉගිල යන්නට
හදයි නොපෙනෙන මායිමේ

මන්ද්‍රි දේවිය හඬා වැලපේ
හිස දරාගෙන කිරි කඬේ
සිනාසෙන ඇස් කඳුළු සිරකර
දෝණි පෝරුව මස්තකේ
අයියණ්ඩි නුඹ වෙලා ඈතට
ළඟට එන්නට බෑ වගේ
මගේ දෝණිය කොහොම දෙන්නද
නුඹව මං වෙසතුරු වගේ//

කොතෙක් කල් අපි ළඟින් උන්නද
තියාගෙන ඇහි පිල්ලමේ
ඉතින් දරුවනි අදින් මතුවට
සරණ වේ රත්නත්තරේ
අතින් අල්ලා පැටව් දෙන්නා
බමුණු ජූජක ගත් වෙලේ
කඳුළු එන්නැති බෝසතුන්ටත්
එදා වෙසතුරු දා කවේ//

**-පී ජී ආර් ඉන්ද්‍රාණී වෙලගෙදර-**
(කෑගල්ල අධිශ්‍රේණි ශාඛාව)

## කුසලතා

# "කඳුළු විසිදැල එළුණු තීරය"

පරෙවි අත්තටු බිඳී විසුරුණු
ගම් නියම් පාසා
කඳුළු විසිදැල එළී මැලැවුණු
තීරයයි ගාසා

හුස්ම අයදින දැවෙන දෙරණත
රුහිරු බිඳු වල දැවටිලා
පිපී ගෙන එන පියරු මල් කෙමි
හැලී පොඩිවී පරවෙලා

සියක් නෙතගින් වැටුණු කරදිය
සුනාමියකින් වෙස් වලා
රැගෙන යයි නම් සැපකි පිළිමල්
ලොවම ගින්නෙන් මුදවලා

සෙත් පිරිත තොලගට අරන්
තුට අඳින්නට හැකි නම් වතේ
සාමයේ සුබ හීනයක හිඳ
කිරි හිනා නඟපන් පුතේ

**-නිසංසලා ස්වර්ණමාලී මදනසිංහ-**
(ගෝනපල ශාඛාව)

කුසලතා

# "සංසාරයයි නුඹ මගේ "

සන්තාප හිත හදන
පෙම් ස්නේහ හිත රැඳෙන
සඳ කුමරු නුඹ මගෙ ලොවේ
සංවේග දුරු කරන
පෙම් තුහින මල් වහින
අරුමයකි අපෙ ආදරේ
මීවිතකි මගෙ ජීවිතේ

දුර ඈත සංසාරෙ
හුරු පුරුදුකම් දැනෙන
සංසාරිකයි ආදරේ
නුඹ ගැනම මට හිතෙන
නුඹ ගැනම මම පතන
පෙම් භාවනාවක් වගේ
මුදු ගීතිකාවක් වගේ

උපනුපන් වර සසර
නුඹෙ අතම ගනු රිසින
පියමනිම් නුඹෙ මාවතේ
මට පෙම් කෙරූ සබඳ
මුළු හිතම ගනු මැනව
නුඹමයි මගේ ජීවිතේ
සංසාරයයි නුඹ මගේ

**-එස් එල් ඒ ඩී ලේකම්ගේ-**
(දෙහිඕවිට ශාඛාව)

## කුසලතා

# "දිවි ඇති තුරා"

පි - දුර ඈත කඳු යාය
පීරා හමා
ඔබ සොයමි පවනක් වෙලා

ගැ - ඒ පවන සිපගන්න
කුසුමක් වෙලා
මම හිඳිමි පෙර මඟ බලා

පි - අහසක් වෙලා හිඳිමි
තරු පිරිවරා
සඳ මඬල ඔබ එනතුරා

ගැ - පියුමක් වෙලා පිපෙමි
හසරැලි දරා
හිරු මඬල පිබිදෙන තුරා

පි - දිවි කතර සනහන්න
කෙම් බිම වෙලා
සුව සදමි දුකඳුර ඉරා

ගැ - ඔබෙ ලොවට මඟ කියන
පහනක් වෙලා
ළඟ හිඳිමි දිවි ඇති තුරා

**-බුද්ධිකා නිශාන්ති සෙනරත් යාපා-**
(ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානය- මාතර)

## කුසලතා

# "ආදරය පිදුමක් "

ස්නේහයේ තුරු වදුල මත හිඳ
පිපෙන පරවෙන නැවත පීදෙන
විටෙක රිදවන සදා සුව දෙන
ආදරය පිදුමක් ම පමණය

ජීවිතය කෙටි බව කිවුවද
නුඹ නැතිව එය බෝ දුරයි මට
නිම්නයක මා තවම තනිවම
ගඟ වෙනතකින් ගලා ගිය කල
සදා සැනසෙමි දුරින් හිඳ මම

අදත් ඉඳහිට මතක පොත ඇර
ඇස ගැටෙන පෙර වදන සමඟම
තවම හිස් වූ පිටු අතර හිඳ
වෙර දරමි රුව මවාගන්නට
අවසනක් හිමි නෑ ප්‍රේමයට

**-පී ඒ ඩී ජයලාල් සුදේශ්-**

(ආයතනික ශාඛාව - පරිපාලන)

## කුසලතා

# "චන්ද්‍ර මණ්ඩලේ සාවි"

ඉර රෑට දැන්
ගෙදර එන්නෙම නැහැ
සඳ කළු වලාවෙන්
වහං වෙලා කඳුළු සලනවා

තරු මාල පැළඳ ගෙන
අඟහරු ලොවෙන් ආව
කුමාරයෙකුගෙ බහට රැවටිලා
සුදු තාරකා දිය වෙලා යනවා
ඈත ක්ෂිතිජයේ
කිඳුරියක අත නැළවෙනවදෝ

පාළු වීදි දිග තැන තැන
ආදරය සොයා ඇවිදින
සාවියක් දුටුවාද
ඉරුණු කඩමළු ඇඳ ගෙන
ඉරත් හඳත් ගැන දොඩ දොඩා
සාවියක් දුටුවදෝ

බැස ගිය හිරු යළි ආවත්
ඇයි නුඹ නො එන්නේ
හිනැහෙන හැම හවසක
කඳුළු කැටයක් තිබුණා හැම රැයකම

**-ඉන්දික තුෂාර ගමගේ-**
(නීති අංශය - දකුණු පළාත් කාර්යාලය)

## පද්‍ය රචනා - නිසඳැස්
## ප්‍රථම ස්ථානය
# "සිංහයාගේ අවනඩුව"

සපමින් බිලිං ගෙඩි ඇඹුලට
පෙරළමින් තොල් නොපිටට
පොලුවලින් සලකමින්
එලපිරුණු අඹ රැකකට

වක්කඩේ දණ්ඩින්ට මානමින් පොල්කටුව
කුඹින්ටත් සීනි විසි කළ
ගංගොඩේ ගෙවල්වල බත් මුට්ටි හිස් කළ
ගමක් නෑ සියන් වූ එදවස

පැටිවියේ මතකය පුබුදන
ඇලුණු කොම්පියුටර් තිර මතට
කුරුලු දරුවන් ගෙන කූඩුවේ දොර ළඟට
සිතමි නිදහස් කරන්නට
ඇවිදිමින් ගුරුපාරවල
උරමින් රොන් නිල් කටරොළු මලක
පියඹා එන්න විනිවිද සක්වළ

වියපත් බඹර තුඩු ගැන පුවතක්
කැකුළු මල් පොඩි කළ සියයක්
තාප්පයෙන් කොටු කළ මිනිසෙක්
ගමක් යැයි නම් ලද ගොඩනැගිලි යායක්

අවදිව සිංහ හදවත
වසාලයි දොර කවුළු ලෙන් දොර තර කොට
කැබලි වුණ සිත එක් කොට
මිලට ගෙන ටිකැට්ටුවක් දිනකට
පෙන්වමි උන්ට බත්තරමුල්ලේ "අපේ ගම"

**-ඩබ් එම් එච් ඒ එස් එස් බී ඒකනායක-**
(අගනුවර ශාඛාව- අයකිරීම් අංශය)

## දෙවන ස්ථානය

# "ප්ලේටොනික් ප්‍රේමය"
# -Platonic Love-

ජීවය ආරම්භයේ කිනම් හෝ අවධියක
ඔබ අප දෙදෙන
එකම තරුවක්ව සිටින්නට ඇත
එක් අහඹු නිමේශයක ඒ තරුවෙන්
කැඩී වෙන්වී
මේ පොළෝ තලයේ
වෙන්ව ජීවය ලද මුත්
ඒ හුරුපුරුදු අතීතානුස්මරණය
මේ මුළු දිවිය පුරා
නුඹම පමණක් සෙවූ බව හා
නුඹද පෙරළා මා සෙවූ බව
හොඳින් හැඳින ගත්තෙමි
එදා විසල් අහස මත හමු වූ නුඹ
මෙදා විසල් පොළොව මත
පළමු (දෙවන) වරට හමුවූ පසු
එදා අහිමිව ගිය ආත්මය
නැවත මා සතු බව
හැඳිනගත්තෙමි අද දින

**-ඊ එම් ජී ජී ඒ එන් ඒකනායක-**
(මාරස්සන ශාඛාව)

## තෙවන ස්ථානය

# "ගිමන් හරින සුසුම්පොදක්"

සහස්පත් අතරින් පෙරී
දහස් පෙති මත හැඩ වැටී
මිහිමඬලටම හුස්ම දී
ඉරත් යනවා වැඩ ඇරී

තුරුලතා අතරින් ගලා
වැව්තලා දිය දිලිහිලා
වෙහෙර මළුවට මග කියා
පුන් පොහෝ සඳ බැස ගියා

හෙල්තලා කඳු පසුකරන්
සිහිල එළමින් සනසමින්
ඉවුරු දෙපසට බර දෙමින්
ගඟත් මුවදොර ළංවෙමින්

හිරුත් සඳ ගංදිය වෙලා
කඳුළු දියකර පණ පොවා
ගැහෙන හද මඬලක් කියාවිද
හිනහෙනා හැටි මුව අයා

පුතෙක් දැඩි කළ නියාවෙන්
දුවෙක් හැඩ කළ මනාවෙන්
හිස් අහස් කුස නෙත් අයාගෙන
ගිමන් හරිනවා දයාවෙන්

**-ඒ ඩී එල් ද සිල්වා-**
(වයඹ පළාත් කාර්යාලය)

## කුසලතා

# "අත්තාගේ තුන් මාසේ පිංකම"

තාම නෑ මට
හැදුණෙ පෙන්ෂන්
අත්තම්මගේ කියවිල්ල

පොඩි දුවගෙ වියදම් සැරයි මට
ලොකු නැන්දගේ
කෙඳිරිල්ල

කොහොම කරමුද
පිංකමක් අපි
අප්පච්චිගේ මැසිවිල්ල

දෙ අත් එක්කල
අම්මගේ මම
දුටිමි හිස් වූ වෙදැඟිල්ල

**-පී ජී ආර් ඉන්ද්‍රාණි වෙලගෙදර-**
(කෑගල්ල අධිශ්‍රේණි ශාඛාව)

**කුසලතා**

# "තාමත් පරක්කු මං"

තිහත් වයසක්ද?
අපිට මොන ළමයි ද?
අනේ අපි තාම චූටියිනේ කිය කියා
හිනා වෙවී ඉන්න දිගටම

Tax Loan කැපෙන්නේ නැතුව
තාත්තට ලොකු පඩියක් හම්බවෙන දවසක
අපිටම කියලා ගෙයක් හදාගත්තහම
අඩුම තරමේ මෝටර් සයිකලයක්වත් ගත්ත දවසට
එහෙ මෙහෙ යන්න පෙට්‍රල්, ඩීසල් අඩු වෙච්ච කාලෙක
Credit Card එකේ බැලන්ස් එක "Zero" වෙලා
පොලී, දඩ පොලී වදින්නැති දවසක
චීස් කැල්ලක්, පිටි පැකට් එකක් ගන්න පුළුවන් කාලෙක
රෑට පත්තුවෙන එකම ලයිට් එක වෙනුවට,
ගෙදරම ලයිට් දාන්න තරම්
ලයිට් බිල් අඩු වෙච්ච කාලෙක
අම්මේ
"මම ඔයාගේ බඩට එන්නම්"
එතකම්
දැන්ම පෙති නවත්තන්න එපා අම්මේ

**-වී ඩී වී ඒ විතානගේ-**
(සංවර්ධන බැංකු අංශය)

## කුසලතා

# "සදාකාලික"

හිතට දනවන
හිතක බැඳිකම
සෙනෙහෙබර හිත
ළෙංගතුයි

හිත්'ග නලියන
සිතැ'ඟි රූ'තර
පෙමක නුඹ මට
සිතුමිණයි

හිතට දිරිදෙන
නිතින ළග රැඳි
සුහද නුඹ
සෙවණැල්ලමයි

වෙනස් වන ලොව
සදා නොවෙනස්
වෙනස් වන නුඹ
සත්තමයි

**-ඩී එම් එම් ඒ ගුණතිලක-**
(මාවතගම ශාඛාව)

## කුසලතා

# "මටත් මල්ලියෙක්"

සෙල්ලමට තව කෙනෙක් අඩුයි
මම දන්නවා
රණ්ඩුවක්වත් නැතුව
පාළු බව දන්නවා
නුඹෙ පුංචි හිතට තනිය
බරයි මම දන්නවා
මේ පාර වතුර බිලවත්
නොගෙව ඉන්නවා

යාළුවට මල්ලියෙක්
අම්ම ගෙනවිත් දීල
එහා ගෙදරත් අලුත්
නංගියෙක් ඇවිදිල්ල
දෝනිටත් මල්ලියෙක්
ඕනෙමලු ගෙනහල්ල
අතිකාලෙ නොකෙරුවොත්
ලයිට් නම් යයි කපල

ණය වාරිකයි බිල් ටිකයි
ගෙවලා දැම්ම
ක්ලාස් ඩේ කියා ෆීස්
වෑන් එකටත් දුන්න
ටැක්ස් ගෙව්වට පස්සෙ
හාල් ටිකකුත් ගත්ත
අනේ ළමයෝ
මල්ලිලා හරි ගණං

**-ඩබ් ජී එන් බී ගමගේ-**
(කෑගල්ල අධිශ්‍රේණී ශාඛාව)

## කුසලතා

# "ලෙයින් තෙත් වුණු සඳ මඬල"

සඳ ගිනිගෙන
අරලිය ගස් අස්සෙන් එබුණා
කිරළක මහා රෑ
විලාප දී හැඬුවා
සිහිසුන් වී පිපාසයෙන්
තරුවක් බිම ඇද වැටුණා

මාවවුලන් පොරකන විට
අඳුරත් ඊතල මානං හිටියා
තහනම් පෙමක සලකුණ!
පිහි තුඩ මත උල තියෙන
අගුළු දැමූ කුටියක
හදවත දැදුරු කරන රාත්‍රිය

නිවී පහන්
කැටි ගැසී කළුවර
මලක් පිපෙන්නට අර අදී
සැණින් කුණාටු සුළඟ හමා ගියා
සුදු සමනළයන් මල් පෙති මෙන්
විසිරී බිම වැටුණා

වහසි කියා සනසපු
සුදු කබර පිරුණු ගැහැනිය
අගුළු ඇරන් එළියට බැස යන විට
ඉවුර ලෙයින් තෙමී
ගඟ ගලා බසී
කම්මුල්වල කඳුළු පෙගුණු රාත්‍රියෙ
උමතු මවක වෙස් ගෙන සඳ
ඉවුර දිගේ දුවනවා
තම කුසයෙන් හා පැටවා
වෙන් කළ උන් සොයමින්

**-ඉන්දික තුෂාර ගමගේ-**
(නීති අංශය - දකුණු පළාත් කාර්යාලය)

## කුසලතා

# "බදුලු බබා"

බදුලු කෝච්චියේ හූව
ගම් මැද්දට ඇහෙන වාර
එළි තැළුවෙම මීනච්චිගෙ
පපු කැනතට ඇනුණු පාර

රෑං ගාලා ඉගිලෙනකොට
බත් කුරෝ පාට පාට
පිපිලා දම් ලැවැන්ඩර් මල්
මීනාගෙ හිනා මූණ

බදුලු ස්ටේසමේ මාතියා
කොළඹ ගිහිං ආපු දාට
වීදුරු වළලුම දුසිමක්
හැඩ බැලුවලු මීනගෙ අත

නක්කලේට හිනා වෙවී
හූ කිව්වලු බදුලු මැණිකෙ
ලැසි ගමනින් යන හැටි දැක
මීනා හොයයි අන්නසි ගැට

කිරි බේරෙන හැටිටෙ ඔතං
මීනා තේ දලු කඩ කඩ
කොත්තමල්ලි වතුර පොවපු
බදුලු බබා නාඩා ඉඳිං

**-නදීශා පෙරේරා-**

(අගනුවර ශාඛාව - චාරිකා අංශය)

කුසලතා

# "කැන්ටිමේදී දැකපු ඔයාට"

හීනි ඇස් තිබ්බට
හිනාවුන් නැතුවට
තාම හිත හැමතැන
සොයනවා නුඹවම

ගැටෙන තුරු ඇස් හොයන
දුර තියා ඇස් සඟවන
මග හැරෙන එක බැල්මද
මග හරින්නේ කොහොමද

තියුණු බැල්මක හී සර
හිටිගමන් වදිනවා සැරටම
ඉඩෝරෙට ආ වැහි පොද
හොඳටෝම ඇති දවසට

කැන්ටිමේ දකුණු කෙළවර
ජනේලය ළඟ පොඩි මේසය
ළා දම්පාට දිග කමිසය
සනසවයි මගේ ඇස් දෙක

දකිනු රිසි ඒ ඇස් දෙක
කැන්ටිමට එමි මම උදේම
ගෙදර ගුණ බත නොකාම
මහත් වෙන්නෙ පිටි කාලාම

දන්නවද මගෙ පෙම්වත
නොකී පෙම මහමෙරය
නුඹ කිසිදාක නොම පතන
නොහිමි ප්‍රේමිය මා බව

**-දිළිණි උදාරි දිසානායක-**

(කාඩිපත් මධ්‍යස්ථානය)

## පද්‍ය රචනා සඳැස්
## ප්‍රථම ස්ථානය
# "ජියෙකොන්ඩෝ ඩෙල් ලීසා "

විසි කළ සිව් අත නෙක වන රළු පින්සලයයි
රිසි ලෙසැ කිරි ගරුඬින් බිඳි කුඩු තීන්තයයි
ඉහිරෙන දුහුවිලි සුවඳට මුහු ෆැන්ටසියයි
කිසි මිලකට නතු නොවු සුදු හිත් කැන්වසයයි

නිලබල ඇති රජ සිටු ලද විලාසිතාවයි
ගිල ගිල මසුරන් තෙලි තුඩ සිතුවම් වපුරයි
විල මානස පිපි තාමර සුදු මුදු කමලයි
මිල නොකළැකි ඇගෙ හස පන්හිඳ සිඳ බිඳලයි

ඇස නොගැටුණ හස රේඛා කඳුළ පිරි දියේ
බස සෙවුමට පණ සුන් උන් නැරඹුමට ගියේ
බැස යන රිවි හිමි තුරුලත පිපි හිරුමලියේ
වස වුව මුවගට ගම් නුඹෙ හස දුටොත් ප්‍රියේ

ඇහුවම වියපත් ඉර මුවගෙන දරදඬු බස්
නැව් නැග ගිය හැටි පැවසිම් සෙවුමට සොමි රැස්
කිව්වෙමි සිතුවම ගැන නිරතුරු බොරු විසි තිස්
සිව් වසරම ඇඳි මුත් තව කැන්වසයම හිස්

අතු ඉති දළුලා නුඹෙ වත පින්සල තුඩගට ආ කල
ගතු තව සෙව්මට දිව යම් මළවුන් නිදනා කුටි වල
නතු වී පණ සුන් මුහුණට, සෙව් හැටි ඉරියව් බෝ බල
තතු හඬගා කියයි ඔබට සාන්ත මරියා රෝහල

ඇතත් තොලග මධු සිල් ගම් ඒත් දෙනෙත බමනා
නැතත් මොකද මනැසිනි මියුලැසිය කරමි කරුණා
හෙටත් ඉරක් පායන බැව් දැනී නින්ද වැරුණා
මටත් නොදැන මා සුරතින් පින්සල අත හැරුණා

ගැවත් ලවනතර අමා මී බිඳු බිඳු පාසා
ආයෙත් නෙත දුවන මහිම උසුළු විසුළු ආසා
ආවත් මනසට ඇ ගැන හද කකියන වීසා
තාමත් පින්සල අග ජියෙකොන්ඩෝ ඩෙල් ලීසා

**-නිසංසලා ස්වර්ණමාලි මදනසිංහ-**

(ගෝනපල ශාඛාව)

## දෙවන ස්ථානය
# "නෝක්කාඩු මාලය"

මා මිත්‍ර ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජු වෙත,

සිසි වුවද ලැජ්ජවී මුවා වුණි වලාවක
දිසි දේය සඳට වැඩි සඳ සඳලු තලාවක
කිසි නොවේ සම වුණේ ඇයට උපමාවක
තොසිනි මා සිත් බැඳී රැයක හුදකලාවක

ඇගෙ නීල කෙස් හීල නැති සුළගෙ ලෙලදුනා
මයෙ කෝල රැහි නාල රාග ගිනි ඇවිලුණා
සඳ සිහිල මනමාල ඇස් ඇගේ බැබළුණා
සිත සීල බිඳ ආල පෙම් සිතක් පීදුණා

දකින්නට ඇයව යළි මගේ සිත ලොබ බඳී
නිදන්නට නොහැක ඇගෙ මතක මගෙ නිදි බිඳී
ලියන්නට වුණා පෙම ගැන ලියපු කවි පැදී
යවන්නට විය ඇයට එය සමග මිණි පොදී

දින ගෙවී හසුන්වල පෙම් හැඟුම් ගොත ගොතා
සැනසුණා අපි දෙන්නා අපි ගැනම සිත සිතා
වෙන ලොවක් ගැන වගක් අපට තිබුණේ නැතා
පණ මගේ ඇය වුණා සිටිය මම ඇය පතා

*************************************************************************

විඳිනු රිසියෙන් රතී සුව ඔබ මගුල් පොකුණට පැමිණුනා
සිඳිනු අටියෙන් රජුනි ඔබෙ හිස අයෙක් දිය යට සැඟවුණා
පෙනුණ හින්දා අසිපතේ තුඩ දියෙන් මතු වී දිලිසුණා
නසනු හැකි විය මෙමට උන් 'දස්කොන්' නිසා ඔබ බේරුණා

රැකී දින ඒ රුපු විනෙන් රජතුමනි ඔබගේ දිවිය මා
දැකී ගං දිය ගසා යන'යුරු ඔබේ රජ බිසවුන තමා
නොවී පැකිලී රැක්කේ ඇ මම ජීවිතෙත් හැරලා දමා
දිටී ඒ මොහොතේ දි ඇගෙ මුව රජුනි ඇය 'ප්‍රමීලා' තමා

දුර ඈත සිටි ඈව සඳ එළියෙ දුටු දිනේ
කරකාර බැඳ ගන්න පෙම් සිතකි පීදුණේ
දර දාපු චිතකයක මගේ හිත ඇවිලුණේ
නරපතිගෙ බාරි වග එවිට මට වැටහුණේ

දරා දෝතින් ඇය රැගෙන ගං තොටට ගෙන එද්දී මෙමා
පුරා වටොරේ ලපය දුටු වෙමි රජුනෙ මම නොපතමි කමා
සරාගික මගෙ හදේ සිතුවිලි ගැනිය හැකි වී නම් නමා
ගිරා පැටවුන් මිහිරි මී අඹ නොකා පියඹා යයි දමා

වසම්සර විදි මියුරු හෝපලු හීය හද කැළඹූ නියා
සුසුම් සුසුමේ පැටලෙනා මෙන් ඇගේ ඇස් මත ඇස් තියා
නැසුම් මා හිස සිකුරු වන බව දැන දැනත් කම් නෑ කියා
කුසුම් අත්තන සුවඳ විඳ විඳ ඔහේ මන්මත් වී ගියා

සරත් අහසේ නැගුන පුන්සඳ ඇවිත් සක්මන් මළුවට
මලුත් පැරදී ලැජ්ජ වී ඇති ඇගේ මුදු මුව කමලට
හිතත් හීලෑ වෙන්නේ නෑ ඇගෙ ආල බැල්මන් දුටු විට
ඒත් මම නෑ කවමදාවත් එබී ඇගේ සොමි වුවනට

කොඳුර කොඳුරා සවන තැවරූ ආල තෙපලුම් මීවිත
සොඳුරු ඉඟි පා දෑස නැටවන බැල්ම රැඳුනා හදවත
කිඳුරු පෙම ගැන ඈට ලියනා මිහිරි කවි පද ගොත
මැදුර දිලුණා ප්‍රේම සඳ කැන් පහසකින් හඟුරන්කෙත

සොඳුරු මයෙ සඳ කුමරි රාහුගෙ විත බලේකට හසු වුණි
බැඳුණු පෙම් ගී මියුරු රාවෙට කණකොකෙක් හඬ මුසු විණි
නසනු කෙලෙසද එදුක් ඇයගේ වෙදදුරන් ගෙන් පැවසුණි
අඹනු යුතු විය පිළිමයක් සැම අතට පෙනුමට ඈ මෙනි

සැම අතින් එක රුවට රුව සම වන්න ඒ ඇඹූ පිළිමයේ
දිටිය නැති විය මා දිටිය යම් දෙයක් එදවස ගං දියේ
නැසිය යුතු යැයි ඔබට වැලඳුන රෝගෙ මා සඳ කුමරියේ
කැපෙන බව ගෙල දැන දැනයි මම ලපය තැබුවේ කළවයේ

ඇවිලිලා සිත වෛර ගිනිදැල් කෝපයෙන් දැවි දැවී යන්නා
රැවටුවා යැයි සිතා ඔබ මට මරණ දඬුවම ලබා දුන්නා
සැබවිනා රජතුමනි මා ඈ කෙරෙහි ප්‍රේමෙන් බැඳී වුන්නා
නැත නැතා කිසි දිනක එනමුත් රති සුවය නම් වින්දෙ දෙන්නා

බිඟුන් හා මල වගේ කියලා අයෙක් උපමා කරත් ප්‍රේමය
තුඩින් රොන් ගෙන නොයන බඹරෙකු සිටී දෝ නාමයෙන් ආලය
දුරින් සිටියත් මතක කැලඹුම තමයි හද කිති කවන ප්‍රේමය
ඉතින් මම සිඳු ප්‍රේමි වෙයි සඳ ගැයුවා අපි පෙම් සොඳුරු ගීතය

කසේ තලතල රැගෙන යන මා දැවෙයි ගිනි වේදනාවේ
එසේ යන මට ඉසි සිසිල් දිය සොඳුරු ඇගෙ පෙම් දයාවේ
නැසේ මා හිස අසිපතින් හෙට අවර ගිනිගත් වෙලාවේ
වැසේ මා ඇස ඒත් එහි ඇය එදා මෙන් හිනැහුනාවේ

'හිසේ නොව ඈ රැඳී සිටියේ මගේ හදවත් තලාවේ'

මෙයට
ඔබ මිත
දස්කොන්

**-සුධීර කෝරළගේ-**
(නිදහස් චතුරස්‍ර ශාඛාව )

## තෙවන ස්ථානය

# "මමයි මනමේ කුමරුගේ හද හරහා ගිය ඒ අසිපත"

සසරෙ දවසක පුරුදු ලෙස සිත බැඳුණු දා සිට ඇය වෙත
පැමිණි දා සිට කළේ මෙහෙවර සිත තුටිනි ගුරු ගේ වෙත
කලක් ගත විය කුමරු දැඩි විය තුරුණු විය දැන් වෙයි ගත
සකල සිල්පය දක්වලා ඔහු දිනා ගත්තේ ගුරු සිත

සයක් වස කෙල පැමිණි පසු එළඹෙමින් තිබුණා ඒ දින
සියක් දහසක් පිරිස් මැද දත් සිල්ප දක්වා පසු දින
කතා කොට ගුරුතුමා පසසන විට බලා උනි සැම දෙන
කියයි පුත නුඹටයි උරුම මා දියණියගෙ සිත අද දින

රුවින් බෝමා රුසිරු කුමරිය කෙරේ බන්දා ඔහු සිත
පිටත් වන්නට ලබා අවසර තබා පියවර පුර වෙත
වනේ වෙත පා තබා කුමරිය සමඟ ගහණවු වන සත
ආලේ බන්දා වනේ පීරා තබයි පය ඉදිරිය වෙත

වනේ බෝමා සිරි බලා උන් හිඳී ප්‍රේමෙන් වෙළී
කාලෙ ගෙවිලා මැවේ රේඛා භයංකර රුදු සෙවණැලී
හදේ මතුවී බියක් සැකයක් කුමරියගේ ඒ සියුමැලී
වතේ එතිලා පතයි ඇය රැකවරණයක් ඔහුගෙන් යලී

නොසිතු මොහොතක භයංකර ගොර හඬක් නංවා ගුගුලලා
කියව් කොයි කවුරුදැයි තොපි මේ ඉසව්වේ කොන් පාගලා
වනේ සැඟවී සිටිය වැද්දට කුමරි බියවී සැඟවිලා
ඉණේ සැඟවී සිටී මා මේ කුමක් වන්නේදැයි බලා

රුසිරු ලන්දූ වෙතම බැන්දූ හද සෙනේහේ දැඩි වුණා
වැදි රජුගෙ නෙත ඈ කෙරේ බව කුමරු මනමෙට වැටහුණා
ගතට දිරි ගෙන අල්ලලා පොර වැදි රජුව බිම වට්ටනා
දෙන්න අසිපත නසාලන්නට කියා මනමෙට කියවුණා

සැලී සියුමැළි කුමරිගේ සිත නසන්නට මිනිසෙකු බැරී
සැලේ අත ඇති අසිපතේ තුඩ බලා ඉන්නේ මැරි මැරී
පමා වූ කළ ඇගේ මුදු සිත හඬා වැලපේ කලකිරී
දමා ඇන්නේ කුමරුගේ හද වෙතට ඇයි වැදි රජු රිරී

වෙළී ස්නේහෙන් ගලයි රුහිරු තෙමී ඒ රුදු වන පෙත
හැපී කුමරිය හඬයි පපුවට තබා සැලෙනා ඒ අත
දනා ලොව තුළ කුමක් කීවද කවුරු දන්නෙද ඒ හිත
මමයි මනමේ කුමරුගේ හද හරහා ගිය ඒ අසිපත

**-ආර් එම් එම් පී රාජපක්ෂ-**

(කොච්චිකඩේ ශාඛාව)

## කුසලතා

# "අප්‍රකාශිත ප්‍රේමය"

සිකුරු දවස අවසන අඳුරක් එනවා
රුසිරු පහන දින දෙකකට නිම වෙනවා
මැඳුරු සරන ඇගෙ සුවඳත් නික්මෙනවා
පිදුරු ගසකි අද සිට මා වේලෙනවා

ඇවිදින් දෙපෝයයි පුර හඳ පාසලට
දෙසවන් පිනයි ඇගේ අමයුරු වන් හඬට
බලමින් ඇගේ මුදු නැති අත් මාරුවට
පුළුවන් වුණා පරමාණුව හරි තිතට

සිප් කිරි වලින් බර වුණු පියයුරු දෙපළ
රූ සිරි වඩයි රජිනක ලෙස ලෝ පතළ
වත්සුණු නොමැති ඇගෙ නිකැලැල් වත මඬල
දිස්නය ගෙනෙන ලිතියම් කැටයකි මෙකල

සිය වසරකි ඒ සති අන්තය මෙමට
තුන් පිම්මකි මා ගොඩවුණි පාසලට
කඳ සුරිඳුන් සේ නිම කළ පැවරුමට
ඇය ගුණ වයයි හිතුණා මට ඒ ටිකට

එදින පිපී නොතිබුණි සූරිය කුසුම
අඳුර පුරා සතියකි මුළු වැව රවුම
ඇසක දරා සිටි කඳුළේ වැව් බැම්ම
දෙකඩ වුණා මගෙ හිතටත් නොදැනීම

සතියක් ගෙවුණු පසු ඇය අප වෙත එනවා
දරුවනි ඉතින් මා හෙට දින රට යනවා
කියමින දෑත අප හිස් මත දැවටෙනවා
ඉන් එක් අතක රන් මුද්දක් දිලිසෙනවා

**-ඩී එම් එස් එස් බී දිසානායක-**

(මඩාටුගම ශාඛාව)

## කුසලතා

# "අප්පච්චී"

අහස දුර බවත් දැන සමනළු පියඹන්නේ
පොළොව රළු බවත් දැන මල් බිම සිපගන්නේ
නැගෙන හිරු බවත් දැන පිනි බිඳු හිනැහෙන්නේ
සැපය දුර බවක් දැන පියවරු සැනසෙන්නේ

දරුවන් සිටින තැන දෙව්ලොව සිතමින්නේ
දහඩිය හෙළයි දුක් දොම්නස් විඳිමින්නේ
වැටෙන කඳුළු තනි අතකින් පිසිමින්නේ
පියවරු තනයි සුර ලොව දරු පැටවුන්නේ

දෑතේ නැගෙන කර ගැට මල් කැකුළු වෙයන්
ගතේ නැගෙන දා බිඳු දියමන්ති වෙයන්
හිසේ රැගෙන යන බර රන් රිදී වෙයන්
අප්පච්චී දෙව් ලෝකෙම නතර වෙයන්

**-ඒ ඒ එම් එම් සේනාරත්න-**
(තැප්‍රොබේන් ශාඛාව)

## කුසලතා

# "හදේ ඇනුණායි නෙළුම් කටුවක්"

රන්මැලි සමග ජය ශ්‍රී මා වඩින්නට
මවගේ කන්නලව් නිතරම ඇසෙයි මට
තාත්තෙ ට්‍රිප් එකක් යන්කෝ පෙරැත්තෙට
දරුවන් සමග ඈ එක්වෙයි තරගයට

වාරාවසන උඳුවප්පේ උදා වුණී
අටමස්ථාන වැඳ පිදුමට පිටත් වුණී
ආ මග කතාවෙන් හෝරාවන් ගෙවුණී
ලස්සන ගමකි ගල්ගමුවට සැපත් වුණී

වැව් බැමි සිසාරා මඳ නල ගත වැදුණා
ලා නිල් ගොයම් සුළඟේ තාලෙට සැලුණා
පොල්ලතු කඩේ තුරු සෙවණේ මට පෙනුණා
රොටී සුවඳ ළඟ තිරිංග තද කෙරුණා

කට දන ලුණුමිරිස පදමට පොල් රොටිය
පිනවයි දිව රසට උණු උණු ප්ලේන්ටිය
දසත් කසට බැඳි සිනහව පියකරුය
කෝන් අහුර දුන්නේ ඈ නොමිලෙමය

වෑ කණ්ඩිය උඩින් පිපි නෙළුමක් වාගේ
හිනැහීගෙනම විගසින් දුවගෙන ආයේ
මගෙනුත් මේවා ගන්නකො ඈ පැවසූයේ
නෙළුම් බට්ටො මිටියකි ඈ ගෙන පෑයේ

හිමි දෙව්ලොව ගියේ තනියා බරු ගහලා
මේ ලොකු කෙල්ල දරුවන් තිදෙනම දුවලා
එක්කහු කරනවලු ඈ කැටයක දමලා
පැණයක් ඇසූවෙමි ඒ මොකටද කියලා

ඉස්කෝලේ වැඩට කාටත් ඕන වෙලා
කොම්පියුටරයක් ගන්නට එකතු කළා
ගෙයි ඇති පරණ පරිගණකය මතක් වෙලා
සේපාලිට ආවෙමි දිවුරුමක් වෙලා

කාලය ගෙවී දින සති මාස ගත වුණි
රජරට වැඩබිමක යන්නට මට යෙදුණි
සේපාලිත් පොරොන්දුවත් මතක් වුණි
කුකුළත් අතින් ගෙන උදයෙම පිටත් වුණි

පෙර හුරු පුරුදු සුළඟකි ගත වැද ගත්තේ
පරිගණකය රැගෙන රථයෙන් බැස ගත්තේ
ඇගේ සිනහවෙනි මා හැඳිනිය බව දත්තේ
සේපාලී කොහෙද දකිනට ඇයි නැත්තේ

තුන් මහකුත් වුණා පොළොවට යට ගහලා
ගල්ගමු වැවේ මගේ කෙල්ලගෙ පණ ගැහිලා
නෙළුමක් කඩන්නට ගියදා මඩ එරිලා
ගම්මුන් යන කොටත් පණ හොරු ගෙනිහිල්ලා

රෑ ගොම්මෙන් සඳ අහසට වඩින කොට
පොල් අතු ඉරා තරු ගෙපළට වඩින කොට
රෑ හීනෙනුත් ඈ අඬ ගැසුවලු මෙමට
ඇගේ මව් පිසී චීත්ත කොන කඳුළු කැට

ටීචර් කෙනෙක් වෙන හීනය හිත අස්සේ
මහත්තය එතැයි බැලුවා හැම තිස්සේ
දූවිලි හීන බිඳුණා දින සති ඔස්සේ
ආයෙත් ඒකි ඒකයි වැවටම බැස්සේ

පොඩි උන් හන්දා පපු ගිනිකඳ උහුලව්වා
ඒකිගෙ මතකෙ මං සියවර මියැදෙව්වා
කොම්පියුටරේ දැන්නම් මොකටද මෙව්වා
"ආපහු ගෙනියන්න" ඈ වැඳගෙන කිව්වා

ඊයම් බරුව මෙනි මගෙ පපුවේ ඇනුණි
නෙත් කොන් ඉරාගෙන කඳුලට හද සැලුණි
අතපසු වුණා මගෙ අත වරදැයි සිතුණි
සිනාසෙන දෙනෙත් සදහට මගහැරුණි

නෙළුමක් දකින විට අදටත් සිහි කරමී
සිහිනෙන් ළපටි සේපාලී මම දකිමී
යළි කිසිදාක මා ඒ මග නොම ගියෙමී
ගල්ගමු වැවේ මල් පිපුණද නොම දනිමී

**-සුරංජි නිල්මිණි ප්‍රේමරත්න-**

(පරිපාලන සේවා දෙපාර්තමේන්තුව)

## කෙටි කතා
## ප්‍රථම ස්ථානය

# "කුලවමියෝ"

"නෙද්දකිං උඹේ මහ ලොකු ආලවට්ටම!"

රතට රතේ බුලත් කෙළ පාරක් කට පුරෝලා මිදුලට විදපු පුණ්නා ආතම්මා ඉණට අතක් ගහගෙන කෙළින් වුණේ ඔහොම්ම කියාන.

සොබනි මූණ හපුටු කොරාන අම්මයෙ දිහා බැලුවා. සුදු වැලි අතුරාලා පොල් අතු රටා හිටින්ඩ අතු පතු ගාපු මිදුලෙ බුලත් කෙළ ඉහිරුණාම බලන්ඩ අජූව නෙව.

වෙනදට නං සොබනි අප්පොච්චිට හිට කෑ ගානවා මිදුල හැඩි කොරනවා කියලා. ඒත් අම්මයෙ මූණ දුටුවම අද නං කටපත්ත ඉස්සර කොරාන ආයෙ වංගියක් බැණුං අහන්ඩ වෙයි කියලා තේරුං ගිය සොබනි කියන්ඩ ගිය වචනෙ ගිලගෙන කරබාගත්තා.

කොහොමත් පුණ්නා ආතම්මයෙ කට අවුස්සා ගත්තෝතින් ආයෙ විසුමක් නැතුවා, නිකං කුණු කෙළ පඩික්කමක් පෙරළගත්තු හේමයි.

"යකෝ හිතේ සර්දාවක් නැති එකායෙ මත්තෙ නහින්ඩ තනන්නෙ අහවල් කාරියටෑ. ඕං පාළොස්සක දාක උඹටෑ කියලා මලක් පානක් පූජා කොරන්ඩ ඕකා එක්ක පංසලට ගියෑකිද මං අහන්නෙ?"

සොබනි බිම් බලාගෙන මහපටෑඟිල්ලෙන් පොළොවෙ පස් හාරන්ඩ තියාගත්තා.

පුණ්නා ආතම්මා කියන්නෙ සොබනිලෑ අප්පොච්චිගෙ අම්මා. අවුරුදු අසූ දෙකක් වුණත් ළමිස්සියෙක්ට හැරෙන්ඩවත් බෑ උන්දැගෙ කඩිසර ගමන බිමන වැඩපොළ එක්ක. දැන් ඉහ නිකට පැහිලා උන්නට මීට අවුරුදු පණහකට හැටකට මත්තෙං උන්නු පුණ්නා නෙව නියම හැඩකාරි.

හරියට වාත්තු කොළා වායෙ මූණ කට, ඇත් දළ පාට අංගපුලාව එක්ක හොරෙං හොරෙං කඩා දාලා ගැට කඩකඩා තෙල් සාත්තු කොරාපු දිග කේස කලාපෙට ගහන්ඩ තරුණ කාලෙ නං පුණ්නා තරං රූප සුන්දරියක් මේ අහල ගං තුලානෙ උන්නෙ නැතුවා.

ඇයි ඉතින් මේ පාත රට දීගෙක ආවට පුණ්නා කියන්නෙ උඩරට උපන් එකියක්. ගඩලාදෙණි විහාරෙ පේන මානෙ නින්ද ගමක උපන්න පුණ්නයෙ

මහප්පොච්චා ඒ ගමේ මුලාදෑනි නිලමක්කාරකොමක් කොළාය කියාලා හිට පුණ්නා හීං එකාලට කීවෙ උජාරුවෙන්.

දැන් නිකංම නිකං " පුණ්නා " වුණාට චේලපත්කඩේ ලියැවුණේ "බෝධිමළු ගරුකාර මුදියන්සේලාගේ පුණ්‍යා" වග දැන් පුණ්නාටත් අමතක වීගෙන යමින් තිබ්නෙ. ඇයි දෙයියනේ එකාතකට උපන් ගමෙන් පිටමං වෙලා දැන් හැත්තෑ අවුරුද්දකට කිට්ටුයි නෙව.

යාන්තං ළමිස්සි කාලෙ වෙද්දිම පුණ්නාව ඒකිගෙ දෙමස්සිනාලා එක ගෙයි කන්ඩ සහේට ගන්ඩ මනාපෙන් උන්නෙ. ඒකියෙ දෙමව්පියොත් ඒකට අමනාපයක් පෙන්නුවෙ නැතුවා.

මේ උගුලෙන් ගැලවෙන්ඩ උප්පරවැට්ටියක් හිතාගන්ඩ බැරුව ඉන්න සන්දියේ තමයි හේතුපාල, ඒ කියැව්වෙ සොබනිලෑ මුත්තා වෙළෙඳං කොරන නඩේකට එක්කාහු වෙලා උඩරට වෙළෙදාමෙ ආවෙ.

කාසි පණං අතේ ගැවසුණු හේතුපාල ඒ කාලෙ මහ නැඩ ඉලන්දාරියා. ගේ දොර වතු පිටි වකාරෙට තිබ්නට අර නිකං සෙල්ලමට වායෙ වෙළෙඳං නඩේ වැටිලා ආවා කියාලා තමුං එක්ක කී බව පුණ්නාගෙ අතීත විත්ති අහලා අහලාම දැන් සොබනිටත් කට පාඩම්.

ගමේ ගැටිස්සියො එක්කලා තාං රෙදි පිළි තෝරන්නැහේ ගෙහුං පුණ්නා වැඩියත්ම බලන්ඩ යෙදුණෙ හේතුපාලගෙ හැඩි දැඩි පෙනුම විනා වෙන මක්කවත් නෙවෙයි. හේතුපාලත් උන්නෙ පුණ්නාට දපනෙ වැටිලා.

"නඟා මයෙ එක්ක පාතරට යන්ඩ මනාපෙයි?"

බංගලි වළල්ලක් පුණ්නයෙ හීං අත් ගොබේ පළන්දන ගමන් හේතුපාල ඇහැව්වෙ රාසින් වගෙයි. පුණ්නා එහෙම්මම ගල් ගැහුණා හේ බලා උන්නෙ අත අහකට ඇදගන්ඩත් අමතක වෙලා.

"අයියණ්ඩි කවදැයි ගං රටවල් බලා යන්නෙ?"

සිහි පතක් එළවගත්තු පුණ්නා ඇහැව්වෙ නාහා බැරිකමට කියාලයි හේතුපාලට හිතුණෙ.

"අනිද්දා පෝය දාට මෙහෙං බිං කළුවර වැටෙද්දි පිටත් වෙන්ඩයි නගේ කල්පනාව. පුර හඳ තීන නිසා ගමනටත් ලේසි නෙව"

තප්පර කීපයක් කල්පනාවක ගිලිච්ච පුණ්නා මොකවත් නොකියා හැරිලා දිව්වා.

හේතුපාලගෙ උගුර කට වේලිලා ගියේ පාළොස්සක පෝය දා බිං කරුවල වැටෙද්දි ගෙදර ඇත්තො ගඩලාදෙණි විහාරෙ පූජාවට ගෙහුං ඉන්න

අතරතුරේ බඩේ ගායක් ය කියාන ගෙදර නැවතිච්චි පුණ්නා ගවුං කැලි දෙක තුනකුත් කොට්ට උරේක ඔබාන හොර බැළලියක් ගානට වැටෙන් රිංගලා ඇවිදින් තමන්නෙ වාඩියෙ එළිපත්ත උඩ ඉන්නවා දුටුවාමයි. එදා ඔච්චමට වායෙ කියාපු කාරණාව මේ තරං දුර දිග යාය කියලා හේතුපාල හිතුවෙ නෑ නෙව.

"සීවරං දෙයියනේ මේ නඟා මෙහෙ මොකෑ කොරන්නෙ?"

"ඇයි අයියණ්ඩී කීවෙ අද ගං රටවල යනවා කීලා. මාත් ඇන්න යන්ට"

"මේ රෑ ජාමේ නඟා කොයි යන්නදෑ"

"අද වහුං වෙලා නොගියොතිං ආයෙ මට යෑමක් නෑ අයියණ්ඩි"

"නඟාව අම්මා අප්පලා හොයාවි නෙව!"

"ඒක නෙවෙන්නං මේ සුනංගු නොවී යමුය කියැව්වෙ"

"ඇයි හත්තිකේ නඟා මේ උඩරට රදළ කුමාරිහාමි කෙනෙක් වෙච්චි, මේ පාතයෙක් එක්ක යන්ට තනන්නෙ මක්කැයි?"

"ඒ කියන්නෙ අයියණ්ඩි මට මනාප නැතුවදෑ? මට ගං බිම් යන්ට කතා කොළේ ඔච්චමටද හේනං"

කඳුළු වක්කරාන පුණ්නා එහෙම අහද්දි හේතුපාලගෙ හිත උණු වුණේ හීතලට මිදිලා තිවුණු පොල්තෙල් කුට්ටියක් හේමා.

එක අතකට අතට ආපු වාසියට පයින් ගහන්ඩ මෝඩ වෙන්නේ මොකාදැයි කියලා හේතුපාලට කල්පනා වුණා. අනික මොකෝ මෙහෙව් රූප සුන්දරියක් වෙච්චි උඩරට මැණිකෙ කෙනෙක් කරකාර ගන්ඩ පූරුවෙ පිනකට මිසක්කා තමුන් වගේ පාතයෙකුට පුළුවනෑ!

ආයෙ ඇහිල්ලක් බැලිල්ලක් නැතුව පුණ්නා බර බාගෙ පිටිපස්සෙං ගැටුවෙ නිස්සද්දවමයි. හැබැයි සෙංකඩගල මායිම පහු වෙනකල්ම පුණ්නාගෙ හිත නං තිව්නෙ දෙමෝලෙං පිටි කොටන්නාහේ.

රෑහේ අනික් එවුන් එකා දෙන්නා නොපෙනෙන්න කනුකුනු ගෑවට කවුරුත් මොකවත් මූණට නොකීවෙ හේතුපාලගෙ මාමණ්ඩි ගැල් අයිතිකාරයා වෙච්චි හන්දාත්, අතේ මිටේ කාසි පණං ගැවසිච්චි එකා හන්දා වගේම පාතරටින් ගෙහුං මේ කොරාපු වික්කරමේ ගැන හිත් යටින් හීං තංතෝසෙයක් තම තමනුත් වින්ද හන්දයි.

රට ගම ආපුවාම මේ විස්තරේ අහපු හේතුපාලගෙ මාමණ්ඩි කීවෙ "දැං ඉතින්

මනමාලි කැන්දාන ඇවිත් අහවර නෙව, හැබැයි පුතෝ ඉතින් මින් මනත ගැලක් ගෙනිහුං අහවරයි ඒ පළාතට" කියාලා ඉතරමයි.

අලුත් ජෝඩුව පදිංචි වුණේත් මාමණ්ඩිගෙ ගෙදර. ඒක දෙපලකට තනාපු , කිරි මැටිටෙන් බිච්චි බැඳපු ගේ පොඩ්ඩක්. හේතුපාලගෙ මාමණ්ඩිට දරුවො උන්නෙ නැති හන්දා ආයෙ සේරෝම දේපොළ උන්දැටම තමාය කියාලා නෙව නගාගෙ කොලුව වෙච්චි හේතුපාලව හිච්චි සංදියෙ හිට දරුකොමට හදාන තීන්නෙ.

"වැඩි විච්චූර්ණයක් නැති සිරියාවන්ත කෙලී, ආයෙ කුසීත කොමක් ගැවිලාවත් නෑ නෙව, අපෙ කොලුගෙ වාසනාව"

හේතුපාලගෙ නැන්දම්මා පවා අහල පහළ ගෑනු උදවිය එක්කලා පුණ්නා ගැන කීවෙ එහෙම.

ගෙයි වැඩපළ කරලා දෑතෙ හුරුවක් නැතුවාට මොකෝ පුණ්නා යස අගේට නැන්දම්මාගෙන් ඉවුං පිහුං සාස්තරේත් ඉගෙනගත්තා.

ආයෙ වංගියක් දෙවංගියක් උගන්නාපු සුනංගුවට ඕනි අඩච්චක් කස්තිරමක් අල්ලන්ඩ තරං හපනියක් තමන්නෙ බාරියාව කොරගන්ඩ ලැබිච්චි වාසනාව ගැන හේතුපාල නිතර දෙවේලෙ හිතුවා. පින තියේනං ඉබ්බා තුනපහ පිටේ බැඳගෙන ගෙදෙට්ටම එනවා කියන්නෙ නිකංයැ!

ඔයින් මෙයින් පවුල්කාරයා වුණැයින් මනත හේතුපාල බෝම තැන්පත් වුණා. කලින් වාගෙ සෙල්ලං ගමන් බිමන් යන්ඩ දැඟලුවෙත් නැතුවා. මාමණ්ඩිගෙන් උරුමෙට හම්බු වෙච්චි හේන් කුඹුරු එකලාසයක් කොරාන දෙන්නා දෙමාල්ලො බලා උන්නා හේ දියුණු පමුණු වුණා.

පඩිපෙළ හේ දරු මල්ලො නොවැදුවාට ලැබිච්චි දරු දෙන්නට කොයියම්ම අයුරකින් හරි සැප සම්පත් දීල හදාගන්ඩ ඇහැකි වුණා.

අනික උඩරට ගෑනියෙක් ය කියන ගරු නම්බුව පුණ්නාට පන්සලේ හාංදුරුවන්ගෙන් පවා ලැබුණු හන්දා කොලු පැටව් දෙන්නව පන්සලේ පිරිවෙනට යවාලා අකුරු සාස්තරේ දීගන්න පුණ්නාට ඇහැකි වුණා. ඒ නං වැඩියත්ම මල්වතු පිරිවෙනේ ඉගෙනුම ලබාපු උන්නාන්සෙ කෙනෙක් දුරින් නෑ වෙච්චි හන්දා.

අවුරුදු ගානකට කලියෙන් ගම රට අතෑරලා ආපු ගෑනි වෙච්චිකොට ගමට පරංගි වහංගතේ අල්ලාපු බවක් පුණ්නා දැන ගත්තෙත් හේතුපාලගෙ පරණ මිත්තරයෙක් නෑගං ආපු වෙලේකයි.

පුණ්නාගෙ මව්පියො ගැන හාංකවිසියක ආරංචියක් ලැබුණෙ නෑ නෙව කොයි

තරම් විපරං කොළත්. අනේ ඉතින් දුක සේ මියැදිලා කැලේ ගහන්ඩ නැතෑ කියලා හිත හදාන පුණ්නා දෙමාපියෝ සිහි කොරාලා දාන මාන දිදී පින් පෙත් පැමිණෙව්වා.

දරු දෙන්නා බලා ඉන්දැද්දි ලොකු මහත් වුණා. ලොකු කොලුවා මහණ වෙන්ඩ මනාපය කියාලා අවසරේ ඉල්ලුවෙ යාන්තං අවුරුදු පාළොහ ලබද්දිමයි.

කොලූට අත් පොත් තියද්දිම කේන්දරේ බලාපු ලොකු උන්නාන්සෙ හතර කේන්දරේ පාළු වග පෙන්නා දීපු හන්දම මේ තීරණේ ගැන දෙමාල්ලො සෝක වුණේ නෑ. අනික මව් රදළ පියා ගොයි ගම වෙච්චිකොට ඉන්තේරුවෙම්ම පන්සලේ ඊගාව නායක කොම ලැබෙන්නෙත් මේ සාමණේරට නෙව.

හිච්චි කොලූ නං කරදඬු උස් මාත් වෙද්දි හේතුපාලගෙ කුඹුරු ගොයිතැනට බැස්සා. ඌට සහේට ගෙනාවෙත් හේතුපාලගෙ නගාගෙ කෙල්ල වෙච්චි ඩිංගි මැණිකා හන්දා මේ පවුලට නැන්දම්මා ලේලි නොරොක් වගතු ගන්ඩ කාරි වුණේ නැතුවා. ඒ මංගල්ලෙ කතා කොළෙත් පුණ්නාමයි. පුණ්නා තරං කඩා හැලෙන ලස්සනක් නැතත් ඩිංගි මැණිකා බෝම තැම්පත් හොඳ හැදිච්ච එකී. කම්මැලි කං එහෙමත් ගැවිලාවත් නෑ.

කොලූගෙ කටයුත්තත් අහවර වුණාට පස්සෙන් පහු හේතුපාල අකාලේ මිය පරලෝ ගියේ පපුවෙ ඇවිලිල්ලක් අල්ලලා. හැන්දෑ කොරේ නාලා කොරලා ඇවිත් රෑ බතට අටු කොස් කෑ හන්දා අල්ලපු පපුවෙ ඇම්මක් හන්දා වෙන්ඩෝනෙ කියලයි වෙද මහත්තයා කීවෙ.

පස්සෙං පහු ගෙදර දොර කටයුතු ඩිංගි මැණිකා බාරගත්තු හන්දා පුණ්නාට ඇති පදං යන තැනකට පිනක් දහමක් කොරගන්ඩ කාල වේලා හම්බු වුණා. තමන්නෙ දරු දෙන්නා ලව්වා උඩරට ඌරුවට "අම්මා අප්පොච්චා" කියවන්නත්, උන්නෙ දරු මල්ලො ලව්වා "ආතම්මා" කියවගන්ඩත් පුණ්නාට ඇහැක් වුණා.

සුගතෙගෙයි ඩිංගි මැණිකාගෙයි එකම දෝණියැන්ද නෙව සොබනි. අඩුපාඩුවක් නැතුවම සොබනි කෙලීට පුණ්නාගෙ රූප සෝබාව පිහිටලා තිව්නෙ. ඩිංගි මැණිකා තළේලුයි, මිටියි. සොබනි පුණ්නා හේම රතුයි, හීන්දෑරියි. කෙහෙ වැටිය කාක් කුඩුව හේ හැඩපලු ගෙතිලා, ජම්බෝල වගේ පිරිච්ච කම්මුල්, බෝනික්කො වාගෙ නටෝන ඇස්, සොබනි හැබෑම ලස්සන එකී.

හීං ඉගටිය පද්දලා ලැසි ගමනිං යන ගමන් කොක් කරට උඩින් මූණ පොවලා සොබනි දාන කෝල බැල්ම මාළු මාටින්ගෙ පපු කැනැත්තට ඊයං බරු හේ කිඳා බැස්සා.

මාටින් මේ ගංතුලාවෙ එකෙක් නෙවෙයි. උං මූදුකරේ ඉඳලා ගමට මාළු ගේන එකා. පස්සෙන් පහු ගමේ උන්ට උං "මාළු මාටියා" වෙච්චි.

මුලින් මුලින් "තුහ් නොදකිං පිළී උස්සාන එන පව්කාරයා!" කියාපු ගමේ උං පහු පහු වෙද්දි කිව්වෙ "බල මාළු ඩිංගක් දෙන්නෝනෙනෙ නැන්දෙ පොඩි එවුංට වත් ලේ වඩන්න" කියාලයි.

හතර පෝයට සිල් ගන්න ගමේ දෙගොඩහරි වයසෙ උන්දලා මාළු පිළී අප්පිරියා කෙරුවට මෙතුවක් කල් වෙල් මාළු කාපු ඉලන්දාරින්ට නං මාළු මාටියව ගජ මිත්තරයෙක් ගානයි.

සුගතෙ ඉස්සෙල්ලම හබරල කොළේක පරා පැට්ටෙක් ඔතං ආපු දවසෙ ඉස්සරෝම ආයුද අමෝර ගත්තෙ පුණ්නා.

"හතරෙ පේරුවෙ දානෙ දෙන ගෙට මූ දේව් වඩම්මන්නද බොල තෝ දත කන්නෙ, ගේන්නෑ ඔයි ජරාව මේ හතර මායිමේ"

"උඹෙ අයියණ්ඩී පංසලේ ඊගාව නායක තැන වෙච්චි, මව් පාර්සවෙං මල්වතු විහාරෙට නෑ වෙච්චි බොට නුහුගුණේද මෙව්වා උස්සාන ආවෙ!"

අම්මගෙ ගෝරනාඩුව එක්කලා විලි තංතෝසෙ බැරුව ගිය සුගතෙ කඩුල්ලෙං මෙහාට නොගෙන මාළු කුරියා විසික්කා කොරලා දැම්මා. එකාතකට ඈ කීවෙ හැබෑ නෙව.

මාළු මාටිං සොබනි එක්ක උකුළු මුකුළු පාන බව මුලිම්ම ඇහැට වැටුණෙ ඩිංගි මැණිකෙට. ඈ කසුකුසුවෙන් සොබනිට තරවටු කොළේ මෙව්වා පුණ්නයෙ කන වැකුනොතින් මහ ගිනි විජ්ජුම්බොරයක් වෙන හන්දා. අනික කාසි දීලා මාළු කුරියෙක් ගන්නවා වාගෙයැ හිර ගනුදෙනු කෙරුවාව!

"ඈ බොල බොණ්ඩියෙ තොට සිහි මුලා වීගෙන එනවා හේමද? ආයෙ මේ අම්මා අප්පා ඉණට වස්තරයක් ඇඳං එළි පහළියකට බහින්නෙ කොහොමද උඹ උං එක්ක දීග ගියෝතිං! මේ ගමේ උන් අපිට ගල් ගහයි බොල!!'

සොබනි අම්මට උඩින් මක්කවත් කියන්ඩ ගියේ නෑ ඉකි ගැහුවා මිසක්කා.

"බොට ආයෙ මං කියන්නෑ හොඳ හිතිං නවත්තාපං ඔය නාඩගම! මේ අම්මා මළා කියලා හිතාගං උං එක්ක ගියෝතිං!"

අම්මා කොයි පදම් බැන අඬ ගැහැව්වත් මේ කාරණාව අප්පොච්චගෙ කනේ තියන්නැති වග දන්න හන්දම සොබනි හිතුවක්කාරකොමක් කොරන්ඩ බලා උන්නා.

හොරාට කලියෙන් කෙහෙල් කැන වැට පැන්නා හේ , පෝය දා හැන්දෑකොරේ මාළු මාටියා එක්කලා යන්ඩ අඩුම කුඩුම පොදි ගගහා උන්නු සොබනිව පුණ්නයෙ ඇහැ ගැහුණා. විඩින් විඩේ කල්පනා කොරකොර තමුං එක්කලම හිනැහි හිනැහී උරේකට රෙදි ඔබඔබා උන්නු සොබනි දුටුවම තමුං හේතුපාල එක්ක එන්ඩ කලියෙන්දා රෙදි කොට්ට උරේ සූජානං කොළේ මේ වායෙ තිගැස්මක් බයක් එක්ක අමුතු තංතෝසෙකිං බව සිහිපත්තට ගත්තු පුණ්නට කෙලීගෙ මේ අමුතු ලක ලෑස්තිය ඒතරං හිතට ඇල්ලෙව්වෙ නැතුවා.

"ඈ බං කෙල්ලෙ ඔයි කොයි අහ යන්ඩදෑ රෙදි පොට්ටනි බඳින්නෙ"

කන ගාවින් ආතම්මයෙ කට හඬ ඇහිච්චි සොබනි ගැස්සිලා ගියා. උන් හිටි තැන් අමතක වෙලා තතනතතනා වචන එක්කහු කොරගන්ඩ දැඟලුවා.

"මං මං මේ මේ.."

"මොකෑ කෙල්ලෙ කටේ පිට්ටුද?"

පිළිකන්නෙ දොර ගාවින් කාරලා බුලත් කෙළ පාරක් විදපු පුණ්නා රැළි ගැහුණු අත් ගොබේ ඉඟටියට තියාගෙන කොන්දෙ වක දිගෑරගන්න ගමන් තව ඩිංගක් විපරං කොරා.

කටේ කෙළ හිඳිලා ගෙහුං දත කට පූට්ටු වෙලා වායෙ උන්නු සොබනිගෙ විලාසෙං සේරෝම කතා ලතා තේරුංගත්තු පුන්නා අඬහැරේ පෑවා.

"ඈ බොල තෝව දෑහෙ මූණෙ තියාන හදාපු අම්මා අප්පට හොරෙං පිටමං වෙන්ඩ නේද ඔයි තනන්නෙ?"

අන්න එතකොට නං සොබනිගෙ කටපත්තට පණ ඩිංගිත්තක් ආපි.

"ඉතිං ආතම්මෙ උඹත් අපෙ අත්තා එක්ක ආවෙ හත් දොහේ මගුල් කාලයැ හඳපානෙ මිසක්කා!"

"මොනා බොල!"

පුණ්නා දුම්මල වරං ගත්තු කපු රාළ හේ යස්සාවේස වුණේ සොබනි කියාපු ගරුසරු නැති කීමටයි.

"හිටු තෝව මං කෙස්සෙන් අල්ලලා හොස්ස බිම උලන්ඩ! කොයි මේ ඉලපත"

අත පය වාරු නැති ආතම්මා ඉලපත හොයහොයා බිම අත පත ගාද්දි සොබනි මිදුලට පැන්නෙ රෙදි උරේ බදාගෙනමයි. ඒත් ඉතින් මේ ගොම්මනේ කොයි අහ දුවන්ඩද, මාටින් එන්ඩයි කීවෙ පහුවදා රෑ මැද්දෑවෙ බස්සා අඬන හෝරාවට නෙව.

හෙට රෑ බණට ගෙදර ඇත්තොන්ට යන්ඩ ඇරලා බඩේ රුජාවක් ගන්ඩම තමා සොබනිත් හිතා උන්නෙ. අප්පච්චිත් හේනෙ ඉඳලා එන්ඩ කලියෙන් මේ සුමේ බේරුං කොරගන්ඩ ඇහැක් වෙද කියාලා සොබනි උන්නෙ පපු කැනැත්තෙ කිකිළි බිජු තම්බන්නා හේ ගිනි මොළවාගෙනයි.

ආතම්මයෙ කෑ කොස්සං හඬට අම්මා චීත්තෙ අත පිහිදදා දුවං එන හැටිත්, අහල පහළ එකෙක් දෙන්නෙක් විපරං කොරන හැටිත් දැකපු සොබනි සේරෝම අහවර බව තේරුංගත්තා. ගිඩි ගිඩි ගාන පපු කැනැත්තට රෙදි උරේ තද කොරාන හයියෙං හුස්මක් ගත්තා.

අර මුලිං කීව ජල්ලිය පටංගත්තෙ ඕං ඔහොමයි.

කෙස්සෙන් ඇදලා අරං සොබනිගෙ කම්මුල පුපුරු ගහන්ඩ පාරවල් දෙකක් දීපු ඩිංගි මැණිකා මිදුලෙ වැටිලා පස් කකා විලාප ගහන්ඩ වුණා. කරුණු කාරණා ලේලිගෙම්ම අහගත්තු පුණ්නා යද්දෙස්සි වාගෙ ගිනි පුපුරු විසික්කා කොරකොරා කෑකෝ ගහන්ඩ තියා ගත්තා.

සොබනි කා එක්ක යන්ඩ තැනුවාද කියාලා දැනගත්තාම පුණ්නා මාළු මාටියගෙ සනුහරේටම සාප තිව්වා. සුගතෙට මගදිම ආරංචි වෙච්චි හන්දා අඩිය ඉක්මං කොරාලා ආවත් , එද්දි ගමේ එවුං දුසිමකට වඩා කඩුල්ල ගාව රැස් වෙලා උන්නු බව පෙනෙද්දි සුගතෙට පොළෝ දෙබොක්කාව පළාන යන්ඩ හිතුනා.

අප්පොච්චිව දැක්ක සොබනිගෙ කකුල් කෙටි දෙකත් පණ නැතුව ගියා. ඇට්ටරකොමට අම්මයෙං කාපු කම්මුල් පාර උහුලං උන්නට සොබනිට නොරිදුණා නෙමේ. උපන්තේකට අතක් උස්සාලා නැතත් මේ කොරාපු හිතුවක්කාරකොමට නං අප්පොච්චගෙනුත් සමාවක් නැති වග සොබනිට ඉර හඳ වාගෙ විස්සාසයි.

"ආ මේ එන්නෙ උඹෙ මහ එකා. අපූරු නෙවෙද දෝණියැන්දගෙ කෙරුවාව!"

අමුඩ ලේන්සුවත් කරේ දාන ඉස්තෝප්පුවට ගොඩ වෙන්ඩ ආපු සුගතෙ ඉස්සරහට පැනපු පුණ්නා රාස්සියක් වාගෙ කෑ මොර දුන්නා.

"ඩිංගක් ඉඳිං අම්මෙ කෑකෝ නොගා මක්ක වුණාද කීලා කෙලීගෙං සහසුද්දෙං අහලා බලනකං"

හිතේ අමාරුව යට කොරාන සුගතෙ කීවෙ ඩිංගිත්තක් ඉස්පාසුවක් ගන්ඩයි.

"මක්ක වුණාද, මක්කවත් උනේ නෑ බොල මේ නාකි ගෑනිට පිං සිද්ද වෙන්ඩ! නැහ්නං මේ පුරා පෝයක් ලබන හෝරාවෙ උඹෙ දූ පොඩ්ඩ අර ජාතියක් ජම්මයක් නැති මාළුකාරයෙක් එක්ක වහංගු වෙලා ගොහිං මෙලාහකට! අනෙ

අම්මපා මයෙ කට! මේකි මටත් විච්චූර්ණ කියාන ආවනෙ එකටෙක!!"

ඒ පුණ්නා. ඒ වංගියෙ තකහනියෙ නැගිටගත්තු ඩිංගි මැණිකත් නැන්දම්මයෙ පැත්තම ගත්තා.

"ඔහෙට කියන්ඩ මේකි මහ ලොකුවට මේ දැවැදි පොදි ගහං ලකලෑත්ති වෙලා නෙව අරූ කැන්දාන යන්න එනකං! දෙයියෝ බැලුවා හේ අම්මට ඇහැ ගැටුණෙ. අනේ අම්මාපල් මේ හැතිරි වදාපු මයෙ බඩ පාළු වුණානං මීට හොඳා"

මල් කපන කිනිස්සෙං ඇන්නා හේ අම්මා කියාපු කතාවට සොබනි කෑ ගගහා අඬන්ඩ තියා ගත්තා.

"අඬපං තෝ අදම අඬලා මකබෑ වෙයං, ආයෙ මේ අම්මයෙ මිනියටවත් අඬන්න එන්ඩ දෙන්නෑ බොට!"

ඩිංගි මැණිකා මේ සා පරල වෙන බවක් සුගතෙ දන්නෙත් අද! එකාතකට පැටව් ඉන්න දිවි දෙනක් උනත් උං රකින්න රවුද්දර වෙනවා නෙව.. ඒ කොයි හැටි වෙතත් මේක මේ හීං නූලෙන් බේරන්ඩ ඕනෙ වග තේරුං ගත්තු සුගතෙ ඩිංගක් නිව්ච්ච හඬින් කතා කොළා.

"හා හා නවත්තගනිං බං, මේ අහල පහළ උන් හිනස්සන්නැතිව"

"අහල පහළ? අහල පහළ උං අපිව රොඩී රැහැට පන්නාවි මේකි අර හුලවාලියා එක්කලා ගියානං!!"

පුණ්නා සොබනිට එරෙව්වෙ ජාති හතුරෙකුට වාගෙ!

"පිං අයිති වෙයි අම්මෙ ගෙට ගියානං! මං ආයෙ උඹලට කියන්නෑ"

සුගතෙව දවා අලු කොරන්ඩ වාගෙ ඔරෝපු පුණ්නා හැරමිට්ට ගහහා ගෙට ගොඩ වැදිච්චි. මනුස්සයට උඩිං කට කියෝන පුරුද්දක් නැති හන්දා ඩිංගි මැණිකත් කරබාගත්තා මිසක්කා කෝප ගිනි නිවිලා නොවෙයි.

දූ ගාවට ගොහිං ඇව උරස්සෙං ඇදලා පිල දිහාට්ට තල්ලු කොරාම එහෙව් දෙයක් නොහිතාපු සොබනි කෙහෙල් කඳක් කපා දැම්මා හේ බිම ඇද වැන්නා.

"යකෝ මේකිව මරන්ඩදෑ හදන්නෙ?"

සුගතෙටත් කේන්ති ගෙහුං වග තේරුණු හන්දා ඩිංගි මැණිකයි පුණ්නයි දෙන්නා එක්කලා ගෙට වැදුණා. මූණෙ කටේ ගෑව්ච්ච වැලි ගසගසා ගවුං කරෙන් හොටු පිහිදපු සොබනිත් කඳුළු පෙරපෙරා අම්මා පස්සෙං ගෙට ගෑටුවා. අම්මා තල්ලු කොරාපු පාරට ගවුං කැල්ලෙ උරිහ ගාවින් ඉරිලත් තිවුණු හන්දා ලැජ්ජාවයි

බයයි සේරෝම එක්කලා සොබනි හූල්ල හූල්ල ඇඬුවෙ ආයෙ මේ වෙච්චි නව නිංගිරාවට ගමේ එකියකගෙ මූණක්කත් බලන්නෙ කොහොමෙයි කියාලා.

ගෑනු උදවිය ගෙට යනකං බලා උන්නු සුගතෙ කඩුල්ල දිහාට හැරුණා.

"හ්ම් උඹලත් දැන් ගෙවල්වලට පලයල්ලා මෙතන ටැග් ගැහෙන්නැතුව"

කෝචෝක් හිනාවක් පාපු අහල පහළ ගෑනු කාංඩෙ සුගතෙගෙ ගෝරනාඩුවට සීරුවට පහු බැහැලා ගියා.

එදා රාත්තිරියෙ ගේ පුරා තිව්නෙ මහ මුස්පේන්තු පාළුවක්. රෑට බතක් මාලුවක් ඉදෙව්වෙත් නැතුවා කවුරු කවුරුත් ඒ මේ පැති බලාන හූල්ලහූල්ලා උන්නා මිසක්කා.

සොබනිට උහුලන්ඩ බැරිව ගියේ තමුං මෙච්චර මගඩියක් කොරලාත් අපොච්චා වචනෙකිං වත් තරවටු කොළේ නැතිකොම, නිය පිටිං පාරක් ගැහැව්වෙ නැතිකොම! සිරියා කාන්තාව වැඩ උන්නා හේ කලඑළියට තිව්ණු ගෙදෙට්ට තමුං හන්දා මූ දේවින්නාන්සෙ වැඩියා නෙවද කියලා සොබනි පස්චත්තාප වුණා.

බලා ඉඳලා බැරිම තැන සොබනි ලිප දල්ලලා තේ කහට උගුරක් වක්කොරන්ඩ හිතාන උයන ගෙට ආවෙ හේනෙ ඉඳං මාන්සි වෙලා ආපු අප්පොච්චිට සාගින්දර ඇති හේමයි කියාලයි.

එක විඩේටම පාර දිහායින් ඇහිච්චි හූවට සොබනි ගැස්සිලා ගියා. අතේ තිව්ණු ගිනි පෙණෙල්ලත් බිම අතෑරුනා.

"දෙයියනේ මාටිං අය්යා රා බීලා ඇවිත් කෑ කොස්සං දෙනවා!!"

හතර අතේ විසික්කා වෙච්චි ගිනි පුපුරු අඟුරු අළු කසි බිසියෙන් ගසගසා නිවා දාපු සොබනි කඩිමුඩියේ සාලෙ දිහාට දිව්වා. තමුන් මේ ගෙයි පත්තු කොරාපු ගින්න නිවන්ඩ එහෙම ලේසියෙන් බැරි වග සොබනිට ඒ අව් අස්සෙත් හිතට නැගුණා.

"උඹ පලයං අහට්ට"

ඩිංගි මැණිකා සොබනිගෙ අතින් ඇදලා වැළැක්කුවෙත් සුගතෙ ඉස්සරා දොර අරින්ඩ අත තිව්වෙත් එකටමයි.

"මයෙ දෙයියො යන්ඩෙපා ඕකා ඉන්නෙ රහමෙර කටේ ගාගෙන කිසි අණක් ගුණක් නැති එකා නෙව"

සොබනිව අතෑරපු ඩිංගි මැණිකා සුගතෙගෙ අතේ එල්ලිච්චි. පුණ්නාත් හැරමිට්ට

ඇනඇනා සාලෙට ආවා.

හැන්දෑකොරේ මෙහෙ අල්ලාපු අඩච්ච ගැන මාටින්ට කන වැටුණෙ වැව් ඉස්මත්තෙ ගබෝ රාළලෑ රා තිප්පොළේදියි. දවල් හේන් කොටපු එකා දෙන්නා වැවේ නාලා හවාට රා පොල් කට්ටක් කටේ ගාන්ඩ රිංගුවෙ ඔතෙන්ට නෙව. හැබැයි සර්දාවන්ත ගමේ උන්දලා රා බොන ගෙරි මස් කන එක මහා පාපයක් ගානටයි සැලකුවෙ.

හාංදුරුවො රහමෙර පානේ ආනිසංස කියා දෙන හන්දා ගබෝ රාළයි ගෝලයො රොත්තයි පංසලට ගෑවිච්ච මේ පවුල එක්කලත් යටින් විරසකව උන්නෙ. ඒ හන්දා රා පොළේ උන්නු එවුං මාටියට නාලාගිරියට හේ රා පොවා උසි ගන්නෝලා එවපි.

"හහ් හිතුවා මදි තොපි මේ මාටියා එක්ක හැප්පෙන්ඩ! මං මූදුකොරේ එකෙක් බොලව්! මාළු මන්නෙන් කපන්නෙ දැනගං!!"

සුගතෙ නිස්සද්දව සොබනි දිහා බැලුවා. සොබනිත් උන්නෙ මොකවත් හිතා ගන්ඩ බැරිව. ඩිංගි මැණිකා වෙව්ලනවා. පුණ්නා නං බුදු පාන ගාව වැඳගෙන උන්නෙ.

ආයෙ උඟ ගැන විපරං කොරන්ඩ දෙයක් නැති වගත් මාටින් මීට කලින් දීගෙ ගෑනිට තඩි බාලා ගෙයින් පන්නාපු දරු මල්ලො අතෑරපු මිනිහෙක් වගත් සුගතෙට හවහා කීවෙ අල්ලපු හේනෙ පුංචි සිඤ්ඤො. මෙච්චා දනී නං ඩිංගි මැණිකයෙ පපු කැනැත්ත පැලිලා යන හන්දම සුගතෙ මේ කාරණේ නොකියාම උන්නා. අනික සොබනි උනත් මෙච්චා හාංකවිසියක් නොදැන රැවටිච්චි වග සුගතෙට තහවුරුයි. දෙයියනේ කෙලී උඟ එක්ක වහංගු වුණා නං ආයෙ මැහි තෙල් බීලා නහින්ඩ නෙව වෙන්නෙ!

"අඩෝ සුගතේ!! උම්බලා මයෙ සොබනිව හිර කොරාන්ඩ හිතුවා මදි යකුනේ, මං ගෙයි දොර කඩන්ඩ ඉස්සර වරෙං එළියට!!"

රා බීපු හිවලා හේ කට මැත දොඩාන කෑ කොස්සං දෙන මාටියා ගැන සොබනිට දැනුනෙ අපුලක්. අනේ අම්මාපල් අම්මා අප්පා එපා කීලා යන්ඩ තැනුවෙ මූ එක්ක නෙව! අප්පොච්චි පොළේ ගිය දාට ගේන කරෝල කෑල්ලක් මිසක්කා වෙන මසක් මාළුවක් කටේ නොතිච්ච සොබනි මේ සා උගුඩුවා හේ රා බොන, ගෙරි මස් බුදින එකාට කෝම ආලෙ පිරුවද මන්දා! ඊටත් මූ තමන්නෙ දෙමාපියොන්ට කිසි ගරුසරුවක් නැතිව දෙස් තියන ලීලෙ!

දෙවාරයක් නොහිතපු සොබනි හිතට මහා හත්තියක් අරන් එක විඩේටම අම්මවත් තල්ලු කොරාන දොර ඇරියා. ගෙයි හැමෝම අල්ලාපු හුස්ම අල්ලාගෙනම

උන්නෙ තක්බීරි වෙලා. සරම කැහැපට ගහගෙන කඩුල්ල පැනගන්ඩ බැරි ගානට වෙරි මතෙ වැනි වැනි උන්නු මාටින් ගෙ අතේ මාළු මන්නෙ.

"උඹ පලයං අයියණ්ඩි, මං උඹ එක්ක එන්ඩ මනාප නැතුවා"

"මොකක් බොල, උඹ මා එක්ක යන්ඩ නාවොත් තෝත් තොගෙ මහ උනුත් මේ මන්නෙන් කීතු කීතු කපලා මාත් මෙතන මැරෙන්නෙ දැනගිය!!"

ඒ වංගියෙ නං සොබනිගෙ කේන්තිය උහුලන්ඩ බැරිව ගියා. මූණට ලේ පිරිලා කම්මුල් රත් වෙලා ආවේස වෙච්චි හේ පිලේ හේත්තු කොරලා තිව්ණු කැත්ත අරං මිදුලට පැනලා උරුක් කොරා.

"අම්මාපල්ලා මාටිං අයියෙ මං උඹට මේ කැත්තෙං කොටන්ඩ කලියෙන් පව් නොදී පලයං හොඳ හිතිං, ආයෙ මයෙ දෑහට පේන්ඩ එන්ඩෙපා"

මාටින් උන්නෙ සොබනිගෙ හදිසි වෙනස් වීම අදහාගන්ඩ බැරිව. කෙස්ස කඩා දාගෙන ඇස් ගෙඩි ලොවි ගෙඩි වාගෙ රතට රතේ ඔරෝගෙන උන්නු සොබනි දැකපු මාටින්ගෙ වෙරි මතත් බාගෙට හිදිච්චි.

"එහෙනං උම්බ එහෙමයි ඒ?? හොඳයි බලාගමු සොබනි, උම්බලා නයාට ගහලා පොල්ල වරද්දගත්තා කියලා හිතාගං!! මේ මාටියා උම්බට වඩා ගෑනු දැකලා තියේ!"

නත් දොඩෝ දොඩෝ මාටිං යන්ඩ හැරෙනවත් එක්කම දොර වහ දාලා කැත්ත බිම අතෑරපු සොබනි අප්පොච්චිට තුරුල් වෙලා මී දෙන වාගෙ අඬන්ඩ තියා ගත්තා.

"අඬන්ඩ එපා මයෙ අම්මා, දැන් නිදාගං. උඹ ටික දොහක් ගමෙං පිටමං වෙලා හිටපන්"

දෝණියැන්දයෙ ඔලුව අතගාපු සුගතෙ ඩිංගි මැණිකට ඉඟි කොළේ ඈට තවත් දෙස් තියන්ඩ එපාය කියලයි.

මේ හෙයියම්මාරු සේරම අහවර වෙද්දි රෑ මැදියමත් පහු වෙලා. පුණ්නා උන්නෙ ඇඳේ දපා තියලා හූල්ල හූල්ල. හවහ සොබනි කියාපු කතාවෙ ඇත්ත සත්තක් ඇතෑ කියාලමයි පුණ්නා මනස්තාප වුණේ. ඒ වංගියෙ තමන්නෙ දෙමාපියො කොයි තරං ගින්නක් උහුලන්ඩ ඇත්ද හැබෑට.

ආතම්මයෙ ඇඳ පාමුල පන් පැදුර එලාගන්ඩ ආපු සොබනි දණින් වාඩි වෙලා පුණ්නයෙ ඔළුව අතගෑවා.

"ආතම්මෙ තරහද මා එක්ක?"

සද්දෙට හූල්ලපු පුණ්නා සොබනි දිහාට්ට හැරුණා.

"නෑ බං හිච්චි කෙල්ලෙ උඹ කියැව්වෙ ඇත්ත නෙව. මයෙ ඔළුවෙ තිව්ණෙ එකගෙයි කන්ඩ වෙයි කියාලා බය ඉතරමයි. අම්මා අප්පොච්චි කොයි තරං බය වෙන්ඩ ඇත්ද එදා, ඒ ඇත්තොන්ගෙ වලව් මාන්නෙ, අපේ පවුලෙ නම්බුව හේදිලාම යන්ඩ නැතෑ පහුවදා ගමේ උං දැනගත්තම!"

"අනේ මා ඒක හිතලා කීවෙ නෑ ආතම්මෙ. ආතම්මා නොහිටින්ඩ මං ගෙං වැස්සියෙක් වාගෙ අරූ එක්ක ගොහිං නෙව! ආතම්මා තමා මාව උගෙං බේරගත්තෙ! අනේ මට සමා වෙන්ඩ ආතම්මෙ"

"උඹෙ ආතා නං දාහෙං හොයාගන්ඩ බැරි මිනිහා. ඒ වාගෙය අරූ! උඹ ඌ එක්ක යාවිය කියාලා මං පණ බයේ උන්නෙ දුවේ"

"ඌ අප්පොච්චිට බැණ අඬගාපු විදිහ දුටුවම මට ඉහිලුං නැතුව ගියා ආතම්මෙ, ඌට කොටන්ඩමයි හිතුණෙ! මටත් ආතම්මයෙ ගති නැතෑ.."

කඳුළු අස්සෙංම දෙන්නම හිනැහුණා.

තමන්නෙ රැලි වැටිච්චි පපුවට සොබනිව හේත්තු කොරාගත්තු පුණ්නා ඒකියෙ ඔළුව අතගෑවා. දෙන්නාටම කොයි වෙලේ නින්දක් ආවද නිච්චි නැතුවා.

බට්ටිච්චො කිචි බිචි ගාන සද්දෙට සොබනි ඇහැ ඇරලා නිදි ගැට කැඩුවා. මාන්සියට නින්ද ගියාට අද අම්මලෑ සිල් දවස නෙව. සුනංගු නොවී දානෙ ඩිංගිත්තක් හදන්නෙපායැ. කුකුළත් අඬලාලා මහ වෙලාවක් නැතෑ.

තමන්නෙ ඉහ අත ගගා උන්නු ආත්තම්මයෙ අත පැත්තට කඩා වැටිලා තිව්ණා. ආතම්මයෙ අත හදන්ඩ හිතාන අතින් අල්ලාපු සොබනි ගැස්සිලා ගෙහුං විලාප තිව්වෙ ඒ අත් ගොබේ දර කොටයක් වාගෙ දරදඬු වෙලා තිව්ණු නිසායි!

"ආතම්මේ!! අනේ මයෙ රත්තරං ආතම්මේ!!!"

පපු කැනැත්තෙ රස්නෙ ගොහිං තිබ්බත් පුණ්නයෙ විට කාලා රතු වෙච්චි දෙතොලෙ සැනසිලිදායක හීං හිනාවක් ඇඳිලා තිව්ණා..

**-නදීශා පෙරේරා-**

(අගනුවර ශාඛාව- චාරිකා අංශය)

# සම දෙවන ස්ථානය
# "විරහව"

උදේම්ම ඇහැරුණා, ඉර එළිය වැටුණ නිසා වෙන්න ඇති. එහෙනම් උදේම්ම නෙමෙයි නැගිටලා තියෙන්නෙ. පරක්කුවෙලා. හරිම වේදනාවයි. රිදෙනවා, රිදෙනවා, එත් කොහෙද? හිත, හිතම තමයි එහෙම කිව්වෙ. ඇයි හිත රිදෙන්නෙ කියලා මතක්වෙන්නත් තප්පර තුනක් විතර ගියා මං හිතන්නෙ.

ඒ ආදරයත් ඉවරයි. අයියෝ මං කොච්චර හොඳට අවංකවම ආදරේ කරත් මං ආදරේ කරනවා වගේ මට ආදරේ කරන්න කවුරුත් නැනෙ. හැමදේම කළේ එයාගෙ හොඳට, එයා ගැනම හිතලා. ඒත් දෙයියනේ එයා මං හිතුවා වගේ නැනෙ. අපරාදෙ මගේ ජීවිතේ, කොච්චර දුරක් ආවද මම.

කුස්සියටම ඇවිත්, දන්නෙම නැතුව.

"මොකෝ අද කලින්ම නැගිටලා" ඒ අම්මා. ඇත්ත තමයි, නිවාඩු දවසට හය කියන්නෙ මහ පාන්දර. කුස්සියේ පොඩි බංකුව උඩ වාඩි වුණේ අම්මගෙ සැනසීම ඒ බංකුව උඩ තියෙන නිසා. තාත්තා හදල දීපු තේ එකත් බොන ගමන් අම්මයි තාත්තයි කතාකරන එක අහන් ඉන්නව වගේ මං හිටියා. තාත්තයි අම්මයි කතාකරනව වගේ හිටියට එයාලා සිහියෙන් ඉඳලා තියෙන්නෙ මගේ මූණ ගැන.

තාත්තා මොකක් හරි වැඩක් කරන ගමන් ළඟට ඇවිත් කිව්වා "ඔච්චර දුක් වෙවී ඉන්න එපා පුතේ, ඕක අත්තැරලා දාන්න. බම්බුව"

"අත්තැරලා දාන්න" කියන වචනෙ ඇහෙත්දිම හිතට දැනුණෙ සැහැල්ලුවක්. හීන් සතුටක්ද මහ විශාල සතුටක්ද කියන්න දන්නෑ. හැබැයි ඇස්වලින් කඳුළු බේරුණා. ඇඬුණා. එක දිගට එක එක සිදුවීම් මතක් වෙත්දි ඉකිගැහුණා. මතක් කර කර ඉකිගැහුවා. මෙහෙම වුණාම අඬන්නැතුව බැනෙ වගේ හැඟීමකුත් හිත යටින් තිබුණා. "ඔහේ හරි මෝඩයි, කොච්චර සැහැල්ලුවෙන් ඉන්න තියෙත්දිද ඔය එක එක ප්‍රශ්න දාගෙන දුක්වෙන්නෙ" එහෙම කිව්වෙ අම්මා, අම්මා මාතර.

අම්මා එහෙම කියත්දි හිතට පොඩි තරහක් තමයි ආවෙ, ඒ කියන්නෙ මං යාළුවෙන්න ගත්ත තීරණය වැරදියි කියලද අම්මා කියන්නෙ. මමනෙ දන්නෙ එයා මට පෙන්නපු විදිහ, නෑ නෑ මට එයාව දැනුණු තරම. මං හිතුවෙ ඒ එයාගෙ ඇත්තම විදිහ කියලා. පස්සෙනෙ මට ඇත්තම ගතිගුණ තේරුණේ. එයා මං හිතපු විදිය වුණානං මං යාළුවෙන්න ගත්ත තීරණය හරියට හරි. මම මාව නිවැරදි කර ගන්න උත්සහ කළා. දැං හිතේ ලොකුම අවුල තියෙන්නෙ

අම්මා මං වැරදියි කියපු එක.

මෙතන ඉන්න බෑ, මම යනවා එළියට.

"ඒ මිනිහත් නිකං කැකිල්ලෙ රජ්ජුරුවො වගේ" තාත්තා එහෙම කියෙනවා ඇහුණා.

කැකිල්ලෙ රජ්ජුරුවොත් පුදුම අසාධාරණ මිනිහෙක්. හැබැයි ඉතින් මොකක් හරි දේක හේතු හොයාගෙන හොයාගෙන මුලට යන එක වැරදි ක්‍රමයක් නෙමෙයිනෙ. හේතුවක් නිසා තමයි ඵලයක් හටගන්නෙ. එහෙම බලත්දි කැකිල්ලෙ රජ්ජුරුවන්ට වැරදුණේ වරදකාරී කෙට්ටු මනුස්සයා වෙනුවට මහත මනුස්සයව අලියට පාගන්න දාපු එක. බොරු කතාද කොහෙද. කළේ හදන කොට සුරූපී කාන්තාවක් එතනින් යනවා දැක්ක නිසා කළේ කට ඇද වුණා. ජනේලෙන්ද දන්නෑ දැක්කෙ.

බස් එකේ ජනේලෙ පැත්තෙ මං වාඩි වෙලා එයත් එහා පැත්තෙන් වාඩිවෙලා අපි ඉස්සර සතුටින් ගිය විදිය මතක් වෙලා ඊයෙ මට තනියම ඇඬුනා බස් එකේ එත්දි. ඇත්තම කියනවනම් අපි එහෙම සතුටෙන් ආදරෙන් ආවෙ යාළු වුණ මුල් කාලෙදි විතරයි. අනික් හැමදාම මොකක් හරි එකකට මූණ එල්ලගෙන ආවෙ. ඒ වුණාට එතන ආදරයක් තිබුණා. තිබුණද නැත්තං තිබුණා කියලා හිතාගෙන හිටියද මන්දා.

ඉස්සරත් මං බස් එකේ තනියම වාඩිවෙලා ගියා. ඊයෙත් එහෙම ගියා. ඉස්සරයි ඊයෙයි අතර තිබුණෙ මතකයක වෙනසක් විතරයි. ඒ ඇරෙන්න අඬන්න තරම් පාඩුවක් වෙලා තිබුනෙ නෑ මට ඒ සම්බන්දෙ නිසා. මම හිතෙන් මවාගෙන ආදරේ කරපු ඒ පුද්ගලයා නෑ, බලත්දි කවදාවත්ම ඉඳලත් නෑ. එහා පැත්තෙ වාඩිවෙලා හිටපු කෙනා එහෙමයි කියලා හිතන් ඉඳලා විතරයි ඉතින්.

"මට හීනයක් වෙලා ඔබේ ඔය ආදරේ....

මම තාම දන්නෙ නෑ මා ඇයිද පෙම් කරේ......

අද අදිනවා,

අද අදිනවා,

එක්කෝටි දස ලක්ෂයයි"

ලොතරැයි බයිසිකල් එක. එක්කෝටි දස ලක්ෂයක් ඇතිද මදිද. දැං කාලෙ හැටියට නම් මහ ලොකු ගාණකුත් නෙමෙයි. ඒත් ලස්සන ගෙයක් හදන්න පුළුවන් ඉඩමක් තියෙනවනම්. දුවලා ගිහින් ටිකට් එකක් ගන්න හිතුණා. ඒත් ලස්සන ගෙවල් මොකටද සැබෑ ආදරයක් නැතුව. මෙච්චර කල් ගත්ත එක

ටිකට් එකක්වත් ඇදුණෙ නෑ කියන වේදනාව සමනය කරගෙන විරහ වේදනාව ඉස්මතු වුණා. ගත්ත ටිකට් එකක් නොඇදීමත් දුකක්, රුපියල් විස්සක් තිබීම ඊට වඩා දුකක්.

මේ කෙහෙල්මල් ආදරේ පටන්ගන්න කලින් මං කොච්චර සතුටෙන්ද හිටියෙ. සැබෑ ආදරයක් මට ලැබෙනවා කියලා තිබුණ බලාපොරොත්තුව කඩවෙයිද කියන බය තිබුණා හැබැයි හිතේ. සතුටෙන් නම් හිටියෙ සැබෑ ආදරයක් ලැබෙන්න ඕනෙ කියන ආසාව මොකද ආවෙ? ඔය ඔක්කොම හිතේ තියෙත්දි තමයි එයාව මං පළවෙනි පාරට දැක්කෙ.

"දවසක්දා ඒ වසන්ත සැණකෙලියේ

දෙනෝ දහක් මැද ඔබෙ රුවමයි දුටුවේ"

එහෙම කිව්වට තව ලස්සන පිරිමි ළමයි ගොඩක් හිටියා කියලා මම දැක්කා. සමහර මූණුත් මට තාම මතකයි. මෙතන වෙනසකට තිබුනෙ එයයි එයාගෙ යාළුවො කට්ටියටයි, මමයි මගේ යාළුවො කට්ටියටයි ටිකක් වැඩිපුර වෙලා ළඟ පාත ඉන්න හම්බුණා. එයාගෙ යාළුවො අතර එයාට තමයි හොඳම පෙනුම තිබුණෙ. අපේ යාළුවො අතර එහෙම හිටියෙ මං. එහෙම බලත්දි අපි දෙන්නට අපි දෙන්නව විශේෂ විදියට පේන එක හරිම සාමාන්‍ය දෙයක්. අයියෝ ! ඒක තේරුණේ අදනෙ, මේ දැං වෙනකන්ම මං හිතන් හිටියෙ දැක්ක ගමන් හිත ගියේ සංසාරගත බැඳීමක් නිසා කියලා. විකාර. ඊට පස්සෙත් අපි දෙන්නා අහම්බෙන් කීප සැරයක්ම මුණගැහුණා. එහෙම වුණේ නම් පෙර කර්මයක් නිසා කියලා දැන් නම් විශ්වාසයි. මෙතනදි කර්මය නෙමෙයි හරිම වචනෙ කරුමය.

ඇත්තටම ඇයි මට එයාව ලස්සනයි කියලා පෙනුනේ. උස, කොණ්ඩෙ ලස්සනට පීරපු, පිළිවෙළක් තියෙන හැම පිරිමි ළමයටම මගේ හිත ගිහින් නැනෙ. අවංකවම එයාගෙ මූණෙ පොඩි "සාධාරණ" පෙනුමක් තිබුණා. සාධාරණ පෙනුම කියන්නෙ ලස්සන ගැන විග්‍රහ කරන්න සාමාන්‍යයෙන් පාවිච්චි කරන වචනයක් නෙමෙයි. ඒත් මගේ හිතට අනුව ලස්සන කැත මට පේන්නෙ ඒ විදියට.

කොහොමත් නළුවො වගේ පිරිමි ළමයින්ට මම කැමති නැනෙ. බොරු සෝබනේ කියලමයි මට හිතෙන්නෙ. ඒත් එදා චිත්‍රපටියෙ හිටපු ඒ චරිතෙ නම් මට සෑහෙන දවසක් යනකන් මතක තිබුණා. හරිම සාධාරණ වගේම ආදරණීය චරිතයක්. "රොමෑන්ටික්" නෙමෙයි, හරිම ගැඹුරු ආදරයක් එතන තිබුණා.

ආ.... එන්න එතනින් තමයි එහෙනං ඔය සාධාරණ පෙනුම කියන මිනුම් දණ්ඩ

මගෙ හිතට ආවෙ. මූණෙන් පෞර්ෂත්වයයි, පෞර්ෂත්වයට අනුව මූණයි සසඳන්න පුරුදු වුණේ. එයාගෙත් තිබුණා අර සාධාරණ නළුවගෙ පෙනුමට සමාන පෙනුමක්. පොඩ්ඩක් විතර තමයි ඒත්, මට එදා ඒක දැනුණෙ ලෝකෙ ඉන්න හොඳම හදවත තමයි ඒ කියලා. ඒත් ටික දවසකට පස්සෙ එක දවසක් රණ්ඩු කරත්දි තමයි තේරුණේ කටකොනින් හිනාවෙත්දි හරි කපටි පාටයි කියලා. ඊටත් වඩා පණ්ඩිතකම. ඒත් අර මුලින්ම හිතේ ඇඳුණ රූපෙ තමයි මාව තාමත් රිද්දන්නෙ. අර නළුවා දූෂ්‍යයට රගපාපු කතාව හොයාගෙන බලන්න ඕනෙ.

අර ගිය සතියෙ තාත්තගෙ යාලුවෙක් මට කතා කරලා තිබුණ පිරිමි ළමයා, එයාගෙත් පෙනුම මම හොයන ජාතියේ නෙමෙයි. ඉතින් එහෙම කෙනෙක්ව බැඳලා කොහොමද ජීවිත කාලෙම එකට ජීවත්වෙන්නෙ. මං වගේ වෙන්න ඕනෙ මම බඳින කෙනා, නැත්තං මටත් වඩා හොඳ සාධාරණ කෙනෙක් වෙන්න ඕනෙ. අපරාදෙ, මෙයා මම හිතන් හිටපු විදියෙ ගතිගුණ තියෙන කෙනා වුණානං කොච්චර හොඳද. එහෙම මිනිස්සු නැද්ද කොහෙද මේ ලෝකෙ.

ඒ වුණාට මුලදි එයා මට ඇත්තටම ආදරේ කළානෙ. එදා මම අර විභාගෙට යත්දි මාව කොච්චර උනන්දු කළාද, මට යාළුවන්ගෙන් සටහන් හොයලා දීලා, පාඩම් උගන්නලා කොයිතරම් උනන්දු කළාද. අන්තිම දවසෙ උදේ විභාගෙට යත්දිත් ඇවිත් ආපහු විභාගෙ ඉවර වෙලා එත්දිත් මං එක්ක යන්න ඇවිත් හිටියා. ඇත්තටම මට එදානං දුකත් හිතුණා. ඒකමනෙ මම ඇහුවෙත් ඇයි පැය ගාණක් එළියෙ බලන් හිටියෙ කියලා. ඒත් එයා කිසිම ලොකුකමක් නැතුව කිව්වනෙ මගේ පොඩි වැඩකුත් තිබුණා, ඒකත් මං කරගත්තා කියලා. අපි දෙන්නමනෙ යනගමන් ඒ වැඩේටත් සල්ලි දීගෙන ගියේ.

මොකක්, ඒ කියන්නෙ එදා එයා බම්බලපිටියට තකහතියක් ආවෙ ඒ වැඩේ කරගන්නද? ඒ වැඩේට ආපු ගමන් තමයි මාව හම්බුණේ. ඒ වුණාට පෙන්නුවෙනං හරියට මම වෙනුවෙන්ම ආවා වගේ. බලත්දි ඔක්කොම තියෙන්නෙ මං හිතෙන් හදාගනිපුවා. එයා ඉස්සර ඉඳලා තියෙන්නෙත් දැං වගේම තමයි. මං කොච්චර පවුද, මුල ඉඳන්ම රැවටිලනෙ.

පපුව මැද්දෙ මොකද්ද මන්දා ගුලියක් හිර වෙනවා වගේ තද වේදනාවක් දැනුණා. ඇස් දෙකම බොඳවෙන්න තරම් කඳුළු පිරුණෙ ආත්මානුකම්පාවට. මම වෙනුවෙන්ම කියලා එහෙම එන්න තරම්වත් කැපකිරීමක් කරන්න තරම් නොවටිනා කෙනෙක්ද මම එයාට? ඇයි දෙවියනේ මම මෙහෙම රැවටුණේ? මාව මෙහෙම රවට්ටන්න තරම් මම එයාට කරපු වැරැද්ද මොකක්ද? උත්තරයක්, ප්‍රශ්නයක් තියා හුස්ම ගන්නවත් මතක් නොවෙච්ච තත්පර ගාණක් ගත වුණා. මං වෙනුවෙන් ආවා කියලා පෙන්නන්න උවමනාවක් තිබුණ නම්, වැඩකුත්

තිබුණා කියලා ඇත්ත කිව්වෙ මොකටද. තව කොච්චර තැන්වලදි මෙයා ඇත්ත කියනවා කියලා මගේ හිත රිද්දලා තියෙනවද.

හොඳ හුළගක් හමාගෙන ගියා. හරිම සනීපයක් දැනුණෙ.

"ගත දැවටෙන මේ, සීත සුළං රැල්, අහෝ සැපයි කීවාලු ....."

තාලෙට, හිතෙන් කියවුණා. ලස්සන සින්දුවක් මතක් වුණාම හිතෙන් හරි කටින් හරි මුමුනන එක නවත්තන්න අමාරුයි. "අනේ මෙහෙම තණ්හාවක්, අනේ මෙහෙම ආශාවක්, මිනිසුනි ලැබේද ඉන් සැනසීමක්". ඒ මනුස්සයා බීලා හිටපු නිසා කන්දෙන් පහළට වැටෙනව කියලා කල්පනාවක් නැතිවෙන්න ඇති. ඒත් හිස ගසාදාන්න යත්දි යන්නෙ සිහියෙන්නෙ, එහෙම යත්දි වදක බෙරේ ගන්න හිතෙනව නං පුදුම තණ්හාවක් තමයි ඒක. කැවුම් කාපු එකනං අර ලෝභ සිටුවරයගෙ ජාතක කතාවනෙ.

ඇස් කන් නාසාවලට පොඩි විවේකයක් හම්බුණ ගමන්ම අර මූසල දුක් වේදනාව එනවනෙ හිතට. මේ දුකට පදනම මොකක්ද. වෙනදට උදේ ඉඳන් දිගට දිගට එන පණිවිඩ ටික අද නෑ. පාළුවක් වගේම, ඒකෙ පොඩි නිදහස් ගතියකුත් තියෙනවා. ඇත්තම එයා මං හිතන් හිටපු විදිය නෙමෙයි නං එයා මට නැති වුණ එක හොඳයි. ඊළඟට බලන්න ඕනෙ එයා ඇත්වුණ නිසා මට වුණ පාඩුව මොකක්ද කියලා. එහෙම ලොකු පාඩුවක් අවාසියක් නං නෑ. බස් එකේ එකට ළංවෙලා ගියා හැමදාම ළඟින් වාඩි වෙලා. දැං යන්නෙ තනියම. ඒ මතකයත් එක්ක එන තනිකම තමයි දුක.

"ආ දුව අද ගියේ නැත්ද උදේ? මම අපේ දුවව දාන්න හන්දියට ගියා. පුදුම සෙනඟක්නෙ බස්වල ඉන්නෙ උදේට"

"අද මං ගෙදර හිටියා නැන්දෙ. මාත් මේ ලබන සතියෙ ඉඳන් අර නිල්පාට පොඩි වෑන් එකේ යන්න ඉන්නෙ"

එතකොට ඒ ප්‍රශ්නෙත් ඉවරයි.

**-ජී.ඩබ්. එරන්දි ශිරංගිකා පෙරේරා-**

(නිමැවුම් සංවර්ධන සහ ව්‍යාපාර සැලසුම් ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය)

## සම දෙවන ස්ථානය

# "සමන්මලීගේ මරණය"

ගුරු පාර දිගේ කැරකොප්පුව දෙසට ඇදෙන සමන්මලීගේ අවමංගල්‍ය පෙරහැර වලව්ව දොරකඩින් යන විට පුංචිහාමි සමග එඩ්නා හාමුද ගේට්ටුව අද්දරට ගියාය. ජීවිතේ කිසිම දවසක මාරයා තමන් ළඟට නොඑතැයි සිතා සිටින සුදු මහත්තයා කාමරයේ ඇඳි පුටුවකට දිගා වී සුරුට්ටුවක් උරමින් සිටිනවා ඇතැයි එඩ්නා හාමු සිතුවා ය. එහෙත් සුදු මහත්තයා හිටියේ වත්ත පහළ වැට අයිනේ හිටගෙන කැරකොප්පුවට ඇදෙන අවමංගල්‍ය පෙරහැර දෙස බලාගෙනය. සමන්මලී වසර හතක් පමණ වලව්වේ කුස්සි අම්මාගේ අත්උදව්වට සිටි අතර ඇය මීට සතියකට ඉහතදී වලව්වෙන් නික්ම ගියේ මාර්ටින් අසනීපව ඇඳට ඔත්පළවීමත් සමඟය. ඇය වලව්වේ වැඩට ආවේ අවුරුදු දහතුනේදීය. ඒ කාලයේ එඩ්නා හාමු තෙලිජ්ජකන්ද කනිෂ්ඨයේ විදුහල්පතිනිය ලෙස කටයුතු කළ අතර සුදු මහත්තයා කරත්තයෙන් වැටී කකුල් දෙක වාරු නැතිවීමත් එක්කම ඔහු වෙනුවෙන්ම ඇරී සිටීමට කිසිවකුගේ අවශ්‍යතාව තදින්ම දැනී තිබුණි. පොල් කඩන්නට ආ මාර්ටින්ගෙන් සමන්මලී ගැන විමසන විට "උන්ගේ අම්මා ගිය දවසේ ඉඳන් සාංකාවෙන් වගේ. ඉස්කෝලෙ යන්නත් බැහැ කියනවා"යි කියනවාත් සමඟම සමන්මලී වලව්වට ගෙන්වාගැනීමේ අදහස එඩ්නා හාමුට පහළ විය. නින්දක් නැතුව මෙන් සිටි ඇයට මඳක් ඇලවී සිට නිදි සුවයක් ලැබුවා මෙන් සහනයක් දැනෙන්නට විය.

සමන්මලී වලව්වට පැමිණි පළමු දවසේම ඇය කෙරේ පැහැදීමක් ඇතිවන ලෙස වැඩ කටයුතු සිදු වෙන්නට වීම එඩ්නා හාමුට තවත් අස්වැසිල්ලක් විය. නොබෝ දිනකින් විශ්‍රාම යාමට සිතා සිටියත් කාලය සම්පූර්ණ වීමෙන් පසුවම විශ්‍රාම යාමට පෙළඹෙන්නට තරම් සමන්මලීගේ කල්කිරියාව ඉවහල් විය. පුංචිහාමි විටින් විට ඇවිත් සමන්මලීගේ ගුණ වර්ණනා කරන්නට ගත් විට ඒ හැඟීම් දෙගුණ තෙගුණ වී හදපත්ල තුළ තැන්පත් වී සමන්මලීට තමන්ගේ දරුවකුට මෙන් සලකන්නට නැඹුරු වුණා ය. ටිකෙන් ටික සමන්මලී වලව්වේ ආධිපත්‍යය තමන් අතට ගෙන ඇතැයි යන හැඟීම පහළ වෙනතුරු ම එම දාරක ස්නේහය ඇය තුළ තැන්පත් වී තිබිණ. ඉබාගාතේ යන බල්ලකු දෙන්නකු හැර ඇර තිබුණු ගේට්ටුවෙන් වලව්වේ වත්තට හොර සතුරකු නම් නොඑන බව හොඳටම විශ්වාසය. එතනිං යන එන උදවිය පවා දෙවැලම්ටෙන් හිසට ඇන කුලප්පු වුණු ගොනෙකු මරා දැමූ සුදු මහත්තයා සිටින වලව්ව මේ යැයි හොඳ හැටි දන්නා නිසා හෝස් ගා දොර ජනෙල් ඇර දමා තිබුණත් වලව්ව ඇතුළට සුළං පොදක් මිස වෙන කිසිවෙක් නො ආහ. රාත්‍රී දහය හමාර වෙන විට කෑම කා අවසන් වී සුදු මහත්තයා කඩුවත් අතැතිව එළියට බැස වලව්වේ හතර මායිම් පරීක්ෂා කර බලා පැමිණෙන්නේ අප්පච්චී සිටිය කාලයේ සිට පැවත

එන සිරිතක් නොකඩ කොට පවත්වා ගෙන යාම සඳහා මෙනි. එදිනත් ඒ ගමන යාමට සැරසෙන විට ජර බරස් ගා කොස් අත්තක් කඩාගෙන වැටිණ. සමන්මලී වලව්වට පැමිණ තුන්වෙනි දවස වෙන නිසා මෙවැනි විශාල ශබ්දයක් මීට පෙර අසා නැති නිසාත් ඇය බියෙන් වෙව්ලමින් කුස්සියේ කරමින් සිටි වැඩද අතර මග නවතා දමා මැද සාලයට දුවං ආවා ය. පුංචිහාමි විසින් ඇය නැවත කුස්සියට ඇරලනු ලැබුවා ය. සුදු මහත්තයා පොල් වත්තේ මායිමට ඇතුළු වෙනවාත් සමඟම විදුලියක් කොටා වියරු ලෙස කෑ ගසන කුරුල්ලකුගේ හඬක්ද සමඟ සුළඟක් හමා ගියේය. ඈත අහසේ ගිගුරුම් සහිත වැසි වැටෙන බව විටින් විට කොටන විදුලියෙන් හඳුනාගත හැකි විය. වේදනාවෙන් කෑ මොර දෙන ගෙම්බකු නියත වශයෙන්ම සර්පයකුගේ කුස තුළට තව ස්වල්ප මොහොතකින් ඇතුළු වෙනු ඇත. එක පාරට හමා ගිය සුළඟින් වෙරළු ගහේ මල් සියල්ලම පාහේ ගසාගෙන ගියේය. වෙරළු මල්වල සුවඳ වැස්සේ හේදී යන්නට විය. වැස්සට නොතෙමී වලව්වට යෑමට පිටත් වුණ සුදු මහත්තයාගේ කකුල ගලක වැදී උඩින් විසි වී ගියත් ඔහු නොවැටී බේරුණේ ය. සිහින් සිරිපොද වැටෙද්දී ඔහු ගෙට ගොඩ වෙද්දී එඩ්නා හාමු දොර ළඟ රැකවල් ලාගෙන සිටියේ සුරත කම්මුලේ තබාගෙනය. එදින රෑ මහ වැහි ඇද හැලෙන්නට විය. පසුදා පහන් වන තුරුම මහ වැස්ස ඇද හැලිණ. අහස ඉකි ගසගසා වැස්ස ඇද හැලෙන්නට විය. වලාකුළු රෑ එළිවෙන තුරුම හූල්ලමින් සිටියේය.

අවමඟුල් පෙරහැරේ බෙර ශබ්දය ළඟ ළඟම ඇසෙන්නට විය. මහත් ශෝකාන්තයක් වාතලයට මුසු වෙමින් තිබිණ. මුළු පරිසරයම මූසල බවක් උසුලමින් තිබිණ. ගස්වැල් පවා නිහඬ නිශ්චලබවින් මුසපත්ව ශෝකාකුල බවක් මුවඟට නංවාගෙන තිබිණ. "සමන්මලීගේ මිනිය මුලින්ම දැකල තියෙන්නේ යසවතීලු." කන් අඩි දෙක ළඟින් ම ඇසුණු ලීලසේනගේ හඬින් සුදු මහත්තයා තිගැස්සුණේ ය. ටික දවසක සිට ලීලසේනගේ හා සුදු මහත්තයාගේ සතරකන් මන්ත්‍රණ දෙස ඇහැ ගහගෙන සිටින එඩ්නා හාමු ඔවුන් දෙසට කඩිමුඩියේ ගමන් කළාය. ලීලසේන පල්ලම් බැසගෙන ගිය අතර සුදු මහත්තයා වරකා ගසට ආ කපුටකු ෂෝ ෂෝ ගාමින් පන්නා දැම්මේ ය. ජීවිතයේ තිත්ත රසය දිවගට තොල ගා ඇති එඩ්නා හාමු පුංචිහාමි ලවා මල් වට්ටිය ගෙන්න ගෙන පිච්ච වැල දෙසට ගමන් කළා ය. අඳුර වැටුණු පසු ගස් අස්සෙන් කැරකොප්පුවේ ගිනි දැල් දැල්වෙනවා දැකිය හැකි විය. "අර මිනිස්සු දෙන්නෙක් වත්තං කරගෙන ගියේ ඒකිගේ අම්මලු. මැරුණට පස්සේ මොකට ආවද මන්දා" උළුවස්සට හේත්තු වී එඩ්නා පවසන විට සුදු මහත්තයා සුරුට්ටුවක අග කඩා දැම්මේ ය. බල්ලෙක් ගේට්ටුව ළඟ එහෙට මෙහෙට යමින් උඩු බුරලමින් සිටියේ ය. "ඔන්න අදත් පටං අරං" යි කියමින් පුංචිහාමි මිදුලට බැස වැලි අහුරක් ගෙන කටට ළං කර ජප කර ඈතට විසි කළාය. කිසිත් කතා නොකරම ගෙට ගිය සුදු මහත්තයා රෑ ආහාරය නොගෙනම නින්දට වැටුණේ ය. ජීවිතාවබෝධය ලැබුණු කලක මෙන් ඔහු හැසිරුණේ ය. විනෝදාස්වාදය පතා ඔහු හා පොර කුකුළන් කොටවන තැනක් බැලීමට වලව්වට පැමිණ තුන්වෙනි දින ගමේ ඈත කෙළවරේ

සැඟවුණු ගුබ්බෑයමකට ගිය හැටි එඩ්නා හාමු සිහියට නඟාගත්තාය. වත්ත පහළ නරියෙකු හූ කියන හඬ ඇසෙන්නට විය. වාවාගත් දවසක් නිමා කළ ලීලසේන ස්ටෝරු කාමරයේ විටක් කොටන හඬ ඇසෙන්නට විය. ටොක් ටොක් යන හඬත් සමග සුදු මහත්තයාට නින්ද යාගෙන ආවේ ය. දවසක මෙහෙම නිදාගෙන සිටින විට කුකුළු රුව ඇති පිත්තල පහන බිම වැටී රෝල් වී යන බියකරු හඬින් හිටි හැටියේම අවදි වූයේය. එදා රෑ ඒ හඬ නැවත ඔහු වෙළාගනිමින් තිබිණ. නිනව්වක් නැතුව නිමාවක් නැතුව ටොක් ටොක් ගා ලීලසේන විට කොටන්නට පටන්ගෙන තිබිණ. හරියට කුණුහරුපයෙන් බණිනවා මෙන් ටොක් ටොක් ගා පහර පිට පහර ගසමින් විට කොටන හඬ පාළු අඳුරු වලව්වේ කාමරයෙන් කාමරයට පැතිර යමින් තිබිණ. මධ්‍යම රාත්‍රියේ එඩ්නා හාමු නිදාගෙන සිටි කාමරයේ දොරටද තට්ටු කර බැලුවේ මූණේ පැත්තක් පිච්චුණු යුවතියක් කාමරයෙන් කාමරයට පැනපැන යන විලසිනි. සුදු මහත්තයා උදේ අවදි වෙන විට රෑ වැටුණු වැස්සට ඇඳ ළඟ තෙමී තිබෙනු දුටුවේ ය. යාංතමට පෑගී නොපෑගී මෙන් ඔහු කාමරයෙන් එළියට පැනගත්තේ ය. නන්දාවතී උදේ පාන්දරම ඇවිත් තිබෙනවා මැද මිදුල හරහා කුස්සියට යන විට සුදු මහත්තයාට දැක ගත හැකි විය. එඩ්නා හාමු නිකටේ අතක් රදවාගෙන සිටින අයුරින්ම ඔවුන් කතා කරකර සිටියේ ශෝක ජනක පුවතක් බව ප්‍රත්‍යක්‍ෂ කර ගත් සුදු මහත්තයා ආපසු හැරී කුරුබිලියෙන් මිදුලට බැස පොල් මණ්ඩියට ගැටුවේ ය. පොල් ගහෙන් ගහට වහං වෙවී කිසිවකු දුවදුව යනවා දැක දැස් නළලේ රැඳි සුදු මහත්තයා ලීලසේනට කතා කළත් කට හඬ පිට නොවුණු බව ඔහුටම අවබෝධ වී තිබියදී ඒ පසු පස යන ගමන අතර මග නවතා දමා ආපසු ගෙට ගොඩ වූයේ අඳුකොළ දුටු නයෙකු ලෙසිනි. ඒ අස්වාභාවික කලබලයෙන් කලබලයට පත් වුණු එඩ්නා හාමු වහ වහා නන්දාවතී පිටත් කර හැරියේ රහසක් සඟවන්නට උත්සහා කරන ගැහැනියක මෙනි. ආපසු යන ගමනුත් නන්දාවතී ආපසු හැරිහැරී බැලුවා ය. සියඹලා ගසේ අත්තක වසා සිටි උලමෙකු හඬලන්නට පටන්ගත්තේ ඉන් පසුවය. කැරකොප්පුව දෙසින් හමා ආ සුළඟක් ඇරුණු ජනෙල් පත් දඩස් ගා බිත්තියේ වද්දමින් හමා ගියේ සිත බියට පත් කරමිනි. "දැන් ඉතිං නස්පැත්තිය පටන්ගත්තා" යි එඩ්නා හාමුට ඉබේටම මෙන් කියවුණි. පුංචිහාමිගේ උගුරේ යමක් හිරවෙමින් තිබෙනු මෙන් දැනෙන්නට විය. "නන්දාවතී කියනවා මැරිලා නැතිලු" යි එඩ්නා රහසෙන් මෙන් පුංචිහාමිට කියන හඬ ආපසු හැරී සිටි සුදු මහත්තයාගේ කන් අඩි පසාරු කරගෙන ගියේය. ඔහු වාරු නැතුව මෙන් කනප්පුව හා කළුවර පුටු සැටිය අල්ලගෙන අල්ලගෙන කාමරයට ගිහිං ඇඳේ හාන්සි වුණේය. පපුව හා බෙල්ල දිගේ දාඩිය බේරෙමින් තිබිණ. බෙල්ල දිගේ දාඩිය එක දිගට ගලාගෙන යන විට අතගා බැලුවේ තොණ්ඩුවක් බෙල්ලට වැටී ඇතැයි දැනුණු හෙයිනි. "අද තේ එක බීලත් නැහැ" යි එඩ්නා කියන විට වේලාව එකොළහමාරත් වී තිබුණි. ඔරලෝසුව දෙස බැලූ සුදු මහත්තයාට ඔරලෝසු කටුද ඉංජෙක්ෂන් කටු දැතට ගෙන එන හෙදියක් මෙන් පෙනෙන්නට විය. ඇඟ හීතල වීගෙන එනවා මෙන් දැනෙන්නට

විය. කැරකොප්පුව පැත්තෙන් හමාගෙන ආ සුළඟ ඔහුගේ ඇඟ සීත ලෙස වෙළමින් හුස්ම හිර කරමින් තිබිණ. එදා දවසේ ඔහු බීවේ කෝපි උගුරක් පමණි. බඩේ අජීර්ණයක් බව පැවසුවත් එඩ්නා හාමු බියෙන් බියට පත්ව සිටියේ බිහිසුණු විනාශයක පෙර නිමිති දැනගෙන මෙනි. "අපි හෙට කන්දෙ දේවාලෙට යනවා." සේතං අපි යැයි කීවේ මාර්ටින් ද ඇතුළත්ව බව එඩ්නා දනී. "ඒ මොකටද" අසන්නට නොගිය එඩ්නා හාමු ගේට්ටුවත් වහගෙන වලව්වට ඇතුළු වුණේ ගස් යට වැටී තිබුණු පොල් ගෙඩි දෙසවත් නොබලාය. වෙනදාට ඇගේ ඇස් වලට වහං වී පොල් ගෙඩි වලට පැවතිය නොහැකි විය. ලීලසේන පොල් අහුලාගන්නට පෝර උර අරගෙන එන විට එඩ්නා හාමු ඇලඩින්ගේ පුදුම පහනත් අරගෙන අන්තර්දහන් වී යනවා දුටුවේ ය. තුත්තිරි කඩමින් සිටි පුංචිහාමි එඩ්නා හාමුටද යක්ෂයා ආවේස වී ඇති බව අවබෝධ කරගැනීමට ටික වේලාවක් ඈ දෙස බලා සිටින්නට විය. පහළ කම්බි වැටෙන් රිංගා නන්දාවතී "රිපෝට් ඇවිල්ලා" යි කියා එඩ්නා හාමු බියෙන් තෙල් තාච්චියට වට්ටා යන්න ගියා ය. තිගැස්මෙන් තැති ගැන්මට පත් වුණු ඇයද එදා දවස කෝපි කෝප්පයකින් දවස ගෙවා දැම්මා ය. ඉන් පසු හෝරා දෙක තුනක් ගෙවී යන විට වියරු වැටුණු මී මැස්සෝ ගුමු ගුමු ගා වත්ත පුරා බෙරිහන් දෙන්නට පටන්ගත්හ. ගිනි ඇවිලුණු බඹරවද වත්ත පහළ තැන් තැන්වල ඇවිලෙමින් තිබිණ. මධ්‍යම රාත්‍රිය වෙන විට හැම රැයකම පොල් වත්ත කෙළවරේ අත්හැර දැමූ ළිඳෙන් කිසිවකු නාන හඬ ඇසෙන්නට විය. ඉන් පසු බිළිඳෙකු කෑ ගසා හඬන හඬද ඇසෙන්නට විය. "අන්න ළමයා හම්බ වෙලා" ලීලසේන කියන විට සුදු මහත්තයාගේ බෙල්ල හිර වී යන්නට විය. උමංදා කන්ද ගිනිගෙන දුම් දාන්නට පටන්ගෙන තිබිණ. කන්දේ සැඟව සිටි යක්ෂණියක් කෙහෙවලු කඩාගෙන එහෙ මෙහෙ දුව යනවලු. අඳුරු සෙවණැලි අතර වවුලෝ තට් හඬ නංවමින් තටු සලමින් ඉගිල යති. කෙමෙන් කෙමෙන් ජීවිතයේ අවසන් භාගය පැමිණ ඇතුවාක් මෙනි. ලෙඩ ඇඳට වැටුණු සුදු මහත්තයා වත්ත පහළ ඇවිදින්නවත් ගියේ නැත. දිනක් කළුවර වැටීගෙන එන යාමයේ සමන්මලීගේ අම්මා "මේ කළ අපරාධයට පඩිසන් දෙනවා. මොන අපරාධයක් ද මේ කළේ " යි මොර දිදී වලව්ව ඉස්සරහා පාර දිගේ බෙරිහන් දිදී ගියා ය. ඇය හැසිරුණේ පිස්සු වැටුණු පිස්සියක ලෙස ය. මද දුරක් ගිහිං ආපසු හැරී ඇවිත් නැවත ආඩපාලි කියමින් යන්න ගියා ය. ලීලසේන ගේට්ටුව පැත්තට යන්න හදනවා දැක එඩ්නා හාමු එය වැලැක්කුවා ය. සුදු මහත්තයාගේ කන් අඩි පුපුරු ගහමින් තිබේ. බඹර වදයක් කන් අඩි දෙකේ බැඳ ඇතුවා මෙන් දැනෙන්නට වෙයි. පැණි බේරෙනවා මෙන් ඕජස් කන් දෙකෙන් ගලන්නට වෙයි. ඔහුගේ තත්ත්වය බරපතළ බව වෛද්‍යවරුන් කියා තිබිණ. දියර පමණක් ආහාරයට ගත් ඔහු මළ මූත්‍ර පවා සිදු කළේ ඇඳේ සිටය. ලීලසේන ඔහු වෙනුවෙනම ඇරී සිටියේය. එහෙත් කලට වේලාවට සාත්තු සප්පායම් ඔහුගේ අතින්ද සිදු නොවුණි. දවස් දෙකක්ම මාර්ටින් පැමිණ අඬා දොඩා ගිහින් තිබිණ. ඔහු සමන්මලීගේ මරණය ගැන මහත් වේදනාවෙන් කතා කරනවා දක්නට ලැබිණ. කතා කරන වචනයක්

පාසා "සුදු මහත්තයෝ." යි කියමින් බිම වාඩි වී අඬන්නට වුණේය. "හා දැන් ඇති. ගෙදර පලයං මාර්ටින්" යි එඩ්නා හාමු ද කීවේ දුක්බර ස්වරයකිනි. "හා හොඳයි" කියමින් මාර්ටින් ගියේ "මගේ කෙල්ල" යි අඬමින්ය. "කටේ මොනවාහරි ගාගත්තම උගේ කටට පණ එනවා" යි ලීලසේන කියනවා ගෙට යමින් සිටි එඩ්නා හාමුට ඇසුණා නං ඇය ලීලසේනට බැන පන්නා ගන්නවා ඇති. ඇඳට ඔත්පළ වී හිටියත් සුදු මහත්තයාට හොඳ හැටි සිහිය තිබේ. මාර්ටින්ට කතා කර තමන් ළඟට එන ලෙස කීමට වුවමනා වුවත් සුදු මහත්තයාගේ හඬ එළියට පිට නොවේ. ගරා වැටෙමින් තිබුණ වලව්වේ එක් බිත්තියක් කොරපොතු හලමින් ඉරිතලා තිබිණ. ඇල වී තිබුණ කුස්සියේ බිත්තියකට මුක්කුවක් ගසා තිබුණේ මීට අවුරුදු තුනකට ඉහතදීය. ඉස්තෝප්පුවට ඇතුළු වෙන පඩිපෙළ දෙපැත්තෙන් හිටගෙන හිටි පතාක කුලුනු දෙක පතුරු ගැලවී මාන්දම් දරුවන් දෙදෙනෙකු සේ හොටු නාවර පෙරාගෙන වැලපෙමින් සිටී. ගෙට අඩිය තියන විට පයට පෑගෙන්නේ සෙමෙන්ති පතුරුය. පයේ වැදී ඒවා විසි වී යයි. පුස් ගඳ ගෙයි හැම තැනින්ම දිව දික් කරමින් දෂ්ට කරන්නට මෙන් කුරුමානං අල්ලමින් සිටි. ගිය පෝයටත් සිල් සමාදන් වීමට නොහැකිවීම ගැන පශ්චාත්තාපයෙන් සිටි එඩ්නා හාමු සුදු රෙදිම දැන් අඳින්නට පටන්ගෙන තිබේ. ඊයේ ඇය කහ දියරෙන් මුළු ගේම හේදෙව්වා ය. දැන් දැන් වියරුවෙන් මෙන් යක්ෂණියක් රෑ දෙගොඩ හරි යාමයේ ගේ හැමතැනම ඇවිදිනවා එඩ්නා හාමුට දැනෙන්නට වී තිබේ. සමන්මලීගේ තුන් මාසෙ දානෙට දවස් හතක් තිබියදී යසරත්නගේ පුතාව අත්අඩංගුවට ගෙන තිබිණ. එය කන වැකුණු සුදු මහත්තයා ඇඳේ සිට එහෙට මෙහෙට දඟලමින් නැගිටින්නට උත්සහා ගත්තත් එය ව්‍යර්ථ විය. නොසෙල්වීම සිටි නිසා ඔහුගේ පිටේ බත් කන පිඟානක තරම් තුවාලයක් හට ගෙන තිබිණ. විටෙන් විට ඔහුට වේදනාවක්ද සනීපයක්ද ගෙන දෙමින් ඔඩු දුවන පණුවෝ රැසක් තුවාලය කා දමමින් සිටිති. "මේ අසමජ්ජාති ශරීරය ඔහේ කුණු වෙද්දෙන් "යි කියන්නට මෙන් එහෙට මෙහෙට පෙරළා උණු වතුරෙන් තවන්නවත් සුදු මහත්තයා ලීලසේනට ඉඩ නොදුන්නේ ය. නින්ද යාගෙන එන විට දිනක් සුදු මහත්තයා යටි ගිරියෙන් කෑ ගසනවා එඩ්නා හාමුට ඇසෙන්නට විය. දනි පනියෙන් නැගිට ඇය සුදු මහත්තයාගේ කාමරයට යන විට ඔහු මළමිනියක් මෙන් නිදා සිටියේ ය. තවත් බියට පත් වුණු ඇය "සුදු මහත්තයෝ " යි කියා කෑ ගැසුවා ය. බියට පත් වුණු පොත් රාක්කයේ පරණ පුස්කොළ පොත් ලෑටි ගගා සිටි මීයෙක් බිත්තිය දිගේ දුවන්නට ගිහින් ලිස්සා සුදුමහත්තයාගේ බඩ උඩට වැටිණ. නිහඬ නිශ්චලබවින් පිරුණු පරිසරයේ කිසියම් අද්භූත හඬක් ඇසුණාදෝයි හිතමින් ඇඳ මෙට්ටයෙන් මදක් ඉස්සී ලීලසේන මදක් කන් දීගෙන සිටියේ ය. නමුත් නැවත හැලහොල්මනක් නොමැති හෙයින් රෑට කිසියම් අද්භූත බලවේගයක් වලව්වේ සැරිසරන බවට ඔහුද විශ්වාස කරන්නට පටන්ගත්තේ ය. "කෙල්ල එනවා" දිනක් මාර්ටින්ටද කියන්න ගිහින් මාර්ටින්ට ඇහුණේ නැති නිසාත් , ක්ෂණයකින් එය නොපැවසිය යුතු යැයි බුද්ධියක් පහළ වීම නිසාත් ඔහු කට පියාගෙන සිටියේ ය. දිනක් යසරත්න වලව්වට ඇවිත්

එඩ්නා හාමු හමුවී නොසැහෙන්න අඬා දොඩා ගිහින් තිබිණ. නිරපරාදේ තම පුතා මේ පලහිලව්වට පටලවා ඇති බවත් උඩ ඉන්න දෙවියන් මේවා බලා ගත යුතු බවත් ඔහු පවසන විට එඩ්නා හාමුගේ පපුවේ යමක් හිරවෙන්නට මෙන් විය. කිසිම දවසක වලව්වේ පස් පාගා නැති යසරත්න වලව්වටම ඇවිත් එසේ කියන විට එඩ්නා හාමුටද අමුත්තක් දැනෙමින් තිබිණ. පන්සලේ ගණ්ටාර සද්දේ දෙතුන් විටක්ම නාද වෙන්නට විය. "ඔය පට්ටපල් බොරු. සමන්මලීගේ සපත්තු මලක් වගේ කොණ්ඩ කට්ටක් ශාන්ත ළඟ තිබිලත් හම්බ වෙලා තියෙනවා" යි ලීලසේන කියන විට "උඹ කට වහගං" යි කියමින් එඩ්නා හාමු ලීලසේනව එතනින් පන්නා ගත්තාය. දැඩි වෙහෙසකර බවකින් අහස් කුස දෙදරා යමින් වැසි ඇද හැලෙන්නට අර අදිමින් තිබිණ. මූණ පුරා දැලි ගා ගාත් අහස කළු වලාකුළු දිය කර හරිමින් සුළං හමා යන්නට විය. හීන් පොද ඇද වැටෙන්නට විය. විදුලි කෙටුම් ගෙරවුම් සමඟම මහ වැස්ස කඩං වැටිණ. කොතරම් දැවැන්තයකු වුණත් වලව්ව පෙරළා අනිත් පැත්ත ගසන්නට මෙන් සුළි කුණාටු හමන්නට විය. ජරබරස් ගා එකපාරටම ඉස්සරහා කොස් ගහේ අත්තක් කඩං වැටිණ. පහළ පොල්වත්තට හෙණ ගහන්නාක් මෙන් ගිගුරුමක් පතිත විය. බියට පත් වුණු ඉස්සරහා ඉස්තෝප්පුවේ ගුළි වී සිටි කළුවා එකපාරටම දුවගෙන ගිහින් සුදු මහත්තයා නිදා සිටි ඇඳ යටට රිංගා ගත්තේය. ඇඳ යට සිට පැමිණි සර්පයා සුදු මහත්තයාගේ බෙල්ල හිරකර ගෙන පපුවෙන් ලේ උරා බොන්න පටන් ගත්තේය. අවසිහියෙන් මෙන් ඔහු වේදනාවේ උච්චතම නිමේෂය කරා එළඹෙමින් සිටියේය. සර්පයාගේ දපනයෙන් බේරීමට නොහැකි වෙන ලෙස ඔහුගේ බෙල්ල වටා සර්පයා දරණ ගහගෙන සිටියේ ය. ක්ෂණයකින් මහත් වෙර යොදා සර්පයා බෙල්ලෙන් ඇද දැමීමට උත්සහ කළත් එය ව්‍යර්ථ විය. ඇර තිබුණු කවුළු පියන් පත් අද්භූත ලෙස හැමූ සුළඟින් දඩස් ගා බිමට ගලවං වැටිණ. කළු පාට මෙරු පොළවෙන් මතු වෙන්නට විය. හිවල්ලු රංචුවක් හූ තබමින් වනය ඇතුළට රිංගා ගියහ. කජු ගහේ වසා සිටි කහ කුරුල්ලලෙක් සැණින් ඉගිල ගියේ තියුණු හඬක් නගමිනි. ගේට්ටු පළුවට කකුලක් තියා සුදු මහත්තයා පාරෙන් උඩහට පැන ගත්තේ ඒ ඇසිල්ලෙනි. පන්සල් කන්ද පැත්තට යන්න හැරුණත් කවුදෝ කෙනෙක් පහළ හෙලයේ සිට කකුලෙන් අදින්නට විය. අහවලාට වැරෙන් පා පහරක් දී සුදු මහත්තයා පන්සල් කන්ද පැත්තට පැන ගත්තේ ය.

ඒ අතර කළුවරේ සමන්මලීගේ සොහොන ළඟ කඳුළු පිසමින් කිසිවෙක් පහනක් දල්වමින් සිටියේ ය.

**-ඉන්දික තුෂාර ගමගේ-**

(නීති අංශය- දකුණු පළාත් කාර්යාලය)

## තෙවන ස්ථානය

# "නිකිණි වැහි... "

"කෙල්ලෙ ගෙට වෙයන්. මහ පොළොං පුසුඹක් එන්නැහේ. මහා පොළඟාත් එකයි පොළොං පැටියත් එකයි. කෑවොත් හෙම බෝම විසයි. ගොම්මං වෙලා එළි බහින්නේ බලාගෙන.." නිකින්ණේ කට්ට අවුවට හේබා ගිය ඈත වැකණ්ඩියේ තුරුගොම්මන දිහා බලාගෙන සෙදෝනා මුමුනන්නට වුණා. "මොන පොළොංගුද අම්මේ බකිනි ගහේ මල් පිපිලා ආන් අර වෑතාවලේ දිහාවෙන් ඔය පුහුඹ එන්නේ " සේපාලිකා කියන්නට වුණා. වැකණ්ඩිය උඩින් ගේ දිහා බලාගෙන බර අඩි තබමින් යන පුංචි ආරච්චිල දුටුවනම නැන්දම්මාගේ වාගාලාපය ගැන සේපාලිකාගේ සිතේ ඇති වූයේ කුකුසක්.

වැහි කාලයට ගෙයි දොරකඩ ලකයට පිපුණ මල් පිරුණ වතුසුද්ද ගහ හේබා වෙලා ගිහින්. හාර මහකින් පමණ වැහි බිඳුවක් තොල නොගෑ කාෂ්ටක පොළවත් එක්ක පරහටම වගේ අතරින් පතර පුංචි පුංචි මල් එක දෙක පිපුනු වතුසුදු ගහත් ගෙයි පැවති අගහිඟකම් මොනවට කියාපාන්නක් වගේ. වෙනදාට කිරි සුදු මල් පිළිවැස්සත් කඩාගෙන උදැහැනැක්කේම සෙදෝනා මිදුලේ පහන් පැල වෙත යනවා. "ඕන් බලහන් කෙල්ලෙ අබුද්දස්ස කාලෙට බුදුන්ට පූජා කර ගන්ඩ ගහක මලක් නොපිපෙන හැටි. පුතාලෑ අප්පච්චි ඕන් ඔය වතුසුදු පැංචි ඔතන ඉන්දන කොට මයෙ පිටි පතුලෙන් අඩියක් උඩට ඇති මහිතෙ. කොල්ලාගෙ වැදුම්ගෙයි කටයුතු අහවර වෙලා රෙදි නැන්දා වැදුම් ගෙන් එලියට ඇවිත් සාර සුබාවට බුලත් විටක් හෙම කාල චීස් ගාලා රතට රතේ බුලත් කෙළ පාරක් ගෙයි මිදුලට ඉහලා කොල්ලගෙ අප්පච්චිට කියෙව්වා "ඕන් සාපින් බොලාට පංකාදු සරමක් කියාලා. කොල්ලගෙ අප්පච්චීට ඉහේ මල් පිපුණහේ කොල්ලගෙ වේලාපත්කඩය හදාගන්න කියල වෙද මහත්තේලෑ අහ ගොහින් එන ගමනේ මේන් මේ වතු සුදු පැංචි ගෙනත් ඕන් ඔතන ඉන්දවව්ව. කොල්ලගෙ වයසත් හරි වතුසුදු පැංචිගෙ වයසත් හරි." සෙදෝනා අන්දෝ සංසාරයක් නැතිව කියවාන ගියා. "ඕන් බලාපන් එදා ඉඳන් අද වෙනකන් සාර සුබාවට කිරි සුදු පාට මල් පිපුන වතුසුදු පැංචි හේබා ගිහින් තියෙන හැටි" සේපාලිකාට නැන්දනියගේ මේ අතොරක් නැති වාගාලාප හුරු පුරුදුයි. මාමණ්ඩියගේ දිවි සැරිය නිමා වීමෙන් පසු නැන්දනියගේ සිහි කල්පනාවත් හරියට නිකිණි අක් වැහි ගානයි. එනවා..යනවා.. හොඳ සිහිකල්පනාවෙන් මේ දැන් දැනමුතුකම් දෙන ඈ ඊළඟ මොහොතේ කටකමසිරියාවක් නැතුව කියවන්නට ගන්නව. ඇගේ මේ හැසිරීම සේපාලිකාට දැන් ගනිච්චියක් නැහැ..

බක්මීදෙනිය ගම බතින් බුලතින් සරුසාරව, අටුකොටු පුරවා ගත්, නිරන්තර සිනහවෙන් මුව සරසා ගත් අල්පේච්ඡ ගැමි ගොවියන්ගෙන් පිරුණු සුන්දර ගම්මානයක්. පටපිළී තොරොම්බල් නැතුවාට සිය හිමියා සමග හරි හරියට පොළොව සමඟ පොර බැදූ ගැමි ගැහැනු නිරාමිස සුවයෙන් සිය ළමා ළපටින් හදා වඩාගනිමින් නිදහසේ ජීවත් වුණා. ගම වටකර යොදුන් ගානක් පුරාවට පැතිරුණු වන රක්ෂිතය සිදාදියෙන් පැමිණි උන්දලා විසින් කපා දමා විනාශ කරන්නට මත්තෙන් බක්මීදෙනිය ගම්මානයෙ ජීවිත සරලව සාමයෙන් ගෙවී ගියත් ජල පෝෂක ප්‍රදේශ කෙමෙන් කෙමෙන් විනාශ වන්නා හා ම රටේ අනෙකුත් ප්‍රදේශවලට මෙන්ම බක්මීදෙනියටත් එහි බලපෑම දැනෙන්නට වුණා. මිනිසුන්ගේ අකටයුතුකම් හා උරණ වූ වැස්ස වලාහක දෙවියන් එතෙක් මෙතෙක් නොවූ විරූ අරුම පුදුම අච්චැහි රටාවන් පෙන්වන්නට වුණා. බතින් බුලතින් සරුසාරව හේනෙන් කුඹුරෙන් බත සරි කරගත් ගම්මු බොහොමයකට සිය ජීවිකාව අහිමි වුණා. පිරී තිබූ අටුකොටු ටිකින් ටික සිඳීයන්නටත් දරුමල්ලන්ගේ අවශ්‍යතා සඳහා ගෙයි තිබූ වී බුසල දෙක අහල පහළට හොරෙන් විකුණා ගන්නටත් ගම්මු පෙලඹුණා. කිසිදාක වී විකුණා මුදල් ගන්ට නොපෙලඹුණු ගම්මු ඒ සැලකුයේ තමන්ට වූ මහත් නව නිංගිරාවක් ලෙසින්. එහෙත් බඩසයින් හැකිළුණු දරු පැටවුන්ගේ මුහුණුත් සිය දරු පවුලේ සියලු දුක්ගිනි උරාගත් නිවසේ කැණිමඩල වන් සිය බිරින්දෑවරුනගේ තෙතමනයක් නැති මලානික ඇසුත් කිසිදාක නොකළ දේවල් පවා කරන්නට ගම්මුන්ට බලකර සිටියා. ගමට පිටතින් එන මරක්කල මුදලාලිට සිය වී ටික විකිණීම සිය ආත්ම ගෞරවයට මහත් මදිකමකැයි සිතූ ගම්මු ඊට වඩා අඩු මිලට ගමේ ආරච්චි වලව්වට සිය වී විකුණන්නට යෙදුණා. "මරක්කලයා පිටගම්කාරයා. ආරච්චිල ගමේ මිනිහා. පිටින් ආපු මිථ්‍යාදෘෂ්ටිකයින්ට වී විකුණන්නෙ නැහැ අපි. හදිසියකට අතමාරුවක් ඉල්ල ගන්නවත් තියෙන්නේ ගමේ ආරච්චි වලව්ව විතරයි" මකුළුවා සිය දැල ටිකින් ටික පතුරවමින් පුංචි කෘමි සතුන් ඊට හසුකරගෙන යුෂ උරා බී හපකර සිය ජවය ලබා ගන්නා සේම ආරච්චිල පවුලද සිය ධනය හා බලපරාක්‍රමය ගම්මානය පුරා පතුරුවා හැරියේ අවිහිංසක ගම්මුන්ගේ පෙර කී අසරණ හා අවිහිංසක සිතුවිලි ප්‍රයෝජනයට ගනිමින්.

"අද නම් වැහි රැල්ලක් යයි වගේ මයෙ හිතේ අම්මේ. හනිකට රෙදි ටික ගෙට ගත්තා නම්" සේපාලිකා සෙදෝනාට කිව්වේ ඈතින් කළු වලාවක සේයාවක් දුටු හෙයිනි. "මොන වැහිද කෙල්ලෙ ආකහේ බොරු කොරනවා උදේ පාන්දර ගල්කිරියාකන්ද මුදුනෙන් මහා දුමාරයක් වගේ පිනි බාපු අපූරුව. එහෙව් පින්නක් ගහන්නේ තව තවත් පායන්නමයි කෙල්ලෙ." සෙදෝනාගේ වචන සේපාලිකාගේ බලාපොරොත්තු සුන් කළා. "තවත් මහකටවත් කලියෙන් වැස්ස නාවොත් මෙදා පාරනම් නම් ණයට කඩෙන් හාල් කන්ටමයි වෙන්නෙ අපේ

අම්මා. අරයා කියන හැටියට ගොයමම හේබාල ගිහින් බොහොම නිස්සාරෙට කිරිවැදී ගෙන එන අයුරක්ලු පේන්නේ. මෙදාපාර පොහොර සහනාධාරත් නොලැබුණු එකේ ආරච්චි වලව්වෙන් ගත්ත ණය තුරුස් පියෙව්වහම ඉතුරු කන්නේ කන්ඩවත් වියැට ගෙඩියක් ඉතුරු පහදු වෙන එකක් නෑ. කෙල්ලගෙ ඉස්කෝලේ ඇඳුනුත් කහ ගැහිලා බොහෝම අබලන් තත්තෙන් තියෙන්නේ. කැන්වස් සපත්තු ජෝඩුව පිටි පතුලෙන් ඉරිලා ගිහින්.." සේපාලිකා කියෝගෙන ගියා. "අනේ ඔය හිච්චි උන්ටත් විච්චුරන පුරුදු කරන්ට එපා බං. අපි ඉස්කෝලෙ යද්දින් රබර් කෑලි දෙකක්වත් නැතුව එරමිණියා කැලේ මැද්දෙන් උදේට හවහට ගාටනවා. ඒ ඇවිදිල්ලට පින් සිද්ධ වෙන්ට ඔන්න අපේ අත පය ඉබි මස් කාපුවහේ හයියයි. පුළුන් බෝල වගේ උන් තනන්ට එපා. උන්ටත් දුක් විඳින්ට හුරු කරපන්." නැන්දනියගේ මේ වචන සේපාලිකාගේ හිතට ගෙනාවේ නොපහන් හැඟීමක්. "ආයෙ මහ හුඟක් ඉන්නවා කියලයි දෙකානෙ..ඔය හැටිම දුක් දෙන්ට උන් තාම හීන් වැඩී." සේපාලිකා කුටු කුටු ගාමින් එතනින් නික්මුනේ නැන්දණිය හා කතාව තවත් දික්ගස්සවා ගන්නට අකමැති නිසා.

ගෙයි දොරකඩ ගොරොක් ගහෙන් අහුලාගත් රක්ත වර්ණ ගොරොක් ගෙඩියේ මදය සූප්පු කරමින් ලෙල්ල විසිකරන සිය දියණිය දෙසට සේපාලිකා ගියේ තරවටු බැල්මක් හෙලමින්. "හදාගනින් බඩේ ගායක්. ඔය හැටිම ගොරොක් ගෙඩි කාලා. ඒ මදිවට වවුලෙක් වගේ ගොරොක් මද ටික උරා බීලා ලෙල්ල විසි කරන්න එපා කෙල්ලෙ. පිළිවැස්සකට එකතු කොරාපන්. සේන මාමා අතේ ඉරිදා පොළට යවල කීයක් හරි හොයාගත හැකි නෙව." සිරිමල්ගේ ගොවිතැන් බතට මහත්වූ සහාය දෙන්නී සේපාලිකා, ඉන් නොනැවතී ගෙදර වැඩ කටයුතු සඳහා කීයක් හෝ හරි හම්බ කර ගන්නට හැකි සෑම දෙයක්ම කළා. ගොරොක් ගහේ ගෙඩි හට ගන්නා කාලයට ඒවාත්, වත්ත පහල පෝච්චි දෙහි ගස්වල කහ පාටට බරවූ ගෙඩිත් එකතුකර පොළට යන අයකු අතේ යවා අමතර ආදායමක් උපයා ගැනීමට ඇ පුරුදුව සිටියා. එපමණක් නොව වැව් මායිමේ තුන්හිරියා පන් ගාලෙන් පන් මිටියක් කපා ගෙන එන ඇ රටා තියමින් වියූ පැදුරු හා වට්ටිද විකිණීමෙන් සුළු මුදලක් උපයාගත්තා. සිය බිරිය ගැන සිරිමල්ගේ සිතේ වූයේ මහත් සර්ධාවක් මුසුවූ ආදරයක්. සිය ලේලියට හා පුතණුවන්ට සහාය වනු පිණිස සෙදෝනා විසින් පවත්වාගෙන යන්නට යෙදෙන කුකුළු කූඩුව ගැන නම් සේපාලිකාගේ සිතේ එතරම් කැමැත්තක් නැත්තේ නිතරම ගේ පිලට එන කුකුළු කිකිළියන් සැමවිටම දියාරු කුකුළු වසුරු ගේ හැම තැනම දමා යෑම නිසා. සීතල කුකුළු වසුරු සිය දෙපයට පෑගෙන සෑම මොහොතකම "මේ කාලකණ්ණි සත්තු ටික නම් පුදුම කරදරයක් වුණා නෙව. ගෙම්දුල් හැම අහු අස්සෙම බෙටි ගහලා. අපුලෙ බෑ" මුව ඇද කරමින් පවසන සේපාලිකාගෙ කතාව මගහැර සිරිමල් පිටව යන්නේ සිය මව පණමෙන් රකින රතු කිකිළිය

හා පැටවුන් ගැන විරුද්ධත්වයක් ඔහුට නොපෑ හැකි හෙයින්. "කෝ මයෙ රතු කිකිළියෙ මෙහෙ වරෙන් ..මොකෝ කෙල්ලෙ උඹ අද බිත්තර දැම්මෙ නැත්තෙ" කිකිළිය සිය ඔඩොක්කුවට ගෙන ඇගේ පෙඳ පත් පිරිමදිමින් ආදරය පාන සිය මව ගැන සිරිමල්ට වූයේ අනුකම්පාවක් මුසු හැඟීමක්. බිත්තර රක්කවා ලබාගත් කහ පාට සුදුපාට පුළුන් බෝල වැනි පැටවුන් හය හත් දෙනෙකු කිකිළිය වටා දුවමින් පහුරුගාමින් පහුගිය දිනවල සිටියත් මේ වන විට ඉතුරු වී සිටිනුයේ දෙදෙනෙකු පමණයි. ලේ සුවඳට පුරුදු වූ මහ මුගටියා හැමදාම සෙදෝනා ඇහිපිය ගහන සැණින් පැටවුන් එකා දෙන්නා බැගින් කැලයට ඇදගෙන ගොස් තිබුණා.

ඇතින් රාස්සිගේ අව්ව වැටීගෙන එන වෙලාවට වැකන්ද දිහායින් හමා ගෙන ආවේ මහා වියලි දූවිලි මිශ්‍ර හුළඟක්. වෙනදාට වැව් ඉස්මත්ත පිසගෙන හමා එන සීතල සුළං රැළි යළි කවදා නම් තම ගත දැවටේදැයි කල්පනා කරමින් සිටි සේපාලිකා කහම කහ පාටට ඉදී වැටුණු කොහොඹ ගෙඩියක රස බලමින් ඉණි වැට දිහාවට ගියා. කොහොඹ කොළ කොයිතරම් තිත්ත උනත් කොහොඹ ගෙඩියේ ඇත්තේ අමුතුම මිහිරි පැණි රසක්. කොහොඹ ගසත් සිය ජීවිතය වගේ යැයි සේපාලිකාට සිතුනා..

සුදු පාට වැලි මිදුලේ කෙළවර වකුටු වී නිදන වයිටාගේ ශරීරය කෘෂ වී ඇටකටු පෑදී ගෙන එමින් තිබුණ. "වයිටාට කටුව කාල කෙල්ලෙ. හොඳ මිරිස් හොද්දක් හදලා තුවාලවලට වක් කළා නම් ඕක ඉක්මනින් හොඳ වෙනවා. අනිච්චේ දුක්ඛෙ සංසාරේ මේ තිරිසන් ආත්මෙන් මිදිලා උඹත් හොඳ ආත්මෙකට යන්න ඕනෙ වයිටො." තවත් මොන මොනවදෝ කියමින් පිල දිහාවට ඇදෙන නැන්දණිය ගැන සේපාලිකාට දැනුණේ අනුකම්පාවක්. අප්පච්චි නැති උනත් හරි අම්මාට නුහුගුණේ. ඈ තනිවම සිතුවා. හෙන්දිරික්කා මල් සුවඳ පිස එන සුළඟේ සුවය නැහැ පුඩු පුරා විඳ ගනිමින් ඈ ඉනි වැට ළඟට යන විටම සිරිමල් උදැල්ලක් කර තියාගෙනම වනාත දිහායින් එනු පෙනුනා.

"සුද්දියෙ මෙදා පාරනම් මැස්සෝ බීවේ නැතත් නෙලන්න ගොයමක් ඉතුරු වෙන්නේ නෑ මේ සායට පැවිල්ල ගැහුවොත් නම්. ගොයම් ටික හේබාල ගිහින් යායම කහ ගැහිල පපුව ඉහිලුම් නෑ. තව දෙදොහක් යන්නට කලියෙන් වැස්ස නාවොත් කරපු හරුබස්සම ගඟට ඉනි කැපුවා වගේ වෙනවා. ආරච්චිලට අඳය ගෙව්වම ඉතුරු ටික ලෙව කන්නත් මදි වෙනවා වෙනවාමයි." දවස පුරා වෙහෙස මහන්සි වී පැමිණි සිය හිමියාගේ දුක්ගැනවිල්ල සේපාලිකාගේ සිත තවත් දුකට පත් කළා. "දෙවියො අපිට අහක බලන එකක් නෑ කිරිවදින්න කලියෙන් වැහි රැල්ලක් යාවි. වතුර ටිකක් ඇඟට වක්කරගෙන එන්ට එහෙනම්. මන් බෙලිමල් මුට්ටියක් ලිප තිබ්බා" සේපාලිකා සුපුරුදු සෙනෙහසින් පෙරගමන් කළා..

කාලගුණ විපර්යාස හා සමග කුඹුරු හේන් ආලාපාළු වී බොහෝ නිසරු වී තිබූ මේ වංගියේ සියලුම ගොවීන් පසුවූයේ දිවි ගැට ගසාගැනීමේ දැඩි ප්‍රයත්නයක. ගොවිකම සිය ජීවිකාව කරගත් ගමේ බොහෝ දෙනෙකුට තෙල් පොහොර සඳහා ණය ලබාදී තිබුනේ ආරච්චි වලව්වෙන්. කන්නය පුරාවට ගොවියන්ගේ දුක් කඳුළුවලින් කිරිවැද පැහුණ අස්වැන්නේ සාරවත්ම කොටස ආරච්චිල විසින් රැගෙන ගිය පසු බොල් දහයියා පිරුණු ඉතුරු කොටස ගම්මුන් සිය ගෙදරට ඇදගත්තා. ධනය හා බල පරාක්‍රමයේ ඒකාධිපතිත්වය ඉසිලූ ආරච්චිල ගමේ බොහොමයක් ගොවීන්ගේ කුඹුරුවල අඳ අයිතියට හිමිකම් කියූවෙක්. ගොයම් කපන කාලයේදී කුඹුරටම ගොස් ලබාගත් ණය තුරුස් සහ අඳ අයිතියට අදාළ කොටස තමා විසින්ම කිරා මැන වලව්වට ගෙන ඒම ඔහුගේ සිරිතක්. කන්නය පුරා දහදුක් විඳ නෙලාගත් අස්වැන්නෙන් තුනෙන් දෙකක්ම ආරච්චි විසින් රැගෙන ගියත් ඒ වෙනුවෙන් හඬ නගන්නට කිසිවෙකුත් ඉදිරිපත් නොවුණේ ඊළඟ කන්නයේත් අතමාරු පතා ආරච්චි වලව්වට යන්නට වෙන බව සක්සුදක් සේ දත් හෙයින්. "මේවයෙ බොල් තියෙනව කියල වී ගෝනි වලට පයින් ඇන්න. මෙච්චා දෙයියො බුදුන්ට ඔප්පු කරන අලුත් හාල් " ගමේ තලතුනා ගැමියෙක් ආරච්චිලට ආඩපාලි කිව්වේ එලෙසින්.

"ඈ බං සුද්දියෙ කෙල්ලගේ ඔළුවට තඩි බෝවෙලා. කොහොඹ කොළ ඩිංගිත්තක්වත් කොටල මේකිගෙ ඉහේ උලාපන්. දැන් පැය ගානක් ලේඩි හූරල මගෙ අතත් රිදෙනව. බලාපන් මේකිගෙ කොන්ඩෙත් හැටි පිදුරු ගස් වාගේ කරුකුට්ටන් වෙලා. උඹලට ඉතින් ඒවයෙ වගක් නෑ නෙව. අපෙ අප්පේ ඒ කාලෙ අපෙ අම්ම රන් තැඹිලි තෙල් හිඳලා ඔන්න තෙල් සුවඳ ගගහ හිඳීගෙන එන වෙලාවට රතු ලූනු ඩිංගිත්තක්, ගොටුකොළ මිටක්, කීකිරිදිය මුල් ටිකක්, කරපිංචා ඉති දෙක තුනක් ඒකටම දාලා පාස්සලා ගන්නව. ඒකෙ සුවඳට ආයෙ ඉතින් කන්න හිතෙනවා බොල. කොහොඹ ලී පනාවෙන් ටික ටික පීරන ගමන් ඔය කියන බෙහෙත් ඖෂධ හොඳහැටි ගාලා සනීපෙට ඔළුගෙඩිය අල්ලනවා. ඔන්න ඒ කාලේ මයෙ කේශ කලාපෙ කිතුල් රැන වගෙ පිටිපතුල් ගාවටම තිබුනා. උඹලට මේවයෙ වගක් නෑ. සංසාරේ උඹලයෙ කෙරුවාවල් මන් දන්නෙ නෑ" නැන්දණියගේ මේ මැසිවිලි මුල් කාලීනව සේපාලිකාට වේදනාවක් හා කේන්තියක් ගෙන ආවත් දැන් ඈට ඒවායේ වගේ වගක් නැහැ.

නිකිණි මහේ ඉඩෝරයට හේබා වී ගිය ගස්වල වියළි අතු රිකිලි වැහිපොදක උණුසුම ලබනු රිසියෙන් ඉහළට එසවී තිබුණේ දෙවියන් යදින යාතිකාවන් පරිද්දෙන්. හමා එන උණුසුම් සුළං ධාරාවන් සමග පාවී එන වේලී කරවුණු ගස්වල කොළ මිදුල පුරා එහෙ මෙහෙ විසිවී තිබුණා. ඉඳහිට ගෙමිදුලේ බෙරිහන් දෙන දෙමලිති රැන හැරුණු කොට වෙනදාට මල් පැණි බොන්නට එන පැණි කුරුල්ලන්, චූටික්කන් ,පනික්කියන්, ගිරා මලිත්තන් කිසිවෙකුත් දැන් නැහැ.

"සුද්දියේ පෝය පහුවුණාම එන බ්‍රහස්පතින්දාවේ කැපුමට ආරාධනා කරන්නයි මගෙ හිතේ. ජයතුලගෙ කුඹුර සඳුදාවෙන් කපන්න පටන් ගන්නවා. ඒ වෙද්දි ඉවරවෙලා නිසා කයියට දහ දොළොස් දෙනෙකුට ආරාධනා කරත හැකි. කොයිකටත් දහ පාළොස් දෙනෙකුටම ඇඹුල ඒදන්න වෙයි." සිරිමල් කුඹුක් ගහ ළිඳ ගාවින් උදැල්ලේ මඩ සෝදා සිය දෙපා කකුලක් පිට කකුලක් තබා අතුල්ලන ගමන් සේපාලිකාට කිව්වා." එහෙනම් ඉතින් කෙල්ලෙ පොලොස් ඇඹුලක් උයාලා තිබ්බටු මැල්ලුමයි වැව් කරවල තෙල්දාලා කිරි හොද්දක් හැදුවනම් හරි නෙව .වෙනදා නං ඉතිං ඉදලෝලූ මාලුවක් වරදිනවාද කයියකට. අනේ ඉතිං අකුණු ගහලා වහින්න එපාය ඉදලෝලු පිපෙන්න" සෙදෝනා කම්මුලේ අත තියාගෙන කියෙව්වා. පිල මත ඇන තියාගත් සිරිමල් ඈත වනාත දෙස බලාගෙන ගැඹුරු කල්පනාවක නිරත වනු දුටු සේපාලිකා ඒ දෙසට සේන්දු වූයේ සිය හිමියාගෙන් යමක් දැන ගන්නා අටියෙන්. "වැස්සත් හරියට නොලැබුණු එකේ මෙදා කන්නේ බොහෝම ආල පාළුයි සුද්දියෙ. පුංචි ආරච්චිල ඔන්න අදත් එහා දෙණියෙ පාවරේට ඇවිත් හරුබස්සම ඇරගෙන ගියාලු. අපට වෙන්නේ වෙන්නෙත් ඒ සංගදියම තමයි." සිරිමල් කියෙව්වෙ හිතේ විස්සෝපයෙන්.

තෙරුවන් ගුණ සිහිපත් කර නමෝ විත්තියෙන් දෑ කැත්තට වැඳ නෙළුමට වන් සිරිමල් ඇතුළු ගම්මු ඉඹුල් ගෙඩියෙනුත් බෙලිමල් සමඟ කිතුල් හකුරෙනුත් තේ වේලාව නිමා කළ අතර දිවා ආහාරය සඳහා වැඩ නතර කළ පිරිසට සේපාලිකා ලහි ලහියේ ඇඹුල බෙදන්නට වුණා. "පදමට තෙල් පෑදිච්චි සුද්දිගෙ පොලොස් ඇඹුල කන්න ඉතින් කයියක් තියෙන්නම ඕන. අම්මප අපේ මහගෙලාටවත් බෑ සුද්දියෙ උඹේ පොලොස් ඇඹුලට ගහන්න.." මල්දෙණිය මාමා සුද්දිගේ අත්ගුණය පාරට්ටු කරන්නට වුණා. කොයි කවුරුත් ඇඹුල රස විඳින්නට සූදානම් වෙන්නාහාම යායේ හක්කලන් කරන පුංචි ආරච්චිල ඒ දෙසට එනු දුටු සිරිමල් "සුද්දියෙ කෙසෙල් කොලයක් වට්ටියකට දාල ගත්තා නම් අපේ පුංචි ආරච්චිල මහත්තයාටත්" යි පවසා "ආරච්චි මහත්තයෝ අපෙනුත් ඇඹුල ඩිංගිත්තක් කමු" යි පුංචි ආරච්චිලට ගරු සරු ඇතිව ආරාධනා කළා. "කෝ ගනින්කො බලන්න හෙනම් සේපාලිකාගෙ ඉවුම්පිහුම් වල රස බලන්නත් එක්කල" පුංචි ආරච්චිල කෝන්ගහ යට ගල් තලාවකින් ඇන තියා ගත්තේ සේපාලිකා දෙස නුරා බැල්මක් හෙලමින්. කිටිකිටියේ ඉණ වටා ඇඳි මල් චීත්තයෙන් වට පුළුලුකුලත් කර පළල් හැට්ටයෙන් එලියට පනින්නට පොදිකන කිරි සුදු හංසයින් වන් පිරිපුන් ළය මඩලත්, පිට මැදින් ඉණෙන් පහළට ගොතා හළ දිගු වරලසත් රන් තියඹරාවක පැහැ ගත් සේපාලිකාගේ සඳවන් වටකුරු මුහුණත් දුටු පුංචි ආරංචිල ඇඹුලට වඩා රස කර සේපාලිකාව සිතින් බුදින්නට වුණා.

"කෙල්ලෙ ඔය මුං මැල්ලුමෙන් ඩිංගක් බෙදාපන් ආරච්චිල මහත්තයාට." මල්දෙණියෙ මාමගෙ ඇරයුමෙන් ඒ දෙසට නැමුණු සේපාලිකා පුංචි ආරච්චිලගේ ගිජු දෙනෙත් සිය පපුව මතට වැටී දිලිසෙනු දැක වහා කෙලින් වී අනික් අතට හැරුණා.

බතින් බුලතින් සංග්‍රහ ලැබූ ගැමියෝ නැවතත් නෙළුම පටන්ගන්නට යුහුසුළු වුණා. ඉපනැලි යායට උඩින් රාස්සිගේ අව්ව වැටීගෙන එන වෙලාවට පාවරේ මනින්නට පැමිණි පුංචි ආරච්චිල සිය ණය පොතත් සමග සසඳමින් වහ වහා වී මැනගෙන යන්නට පටන්ගත්තා. බලාපොරොත්තු සුන් වූ දෑසින් ඒ දෙස බලා සිටින ගැමියන්ට ඊට විරුද්ධ වන්නට හැකියාවක් වූයේ නැහැ.. "ජේම්ස් ඔන්න ඔය වී මල්ල ආපහු බාපන්.. සිරිමල්ලාටත් බොහොම අගහිග ඇති නෙව. ඉතුරු ණය තුරුස් ඊළඟ කන්නේ හිලව් කරගන්න බැරිවයැ. උඹලගේ ඔය ලියදු කැල්ලයි ඕවිටි කැල්ලයි බොහෝම සරුසාර කැල්ලක්. අර සුගතං ගොයියෙ මේ කැල්ලම අදේට ඉල්ලන් නාහෙන් අඬනවා. මං ඉතිං නොදී ඉන්නේ උඹලා අප්පච්චිගෙ කාලේ ඉඳලම මේකට නැහුණු වග දන්න හින්දා." පුංචි ආරච්චිල සිය අතවැසියා හෝ ජේම්ස්ට කරත්තයට දැමූ වී ගෝනියක් නැවත බාන්නට අණ කරමින් කිව්වා. බයාදු සිනහවකින් පුංචි ආරච්චිලගේ මහත්මා ගුණය පිළිබඳව ප්‍රශංසනාත්මකව බැලූ සිරිමල් දැක සේපාලිකා නුරුස්නාවෙන් අහක බලාගත්තේ ඇගේ ගැහැනු ඉවට ඉන් එහා යමක සේයාවක් දැනුණු නිසාවෙන්.

"පුංචි ආරච්චිල හොඳ මිනිහා කරත්තෙට දාපු වී ගෝනියක්ම ආයෙම බෑවා. ජේම්සා මං බලාන රවරවා බිමට බාපු හැටි. මහ ආරච්චිලගෙ කාලේ ඉඳන්ම අපි හිතවත්තුය කියලා හැමෝටම ඇහෙන්නත් කියෙව්වා" සිරිමල් සවස සෙදෝනා එක්ක කිව්වේ මහත් ගර්වයකින්. "මහා ආරච්චිල ඔය විදියටම ආලවන්තකම් පාලා තමයි පුතේ උඹලගෙ අප්පච්චිට උරුමයෙන් ලැබුණු ඔය යාය ණයතුරුස්වලටම සින්න කරගත්තෙ. ඕකුන් මහ පොළොං වංසෙ උන්. උඹට ඕවගේ තේරුමක් නෑ" වහලයෙන් පහළට එල්ලෙන කෝඳුරු වැලක් කඩා ඉහුර වන ගමන් සෙදෝනා කිව්වා..

ගසක සාරය උරාගෙන වැඩෙන පිළිලයක් මෙන් ආරච්චිල වලව්වේ ඇත්තෝ තමුන්ගේ දුක අනුභව කොට සිය ධනය හා බලය සරි කරගත්තා. බක්මීදෙනිය ගමේ දෙතුන් දෙනෙකු හැරුණුකොට අන් සියලුම දෙනා ආරච්චි වලව්වේ අඳයට ලබාගත් ඉඩකඩම්වල ගොවිතැන් බත් කරගත් අතර සමහරු වලව්වේ බැලමෙහෙවර කිරීමෙනුත් සිය ජීවිකාව සරිකර ගත්තා. පාවරය මැනීමෙන් දින කිහිපයකට පසු වලව්වේ සුළු සුළු වැඩ කටයුතු සඳහා සේපාලිකා එවන්නැයි පුංචි ආරච්චිල විසින් දෙතුන් ගමනක්ම සිරිමල්ට සිහිපත් කලත් සේපාලිකා නොවෙයි එහි ගියේ. දිනක් කඩ පිලේ දී සිරිමල් හමුවූ පුංචි ආරච්චිල "ඈ බං

සිරිමල් දැන් උඹට මං කී විධයක් නම් මතක් කළාද හාමිනේගෙ උදව් පදව්වට සේපාලිකා වලව්වට එවන්නය කියලා." යි නුරුස්නාවෙන් ඇසුවා.. "අනේ පුංචි ආරච්චි මහත්තයෝ පොඩි උන් දෙන්නගෙ වැඩ කටයුතුත් එක්ක ඒකිට නිවනක් නැතුවා. කොල්ලට තාම උගෙ අම්ම නැතුව බෑ. ඒ හින්දයි ගමන තාවර උනේ. මං ඒකිට කියන්නම්.." සිරිමල් බයාදුවෙන් පැවසුවා..

වෙල මැද්දෑවේදී දර කපන්නට වනපෙතට ගිය ගමනේදී තනි මග ආරච්චිලව දෙතුන් විධයකදීම හමුවූ සේපාලිකාට ආරච්චිලගේ කුරුමානම ගැන ඉව වැටී තිබුණා. "බලහංකො ඉතින් සුද්දියෙ උඹ ඔහොම දුක් විදින්න ඕන එකියෙක් ද බං..නිකන් ඉන්න වෙලාවට වලව්වට ඇවිත් හාමිනේට උදව්පදව් කරලා හිටියනම් හවහට බැරියැ හාල් තුන පහ ටිකක් හෙම අරගෙන යන්න" වචනයෙන් දෙකෙන් කතාව අහවර කළ සේපාලිකා හැකිතාක් ඉක්මනින් ඔහු මඟහැර ගියා..

"සුද්දියෙ උඹ ලවා හම්බකරන් කන්න මගෙ තුන් හිතකවත් නැතුවා. ඒත් පුංචි ආරච්චිල මහ අමුතු කතාවක් කියාන ගියා නෙව. උඹලගෙන් අපිටත් උදව්වක් නැති එකේ මම හිතුවේ සුගතන්ට කුඹුක් ගහ ලියද්ද ඊළඟ කන්නෙට අඳේට දෙන්න කියාල. උඹට බැරියැ අර එහා ලියද්ද වැඩ කරගන්නයි කියල කියාගෙන ගියා නෙව. සුද්දියෙ ලියද්ද නැති උනොත් ඉතිං කාලා හමාරයි. එහා යායෙ ලියදි කිසි සරුසාරයක් නැහැ.." සිරිමල් විස්සෝපයෙන් කියාන ගියා..

ගොම්මන් අඳුර වැටීගෙන එන වෙලාවට ඈත වෑකන්ද දිහාවෙන් විදුලි කොටා ගෙන එන දිහා සෙදෝනා බලාගෙන හිටියේ බුලත් කසට බැඳි දසන් පෙන්වා සිනාසෙමින්. "ඕන් සුද්දියෙ අද වැහි රැල්ලක් එනවා. ආන් බලාපන් කළු කරගෙන එන හැටි. වැපිරිල්ලට කලින් වැස්ස වලාහක දෙවියන්නාන්සේ ඕන්න වැස්ස වස්සවන්නයි ලෑස්තිය." සෙදෝනා දෑත් එකතු කර අහසට වැඳගෙන තව තවත් මොනවාදෝ කියන්නට වුණා.

කාලෙකින් වහින්නට සැරසෙන අසනි වැස්සේ වැහි බීරිමත් එක්ක මොකක්දෝ මහා මූසල හීගතු හුළඟක් පැතිරීගෙන ගියා. ළහිලහියේ වැලේ වනා තිබූ රෙදි පෙරදි ටික ගෙට ගත් සේපාලිකාගේ හිතේ ඇති වූයේ මහා බිය මුසු විමතියක්. සිරිමල් පුංචි ආරච්චිලාගේ පණිවිඩයකට එහා ගමට ගිය ගමන තාමත් ඇවිත් නැහැ. රෑ බෝ වුවහොත් මස්සිනාලගෙ අහ නැවතී හෙට උදැහැනැක්කෙම යළි එන බව පවසා ඔහු ගිය දිනයේම සොබාදහමේ මේ අමුතු විපිළිසර හැසිරීම සේපාලිකාගේ හිතට ගෙනාවේ තිගැස්මක්. සට සට ගාමින් පොල් අතු වහල උඩට වැටෙන්නට පටන්ගත් වැස්ස තුරල් කරන පාටක් නම් නැහැ.

"කරවල හොද්දටත් වැහි වතුර වැටෙනවා සුද්දියෙ. කොල්ලටයි කෙල්ලටයි කවලා නිදිකරවල උඹත් නිදියගනින්. තනි අලියා එළි බහින යාමේ කොල්ලා අද කීයටවත් එන්නෙ නෑ. අද මහතුලා අහ ඉඳල හෙට උදෙන් ඒවි.." සෙදෝනා උපදෙස් දුන්නා. තවත් මොන මොනවදෝ මුමුනමින් ගෙතුලට යන ඈ දෙස බලා සිටි සේපාලිකා ගෙපැලේ තැන් තැන්වල වතුර බිඳු වැටෙන තැන්වලට හිස් මඩක්කු, වලං, කලගෙඩි ළං කරන්නට වුණා. රෑ 10 කණිසමට විතර යාන්තමින් වැස්ස තුරල් කරගෙන එද්දී දරු දෙදෙනාට චීත්ත කඩමාලු දෙකත් පොරවා කුප්පි ලාම්පුව නිවා දමා එතැනම ගුලි වන්නට සූදානම් වෙනවාත් සමඟම සිය කාමරයේ ජනේලය දෙසින් එළිපත්තේ සිට සියුම් සීරුම් හඬක් ඇට ඇසෙන්නට උනා.." පැදුරු ආන මීයෝ කනවා වත්ද. නැහැ වෙන්නට බෑ. ටිකකින් දොර පැලැල්ලට හිමින් කවුරුන් හෝ තට්ටු කරනු ඇසී කිටි කිටියේ තදකර චීත්තය හැඳගත් ඈ නළලතින් මතු වන දහදිය බිංදු පිසලමින් නැවතත් කන් දෙන්නට වුණා. කිසිවෙකු කෑමොර දෙමින් කෙසෙල් කඳක් මෙන් ඇද වැටෙනුත් ඉදිරිපස ගේ දොර ඇරී නැවත වැසෙනුත් සේපාලිකා ඇසුනා. " පොළොන් පැටියා වුණත් විසයි බොල කෙල්ලෙ. පැනපැන දෂ්ට කරන්නට කලියෙන් මරාදාන්ට ඕනෙ. නිදාගනින් නිදාගනින්. විෂඝෝර සර්පයා දැක නෑර මෝඩයා.. යි මුමුනමින් සෙදෝනා සිය කාමරය දෙසට පියමනිනු ඇසුණා. මවිතයෙන් හා බියෙන් ඇළලී ගත් සේපාලිකා ළමැදට තදින් තුරුලු කරගත් කොට්ටය අතැතිව ආයෙමත් තද කරන වැස්සට සවන් දුන්නා. රෑහැයියෙකුගේ කන් කීරි ගස්සන නාදයත් ඈත වෑකන්ද දෙසින් උලමකුගේ මූසල ළතෝනියත් ඇසී නෑසී ගියා...

**-සුරංජි නිල්මිණි ප්‍රේමරත්න-**

(පරිපාලන සේවා)

## කුසලතා
# "තල බෝල"

නිලන්තිගෙ කට උත්තරය.

මගේ නම නිලන්ති. නිලන්ති පුෂ්පිකා දිසානායක. වයස 32යි. ඔව් සර්. මං විවාහකයි. මට දුවෙක් ඉන්නවා. එයා ඉස්කෝලේ යන වයසේ. මං මේ දේ දැක්කේ දුවව ඉස්කෝලේ ඇරලවලා එන ගමන්. ඔව් සර්, මම වෙන්න ඇති ඒ දේ ඉස්සෙල්ලම දැක්කේ. මං පාර දිහාවට දුවගෙන එනකොට තමයි ඊබට් සීයත් ඒ දිහාවට යනවා දැක්කේ. ඊබට් සීයට නම් ඔය මොනා දැක්කත් වගක් ඇති එකක් කියලද? බීඩියක් කටේ තියන් මනස්ගාත දොඩවන එකනේ එයාගෙ වැඩේ. ඒත් සර් මටනම් කෑගහගන්න බැරිව හුස්මත් හිරවුණා. කකුල් දෙකත් එක්ක පණ නැතිව ගියා. මං බයටම මහා හයියෙන් කෑගහගෙන පාර දිහාට දුවගෙන ගියා. වෙන මොනා කියලා මේ ගැනු මං කරන්නද සර්? ඔය හිටිය මනුස්සයාව නම් මම මීට කලින් දැකලවත් තිබුණේ නෑ. ඔය ගේත් අවුරුදු ගානක් වහලා දාලා තිබ්බේ. ඒත් ඊයේ හවස කුසුම් නැන්දා කියපු හැටියට ඒ හිටියේ විමලසේන මාමා වෙන්න ඕනා. මටනම් විමලසේන මාමව යාන්තමට වගේ තමා මතක. එයා අවුරුදු ගානක් ගමේ හිටියේ නෑ.

හ්ම්ම්ම්ම්. ඔව්... ඒ සිද්ධිය වෙද්දී අපි ගොඩක් පුංචී. මම මගේ පොඩි එකීගෙ වයස වගේ ඇති......

කුසුමාවතීගේ කට උත්තරය.

මම කුසුම්. අලුගල් පෙඩිගේ රාණි කුසුමාවති. වයස 53යි. ඔව් සර්. මම විමලසේන අයියව පොඩි කාලේ ඉඳලම දන්නවා. ඒ අපේ ගමේ හිටපු ඉස්කෝලේ මහත්තයගේ පුතා. ඉස්සරනම් හොඳ හැන්ඩියා. කොච්චර ලස්සනට හිටියත් මිනිහට පෙළවහක් කරගන්න බැරි වුණා.  පව් ! විමලසේන ගෙදරටම නාකි වුණා. ඊයේ දවල් මං විමලසේනව නුවර කඩේ ගාවදි දැක්කා. මූණත් එක්කම ඇදිලා ගිහිල්ලා. හමත් රැළි ගැහිලා. ඉස්සර තිබුණ කළු බොකුටු කෙස් වෙනුවට තිබුණේ අළු පාට කොට ගැහුණ කෙස්. තට්ටෙත් මතුවෙලා තිබුණා. ජේත්තුකාර පෙනුම නැති වුණත් ඇස් දෙකේ තිබුණ මනමාල එළිය නම් මැකිලා ගිහින් තිබුණේ නෑ.  මට විමලසේන අයියව එක පාර අඳුනගන්නත් බැරි වුණා සර්. එයා මාත් එක්ක යාන්තමට වගේ හිනාවෙලා ගියා. එයා ඉස්සර ඉඳලම කොහොමත් එහෙමයි. වැඩි කතා නෑ.  ඔළුව බාගෙන යාන්තමට හිනාවෙලා යනවා විතරයි. ඒ ඇරත් ඉස්කෝලේ මහත්තයයි ලොකු නෝනයි කැමති නෑ විමලසේන අයියා අපි එක්ක වැඩිය ඇයි හොඳැයියක්  තියාගන්නවට.

හ්ම්ම්ම්ම්....

විමලසේන අයියට ඔය දේවල් වෙන්න හේතුවත් ඔය මහන්තත්තකම.අපිට පද්දෝ පද්දෝ කියලා තමයි ඔය ලොකු උන්දැලා දෙන්නම කියන්නේ. ඒත් ඉතින් විමල්සේන අයියා එහෙම්මම ආඩම්බරකාරයෙක් වත් ඔය දේවල් ලොකුවට ඔළුවේ තියන් හිටිය කෙනෙක්වත් නෙමෙයි. ඒත් එයා පොඩි කාලෙ ඉඳලම පැත්තකට වෙලා තනියම හිටියේ. යාළුවෙක් කියලා කෙනෙක් හිටිය වගක්නම් මට මතක නෑ සර්. නුවර කඩේ සිරිසේන මාමා තමා කිව්වේ ඒ විමලසේන අයියා කියලා. එතකොටයි මාත් අඳුනගත්තේ. විමලසේන අයියවත් කාලකණ්ණි කරලා ලොකු උන්දැලා දෙන්නම මැරිලා ගියා. ඔය ගෙවල් දොරවල් අවුරුදු ගානක් වහලා දාලා තිබ්බේ සර්. ඔය ගේ මහා ජරමරයක් වෙච්චි තැනක්නේ. මිනිස්සු නම් කියනවා ඔය ගෙදර හොල්මන් තියෙනවා කියලත්. ඒකත් වෙන්න බැරි නෑ. එක මිනියක් කියලද මරණ තුනක්ම වෙච්ච තැනක්නෙ ඕක.

අවුරුදු ගානක් ගෙවිලා ගියත් මටනම් සර් ඒ දේවල් අදක ඊයෙක වුණා වගේ මතකයි....

සිරිසේන ගේ කට උත්තරය

සර් මගේ සම්පූර්ණ නම යටිවැල්ල මුදියන්සේලාගේ සිරිසේන රත්නායක. වයස 77යි. මං මේ ගමට ආවේ ගැටයා කාලේ. ඒ කලේ නම් ඔය ඉස්කෝලේ මහත්තයා, ඒ කියන්නේ විමලසේනගේ තාත්තා මගේ හිතවතා. කොයිතරම් හිතවතා වුණත් ජීවිතේකට ණයට බඩුවක් මුට්ටුවක් අරං නෑ. සල්ලි මදි නම් අතේ තිබ්බ ගානට ගත්තා. ඔව්... මිනිහා ආඩම්බරකාරයා. විමලසේනගේ අම්මා ඊට එහා. ඔළුවක් උස්සලා හිනාවෙන්නේ නෑ. ගමේ අය නම් කියන්නේ මාතලේ මොකද්දෝ රදළ පරම්පරාවක ලේ උරුමකාරියක් කියලා. පවුලම හොඳ සල්ලි කාරයෝ. ඒ හින්දමත් වෙන්න ඇති ආඩම්බරෙත්. හඃ හා ඒ වුණාට කුණුම කුම්මැහියෝ දෙන්නෙක්. බඩෙන් බාගෙට වෙන්නැති කන්නේ බොන්නෙත්. ඒ විතරක් නෙමෙයි දෙන්නම හරි නීති කාරයෝ. ඔය ඉස්කෝලේ මහත්තයා දෙයක් කිව්වොත් කිව්වමයි. විමලසේනට උනත් නීති දාහක් දාලා හැදුවේ. අඬු පඬු දික් වෙච්චි ඉලන්දාරියා කාලෙත් විමලසේනයා ඉස්කෝලේ මහත්තයගෙන් නොසෑහෙන්න ගුටි කාලා තියෙනවා. විමලසේනයා හොඳ යස ඉලන්දාරියා. ඒත් ඔය කොල්ලා කොයි වෙලාවෙත් බය බිරන්තර වෙච්ච ගමන් හිටියේ. කාලයක් ඔය විමලසේනයා මහා පෙරේතකමකින් තලගුළි කෑවේ. අවුරුදු 30ක් 35ක් වෙලත් පොඩි එකෙක් වගේ කඩදාසියකට තලගුළි අරගෙන විටින් විට මිනිහා කෑවා. මිනිහත් තාත්තා වගේම තමා. කවදාවත් දෙන්නම් කාසිවලට වැඩ නෑ. මිනිහා වැඩිපුරක්ම කඩේ ආවේ තලගුළි කන්න. ගමේ අනික් හැම එකාගෙම ළමයි බඩුව මුට්ටුව ගන්න පොඩි එකා කාලෙ ඉඳලම කඩේට ආවා

ගියා. විමලසේනයා මේ කඩේට කියලා මුලින්ම ආවේ අඬු පඬු දික් වෙච්ච ඉලන්දාරියෙක් වුණාටත් පස්සෙ. ඒ සිගරට් දෙකක් ගන්න. නොදැක්ක එකෙක් නිසා විස්තර ඇහුවමයි දන්නේ ඉස්කෝලෙ මහත්තයගෙ පුතා කියලා. ගමේ හිටියට එළියක බස්සලා තිබ්බේ නෑ. ළමයෙක් එක්ක සෙල්ලමක් කරන්න ගිහින් ඇති කියලා මම හිතන්නේ නෑ. ඔය දේවල් මට මතක ඔය කොල්ලා දවසක් සිගරට් එකක් බීලා අහු වෙලා අම්බානෙකට ගුටි කාලා තිබ්බා. ඉස්කෝලෙ මහත්තයත් කොල්ලගෙ කනෙන් ඇදන් ඇවිත් කඩේ ඉස්සරහ තියාගෙනම කොල්ලටත් අත පුරවලා දෙකක් දීලා උඹට සිගරට් විකුණුවා කියලා මටත් නොසෑහන්න බැන්නා.

යකෝ උගුර ගැට්ට පැනලා අවුරුදු විස්සක් විසි පහක් වෙන එකෙක්ට සිගරට් විකුණන්න මං කාගෙන්වත් අවසර ගන්න ඕනයෑ? ඔය සිද්ධිය නිසා මායි ඉස්කෝලෙ මහත්තයයි කාලයක් වැඩි ඇයිහොඳැයියක් නැති වුණා. කඩේ බඩුවක් මුට්ටුවක් ගන්නවත් උන්දැලා ආවෙ නෑ. එක්කෝ ඉස්කෝලෙ මහත්තයාලගේ වත්තේ වැඩ කරපු ඊබට් මලයාව එව්වා නැත්තම් ධම්මිකා කෙල්ලව එව්වා.

ධම්මිකා කෙල්ල හොඳ එකී. ඒකි පොඩි කාලෙ ඉඳලම කඩචෝරු රුසියා. ඒකිත් තලබෝල තමා වැඩියම ආස. කඩේ ආවොත් තලබෝලයක් දෙකක් ගන්නවාම යි. විමලසේනයටත් ඔය කඩචෝරු පුරුද්ද නම් එන්න ඇත්තේ ඔය කෙල්ලගෙ න්. උන් විමලසේනලගේ ගෙදර පිටිපස්සේ රබර් කැල්ලෙ සර් හිටියේ. පව් දුප්පත් මිනිස්සු. කෙලිගේ අම්මත් ඇදුම හැදිලා ඒකි පොඩි කාලෙම මළා. ඊබට් මලයා තමයි විමලසේනලාගේ රබර් කැල්ල බලාගත්තේ.

ඊයෙ විමලසේන කඩේ පැත්තේ ආවා. මං හිතන්නේ අච්චු වෙලා ඉවරයි. ඒ කඩේ ආපු වෙලාවෙත් රුපියල් 200ක් දීලා තලගුළි 20ක් අරං ගියේ. එච්චර එකපාර තලගුළි ගද්දි තමා මමත් ඇස් ලොකු කරලා ඒ ළමයා දිහා බැලුවේ. කල්දේරම් බත් කාලත් තලගුළියේ රහ අමතක නෑ. හඃ හා.

පස්සේ තමා මාත් අඳුනගත්තේ ඒ විමලසේනයා කියලා. පව් කොල්ලා ඇඳිලා ගිහින් තිබ්බා මහත්තයෝ. "එන්නම් මාමේ" කියලා පොඩි හිනාවක් දාලා තලගුළියක් කකා අනික්වා අරන් ගියා. මං කියලා උඹගෙන් මොනා කියලා අහන්නද මහත්තයෝ? "උඹට කොහොමද" කියලා අහන්නද? සැප දුක් අහන්නද? පව් කියලත් හිතෙනවා. ඔය සිද්දියෙන් පස්සේ ඉස්කෝලෙ මහත්තයාගෙයි නෝනගෙයි මිනී දෙක එළියට ගෙනියන කොට මාත් එතන හිටියා. ඒ උන්දැලාට විමලසේනට වෙච්චි දේ ලැජ්ජාව දරාගන්න බැරි වෙන්න ඇති. හැබැයි ඕවා වෙන්න කලියෙන් ඒ උන්දැලටත් තේරුම්ගන්න තිබුණා. කියලා වැඩක් නෑ මහත්තයෝ ඒ ගැන නම්.

මහත්තයෝ... ඒ දේවල්වලට වගකියන්න ඕනා උන් සේරමලා මේක අත ඇරලා යනවා. පව්! ඒත් අදටත් අර ඊබට් මලයා මැරුණ නොමැරුණ එකෙක් ගානට පිස්සු දොඩව දොඩව අගු පිල් වල වැටිවැටී ඉන්නවා. හිටිගමන් මගෙනුත් බීඩියක් දෙකක් ණයට ගන්නවා. ණයට කියන්නේ ඉතින් පිනට තමා මහත්තයෝ. මොකෝ මිනිහගෙන් ණය සල්ලි ඉල්ලන්න රස්සාවක් කරන එකක් කියලද? කන්නෙ බොන්නේ පවා පන්සලේ දානේ ඉතුරු වෙන ඒවාගෙන්. ඒ ඇරත් කියන දෙයක් තේරුම් ගන්න පුළුවන් තත්වෙක උන්දෑ දැන් නෑ. පව් අසරණයා. දැන්නම් ඔළුව ටිකක් හොඳ මදි. එච්චර හරියක් වෙලත් මිනිහා විමලසේනට අතක් ඉස්සුවේ නෑ.

*************************************

"මුදලාලි මාමේ මට තලගුළි දහයක් දෙන්නකෝ" ටොෆි බෝතල් මූඩි උඩින් වූ කොල පැහැ දහයේ කොලයේ සිටි යාපහුවේ සිංහයා සිනා සිසී සිටින්නට විය.

"මේ ළගකදී ඉදන් උඹ තලගුළි කනවා වැඩී. සීනි හදාගන්නද යන්නේ?"

සිරිසේනගේ පැණයට පිළිතුරක් වෙනුවට විමලසේනගේ මුවේ සිනාවක් පමණක් විය. අතේ වූ තලගුළි කඩදාසිය ගුළි කරගත් විමලසේන ගුරු පාර දිගේ දිව යන්නට විය.

ගුරුපාර දිගේ ඉක්මන් අඩි තියන විමලසේන අත වූ කඩදාසියේ වූ තලගුළියක් කෑමට අමතක නොකළේය.

පහළ ඉපනැල්ලේ සිට පියාඹා ගිය කිරලෙක් මේ ක්‍රියාව දැක විමලසේනට උසුළු විසුළුවට මෙන් "පෙරේතයා පෙරේතයා" යන හඬට සමාන හඬක් නගමින් ඉගිල යයි. වැහිකෝඩයක් ඈත අහසේ විමලසේන දිහා ඔරවාගෙන බලා සිටින්නට වූයෙන් ඊට බයේ විමලසේන පය ඉක්මන් කරන්නට විය. එසේ පය ඉක්මන් කෙරූ විමලසේනට කොතෙක් වේගයෙන් ඇවිද ගියත් එක තැන ඇවිද යන අයුරක් දැනුණි. විමලසේන තව තවත් වේගයෙන් ඇවිද ගියේය. හති වැටෙනකම් ඇවිද ගියේය. දාඩියෙන් ඇඳ සිටි කමිසය බත්වෙනකම් වේගයෙන් ඇවිද ගියේය. දාඩිය ගලා විත් එතැන මහා වගුර බවට පත්විය. එක නිමේෂයකින් ඔහුගේ ගමන නැවතුනි. නොදැනීම පාර මැද දාඩිය නිසා ඇති වූ මඩවගුරේ ඔහු එරෙමින් සිටියේ ය. ගොඩට ආ හැකි සේයාවක් හෝ ළඟ පාතක නොවිණ. අත වූ තලගුළි කඩදාසිය ඔහු තදින් මිරිකා සිටින්නට විය. එකෙනෙහිම ඔහුගේ දෑත් තෙත්කරමින් තලගුළි එතූ කඩදාසිය තුළින් ලේ වැගිරෙන්නට විය. විමලසේන බයෙන් තැතිගෙන තලගුළි කඩදාසිය ඉවත් කිරීමට කොතෙකුත් වෑයම් කරත් එය අසාර්ථක උත්සහයක් පමණකි. මේ වේදනාවන් විදිමින් සිටි විමලසේනට පහළ ඉපනැල්ලේ සිට

ඉගිලී ගිය කිරලා දැඩි කෝපයෙන් ඔරවාගෙන සිටිනු පෙනුණි.. ඌ මවාගත් රුදුරු මුහුණත් සමගින් විමලසේනට හතර වටෙන් පහර දෙන්නට වූවේය. විමලසේන කිරලාගෙන් බැට කමින් අතේ ලේ වගුරවමින් සිටිද්දී මඩ වගුර ඔහුව ගිල ගනිමින් සිටියේ ය.

*********************************

"වැත්තෑව හන්දිය බහින අය ඉස්සරහට එන්න"

කොන්දොස්තර කොලුවාගේ ගෝරනාඩුවට කම්සේ ඇඟට ඇලෙනකම්ම දාඩියේ පෙඟී සිට නින්දෙන් අවදි වූ විමලසේන අයා සිටි මුව දෙපස දකුණතේ පිට අල්ලේ මැණික්කටුවෙන් පිරිමදින්නට විය. ඔහුගේ දෑස් ගිලී ගොස් තිබුණි. ඒ තුළ මොකද්දෝ නොතේරුන හැඟීමක් ගැබ්ව තිබුණි. ඒ හැඟීම් එළියට එන්නට නොදී වග බලාගනිමින් විමලසේන කබ වලේ වූ කබයක් දෙකක් කඩන්නට විය. එසේ නිදි කබ කැඩූ විමලසේනගේ දෑස් බසයේ ජනේලයෙන් පිටත ලෝකය දෙස විශ්මයකින් යුතුව ඇලිනි.

"වැත්තෑව හන්දිය බහින අය සීට් වල ඉන්නැතුව ඉස්සරහට එන්න"

කොන්දොස්තර කොලුවාගේ දෙවන අණ කිරීමත් සමඟම ජාඩි මුට්ටියේ සිටි කාරල්ලා මාලුවෙක් මෙන් දාඩියෙන් පෙඟි සිටි විමලසේන අතට වාරු දී ආසනයෙන් නැගී සිටින්නට විය. ඔහුගේ දෑස් තවමත් බස් රියෙන් පිටත ඇලී ඇත. අතේ වූ කුඩා කළු පැහැ ඉටි බෑගයක් ඇරෙන්නට වෙන කිසිවක් ඔහු සතු නොවීය.

"ගම සෑහෙන්න වෙනස් වෙලා"

මෙසේ හිතින් සිතාගත් විමලසේන හුරු ගමට නුහුරුවට අඩි තබා බසයෙන් බසින්නට විය.

ඉර අවරට ගොස් පැය දෙක තුනක් යන්නට වුවත් තවමත් ඉරේ සමච්චලයට විමලසේන ලක් වීය.

"මේ කාලකණ්ණි ඉර එළියත් මටම අරියාදුවටනේ එන්නේ"

තවමත් නිදි ගතිය ඇඟේ වූ විමලසේන කොයිබට හැරී යා යුතුදැයි මද වේලාවක් කල්පනා කර අතැති ඉටි මල්ල කිහිල්ලේ රුවා ගෙන හිස බිමට ඔබාගත් ගමන්ම ප්‍රධාන පාරෙන් හැරී; පාළු කැඩී ගිය කොන්ක්‍රීට් පාර දිගේ ඉදිරියට ඇදෙන්න විය. ප්‍රධාන පාර නොපෙනී ගොස් වංගුව ගනිත්ම විමලසේන දුටු දෙයින් ඔහුගේ මුහුණ පිනා ගියේ ය.

"ධම්මිකා.... උඹට එහෙනම් මතක තිබුණා මං අද එනවා කියලා. උඹනම් හිටියා වගේමයි බං. කිසි වෙනසක් නෑ"

විමලසේනගේ ආදර වදනට ඇයගේ මුහුණේ ඇති වූයේ හඳ පැයූවා වැනි හිනාවක් පමණි. විමලසේනගේ අතක තම දෑතෙන්ම එල්ලුන ධම්මිකා තම රවුම් බෝල ඇස් විමලසේනගේ ඇස් වෙත යා කරන්නට විය. තප්පර කිහිපයක් ඒ යා කිරීම සිදු විය.

"විමලසේන අයියා එන දවස මට මතක තිබ්බා. මට තනියම අයියව බලන්න එන්න බැනේ අයියේ. ඉතින් මං මෙතනට වෙලා අයියා එනකම් හිටියා"

තළෙලු රවුම් මුහුණත්, ඒ මත නොමැකෙන හිනාවත් සහිත පියකරු කෙලි පොඩිත්ත, ධම්මිකා..

විමලසේනගේ හදවතේ මළ බැඳුන ආදර තත් වැයීමට හැකි එකම කෙනා ධම්මිකා. ඇගේ දිගු කෙස් වැටිය, හැඩ පාමින් ඇස් නටවමින් කරනු ලබන කෝලම් කතා. විමලසේනගේ ගිනියම් වූ හිත නිවිය හැකි එකම සීතකාරකය බව විමලසේනද දැන සිටියේ ය.

පාර දෙපස මූකළානේ ගස් පඳුරු වැවී තිබූ නිසා ඉර එළියේ අරියාදුවද ඉන් හමාර කරවා ගැනීමට විමලසේනට හැකි විය.ඒ නැතත් ධම්මිකාගේ පැමිණීම විමලසේනට අනෙක් මුළු ලෝකයම අමතක වෙන තරමේ එකකි.

රබර් සෙරෙප්පු යුගල පාදයේ ඇඟිලිවලින් මිරිකාගනිමින් වට පිටක් හෝ නොබලා විමලසේන ඉක්මන් අඩියෙන් ඉදිරියට ඇදෙන්නට විය. දූවිලි ගඳ ගහන හුළං පොදක් විමලසේනගේ හඩු පැහැ අත් නැමූ සුදු කමිසය ඇතුළේ පිරුණි. ඒ හුළං පොද සම මස් හරහා පෙණහැල්ලට ගත්තාක් මෙන් විමලසේන බර සුසුමක් හෙලුවේ ය. දෑසේ කාන්තිය මදකට මැකී යමින් සිටියදී විමලසේන තම ඉක්මන් අඩි තැබීම කෙමින් කෙමින් අඩු කළේ ය. එක් තැනකදී ඔහු ධම්මිකාගේ අතකින් අල්ලා ගනිමින් නැවතී ඈ දෙස බලා සිටින්නට විය.

"කෙල්ලේ. උඹ මාත් එක්ක තරහද?"

ඉපනැල්ලේ සිට පියඹා ගිය කිරල ජෝඩුවක කෑගැසීමත් විමලසේනගේ හදවතේ රිද්මයත් හැරෙන්නට පාර පාළුවෙන් ගිලී තිබුණි.

විමලසේනගේ පැණයට ධම්මිකාගේ පිළිතුර වූයේ එක හිනාවක් හා බර කර හෙළූ ඇහි පිල්ලමක් පමණි.

"මං හිතලා කරපු දෙයක් නෙමෙයි බං ඒ. උඹ මට සමාව දෙනවා නේද?"

ධම්මිකාගේ මුහුණේ වූ නොමැකෙන හිනාව සමඟම විමලසේනව සනසන ආකාරයෙන් "ඔව්" යැයි සන්කරමින් ඇගේ හිස සෙලවීය. පාළු පාරේ විමලසේනගෙත් ධම්මිකාගෙත් බැඳී තිබූ දෑත් කොතරම් වෙලා බැඳී තිබුණේ

දැයි විමලසේනට වැටහීමක් නොවිණ. ඔහු ධම්මිකාගේ දෑස තුළත් හිනාව තුළත් මාරුවෙන් මාරුව කිමිදෙමින් මොනාදෝ සොයමින් සිටියේ ය.

එක් වරම කළු පැහැ බයිසිකලයක උඩ කමිසයක් හෝ නොඇඳි වයස විස්සක විසි දෙකක පමණ තරුණ ගැටයෙක් වේගයෙන් බයිසිකලය පැද යන්නට විය. විමලසේන ඒ බයිසිකලයට හැපෙන්නට යනවාත් සමඟ ඔහු ප්‍රකෘති බවට පත් විය. විමලසේන බයිසිකල්කරු කෙරෙහි නොරුස්සනා බැල්මක් හෙලන්නට විය. නමුත් ඒ තරුණ ගැටයා විමලසේනව හැඳුනුවේ හෝ හඳුනාගැනීමට වෑයම් කරේ හෝ නැත.

"සොරි අංකල්"

මුලින් තමාගෙන් වීමට ගිය අත්වැරැද්දට සමාව ඉල්ලූ ඔහු පසුව විමලසේන දිහා අවඥාවෙන් මෙන් බලබලා බයිසිකල් පැඩලය පාගන්නට විය.

"ඇයි උඹ මොකෝ? මාත් මේ ගමේ එකෙක් බොල. ඇයි උඹලා මාව අඳුනන්නේ නැද්ද? මම විමලසේන. ගමේ ඉස්කෝලේ මහත්තයාගෙ පුතා විමලසේන... මොනවද උඹ බලබල යන්නේ?"

තම මුළු බරම බයිසිකල් පැඩලය මත අත්හල තරුණ ගැටයා දෙස යොමු වූ විමලසේනගේ දෑසේත් ගල් බෝර දානා හදවතේත් දැඩි තරහකින් යුතුව එසේ ලියැවී තිබුණ, ඒ වචන හදවතේ තෙරපුණද එකදු වචනයක් හෝ මුවින් පිට වූයේ නැත. සියලු චිත්ත චෛතසිකයන් කැටි කර පෙණහල්ලේ කකාරවා වාෂ්ප බවට පත් කර නැවතත් විමලසේනගේ නාස් පුඩුවලින් පිටවූයේ බර සුසුමක් පමණි.

සියලුම සිතුවිලි සට්ටනයන්ට පසු ඔහුගේ දෑස් නැවතත් ධම්මිකාගේ දෑස් මත රැඳවීමට විමලසේන වග බලාගත්තේය. ඒ ඔහුට සිටි එකම සරණ ධම්මික පමණක් බව විමලසේන තේරුම්ගෙන සිටි නිසා වෙනි.

ඒ බර සුසුම්වල මොන මොනවා ලියවී තිබුණේද යන්න විමලසේනට හෝ අවබෝධයක් නොවීය. ඒ තුළ වූයේ තමාව ඒ බයිසිකල්කරු හඳුනා නොගැනීම නිසා ඇති වූ කලකිරීමද? තමාව අනතුරකට පත්කිරීමට යෑම පිළිබඳව ඇති වූ උදහසද, නැතිනම් සියලු දුක්ඛ දෝමනස්සයන් සුළඟට අතහැර බයිසිකලයේ ඉගිලී යන කොලු ගැටයා කෙරෙහි ඇති වූ ඊර්ෂ්‍යාව ද, එසේත් නැතිනම් ධම්මිකා හා දෑස් බැඳී තිබූ ඒ සොඳුරු මොහොත විනාශ කිරීම පිළිබඳව හිතේ ඇති වූ වෛරයද යන්න විමලසේනටවත් පැටලුම් හැරගත නොහැකි වූ සිතුවිලි ගැටයකි.

"යකෝ තොට මං අනන්තවත් කියලා තියෙනවා ඕක අල්ලන්න එපා කියලා. දැන් බලපන් වෙලා තියෙන දේ?"

තාත්තාගේ හැම්බර් වර්ගයේ බයිසිකලය පදින්න ගොස් සිදු වූ ඇබැද්දිය විමලසේනට සිහිගැන්විණි. ගහෙන්ද වැටී ගොනාටද කියා ඇනගත් විමලසේන වැලමිට හා දණහිස් පිහදමින් නැගී සිටිද්දී විමලසේනගේ පියා තමාව නොනැගිට්ටුවා බයිසිකල් හැඬලය පිසදමා කැඩී ගිය ලූකස් සීනුව හේතුවෙන් දාහකුත් එකක් බැණුම් ගොන්නකින් තමාට සංග්‍රහ කළ ආකාරය විමලසේනට සිහිගැන්විනි. ඒ කන මිරිකීම අදටත් කන් පෙතිවලට දැනෙනවා දැනෙනවා මෙන් විය.

"අප්පච්චිට එදා මට වඩා බයිසිකලේ ලූකස් සීනුව ලොකු වුණා"

නමුත් අනෙක් අතට හිතට වද දුන් කාරණාව පිළිබඳ ස්වයං විමසීමක් කළ විමලසේන, තමාව හඳුනාගත් කිසිවෙකු මේ වනතෙක් මුණ නොගැසීම පිළිබඳව පසුව දෙවියන්ට ස්තුතිවන්ත වූවේ ය.

"එක එකා අහන ඒවට මං මොනවා කියලා උත්තර දෙන්නද ධම්මිකා?"

විමලසේනගේ පැණයට ධම්මිකා කිසිත් නොකී අතර ඔහුගේ ගොරහැඬි දෑත ධම්මිකාගේ සිනිඳු දෑතේ ඇඟිලිවලින් වෙළාගෙන විමලසේනව වචනයෙන් නොව ක්‍රියාවෙන් අස්වැස්වීමට ඇය ක්‍රියා කළා ය.

කල්පනාවේ ගිලී, ධම්මිකාගේ ඇඟිලි පහසේ වෙළී පුරුද්දට මෙන් අඩි තැබූ විමලසේනගේ වියළුණු දෙපා එක් වරම නතර වූයේ පාර පැටලවී අතරමං වූවේද යන සිතිවිල්ලත් සමගිනි. ඔහු සිටි තැනම සිට වට පිට බලන්නට විය.

වසර විස්සකට පසු මොනතරම්නම් දේ වෙනස් විය හැකිද?

"ධම්මිකා මේ බලන්නකෝ. ගම නම් සෑහෙන්න වෙනස් වෙලා"

මෙසේ කියූ විමලසේන මීට වසර විස්සකට පෙර මේ භූමි බාගයේ අනුරූපතාව ගලපන්නට විය. අලුතින් ඉදි වූ නිවාස කැටිය, කොන්ක්‍රීට් පාර, මේ කිසිවක් ඔහුගේ මතකයේ තිබූ තැන් නොවිණ.

"මං වැරදිලා වෙන ගමකට ඇවිත්ද"

මේ සිතිවිල්ල විමලසේනගේ සිත ආක්‍රමණය කරනවාත් සමගම ඈත කොනකින් පෙනෙන බෝක්කු බැම්ම ඔහුගේ දෑසේ ගැටිණ.

තමා නිවැරදි ඉසව්වට පැමිණ ඇති බව තහවුරු කරන ලද්දේ එකී බෝක්කු බැම්මයි. කලකට ඉහත මෙහි තිබූ රූස්ස රබර් යාය අද වන විට කට්ටි කර විකුණා තිබුණි. නව පදිංචිකරුවෝ එහි විත් පදිංචි වී සිටිය හ. සවස් යාමයේ කට්ට තිත්ත කළුවර මූසල පෙනුමක් ගත් රබර් කට්ටිය දාම්පෙ මුදලාලි කෙනෙක්ට අයිති එකක්. සැබවින්ම දැන් නම් එහි රබර් කට්ටියක් කියලා එකක් නෑ. ඒ ඉදිරිපිට වූ පැඟිරි මාන පඳුරෙන් වැසුණ ගන මූකලානත් නෑ. ඒ වෙනුවට එහි

තිබුනේ නවීන පන්නයේ නිවාස රැසකි. විමලසේනවත් අඳුනන විමලසේනත් අඳුනන එකම සමීපතමයා වූයේ ඈතින් දිස් වූ බෝක්කු බැම්ම පමණි.

වසර තිස් හතක් තිස් අටක් ගමේ හැදුණ විමලසේන ජීවිතයේ පළමු වතාවට ගමේ බෝක්කු බැම්ම මතින් ඉඳගත්තේය. කිහිල්ලේ රුවා සිටි කලු ඉටි බෑගය පාර මතින් තබා දෙඅල්ලෙන්ම බෝක්කු බැම්ම මිරිකා බදා පපුව ඉදිරියට යොමා විමලසේන බෝක්කු බැම්ම මත ඉඳගෙන සිටින්නට විය. ධම්මිකා ඔහු අසලින්ම හිටගෙන සිටින්නට විය. ඈගේ ඇඟිලි තුඩුවලින් ආදරයේ ආලේපනයක් විමලසේනගේ හිස මත ආලේපකරන ආකාරය විමලසේනට දැනුණි.

"ඉස්සරකනම් මේ බෝක්කු බැම්ම උඩ කොයිම වෙලාවකවත් මෙහෙම පාළුවට ගිහින් තිබුණේ නෑ"

ධම්මිකා දෙස නොබලාම විමලසේන ඒ අතීතය යළි ස්මරණය කරන්නට විය.

ගමේ කොල්ලන් කුරුට්ටන් එකිනෙකා පරයා කයිවාරු පම්පෝරි ගසන තැන එය විය. තම පාසලේ සමකාලීනයන් පවා ඉඳ හිටක එම පම්පෝරි වේදිකාවේ බීඩියක් බොමින් විටක් කමින් සිටිනු දකින විමලසේන එසේ ලබනා නිදහස් සුවය අත්දකිනට, රබර් කට්ටියේ සිට හමා එන සුළගේ සිසිල විඳින්නට, ගමේ කොල්ලන් කුරුට්ටන් එක්කලා පම්පෝරියක් දෙකක් ගහන්න අති මහත් ආශාවකින් පෙළෙන්නට විය.

වසර ගානකට පසුව සිතැඟි සේ හුස්ම ගැනීමට ඔහුට අද හැකියාව ලැබුණත් අද එහි වූයේ විමලසේන පමණකි. තමගේ සැබෑ තතු තමාටත් වඩා හොඳින් දන්නා ධම්මිකාට කුමක් ගැන නම් විමලසේන කයිවාරු ගහන්නද?

කිසිවෙක් නො හැඳිනූ , ආගන්තුක නොවූ ආගන්තුකයෙක් වූ විමලසේන නිදහස් හුස්මක පිපාසයෙන් සිටි අයෙක් මෙන් බර හුස්මක් ඉහළ ඇද පහළ හෙළුවේය.

"ආතක් පාතක් නැති කාලකණ්ණි. දවස තිස්සේ බෝක්කු බැම්ම රත් කර කර කයිවාරු ගහනවා....."

තම පියා ඉඳ හිටක බෝක්කු බැම්ම මත සිටි තරුණයන්ට දෝෂාරෝපණය කරන ආකාරය විමලසේනට සිහිගැන්විණ.

නමුත් දැන් තහංචි දැමීමට කිසිවෙකු නැත. බෝක්කු බැම්ම මත ඉඳගෙන ඇති පමණ නිදහස් හුස්ම ආශ්වාස කිරීමට ඔහුට හැකි විය. එහි වූ සෑම ඔක්සිජන් අණුවකම නිදහස ලියැවී මහත් වූ සිසිලසකින් නාස් පුඩු තුළට ඇදී යන බවක් විමලසේනට දැනිණ. ඒ නිසාදෝ ඈත බලා සිට තවත් බර හුස්මක් ගනිමින්

එකී නිදහස් හුස්මට ලෝබවී ඇද බැඳ තබා ගන්නටද විමලසේන අමතක නොකළේය.

විමලසේනට ජීවිතයේ මින් පෙර නොවින්ද සුවය විඳගැනීමට ඉඩ හසර වෙන් කරන පරිද්දෙන් මෙතෙක් වෙලා විමලසේනට අරියාදු කළ ඉර පවා මහා කළු වලාවකට මුවා විය. සෞම්‍ය වූ පරිසරය ක්‍රම ක්‍රමයෙන් වැහි කෝඩයේ හිතුවක්කාර විලාශයකට වෙස් මාරු විය. විමලසේන හට හොඳක් කරන්න යැයි සිතා ඉර කළු වලාවක සැඟවුණ නමුත් ඊළඟ මොහොතේ වැටෙන්නට නියමිත වරුසාව ඔහුට පීඩාවක් ගෙන ඒවි යැයි ඉර හෝ නොසිතන්නට ඇති. ඈත අහසත් ඉගිලෙනා කුරුල්ලන් දෙසත් මඳ වෙලාවක් බලා සිටි විමලසේන, බිම වූ ඉටි බෑගය කිහිල්ලේ රුවා යළිත් ගමනට සූදානම් විය. බෝක්කු බැම්මෙන් නැගී සිටියද බිඳ හෙළිය නොහැකි බැඳීම නිසාදෝ කලකට ඉහත රබර් කට්ටිය තිබූ ඈතින් පෙනෙන ඉඩම් කට්ටිය වෙත ඔහු තවමත් දෑස් එල්ලකරගෙන සිටින්නට විය. ඊටත් වඩා ඔහුගේ සිත ඒ බිම කෙරෙහි දැඩි චුම්බනයකින් බැඳී තිබූ සේයාවක් දිස් විය. රබර් ගස් අස්සේ හැංගී තිබූ මොකද්දෝ මතකයක් දෑස් වැටී සතුට ගෙන දුන්නාක් මෙන් මෙතෙක් වියළිව තිබූ ඔහුගේ මුවට මඳ සිනහවක් නැගුණි.

ඒ මන්දස්මිතයත් සමගම ඉන් සමුගැනීම සනිටුවහන් කරන්න සූදානම් වූවත් ක්ෂණයෙකින් විමලසේනගේ මුහුණ කෙමින් කෙමින් පෙර වූවාටත් වඩා අඳුරු වන්නට විය.

"දේවල් කොච්චර ඉක්මනට වෙනස් වෙනවද?"

තමාටම කියාගනිමින් මොකද්දෝ ගැඹුරු මතකයක කිමිදෙමින් විමලසේන කලින්ටත් වඩා වේගවත් කෙටි අඩි තබන්නට විය.

සුළං පහරට සිරි බිරි ගා එකට ගැටෙන ගහේ කොළේ හඬත් වරුසාවට කලියෙන් කූඩුවට යන කුරුල්ලන්ගේ හඬත්, ඉරි තැළුණ කොංක්‍රීට් පොළොව සිඹගන්නා විමලසිරිගේ රබර් සෙරෙප්පුවේ "චරස් බරස්" හඬත් හපුටු සරම කමිසය හා කිහිල්ලේ වූ කලු ඉටි බෑගයත් දිරා ගිය පංචස්කන්දයත් ධම්මිකාත් පමණක් විමලසිරිගේ වර්තමානය විය. සැබවින්ම අපේක්ෂා බිංග වී, කළ යුත්තක් නොයුත්තක් කුමක්ද යැයි ගළපාගැනීමට නොහැකි වූවකුට ඉන් එහා වර්තමානයකට හෝ අනාගතයක් කියා නාමයකට හෝ උරුමකම් කිව හැකිද?

කුඩා කාලයේ සිට වසර තිස් හතක් තිස් අටක් දෙමාපිය බන්ධනාගාරයේද තවත් වසර විස්සක් රජයේ බන්ධනාගාරයේද ගත කළ තමාට ලැබුණ මේ නිදහසේ අත්දැකීම, තම ජීවිත කාලයෙම ලැබුණ පළමු නිදහස් මොහොත, තමා සන්තක වර්තමානය සමඟ ගත කිරීම විනා වෙන කළ හැක්කක් හෝ කළ

යුත්තක් විමලසේනට තිබුණේද?

ධම්මිකා සමඟ වත් ඔහුට මෙතරම් සමීපව සිටීමට ඉඩක් ලැබී ඇතිදැයි විමලසේනට මතක තිබුණේ නැත. එකම එක වරක් දම්පේ මුදලාලිගේ රබර් වත්තේ දී කවුරුවත් නැති මොහොතක ධම්මිකාගේ හිස සිඹගත් ආකාරය විමලසේනට සිහිගැන්විණ.

ඔහුගේ ආදරයේ මතක සැමරුම් තිබූ දම්පේ මුදලාලිගේ රබර් කට්ටිය එළිපෙහෙළි කර තිබූවත් හදවතේ වූ ඒ මතකයන් කෙසේ ඔහු එළිපෙහෙළි කරන්නද? මතකයන් නම් අස්ථිර වූ ස්ථිර දෙයක් නොවේද?

ධම්මිකා අඩුම තරමේ විමලසේනට වඩා වසර දහයකට දොළහකට වඩා බාල තැනැත්තියක් වූවා ය. හිතේ හිරිමල් පිපුණ නව යොවුන් වියේ සිටි ධම්මිකා විමලසේනට පෙම් කිරීම පුදුමයක් නොවීය. විමලසේන කඩවසම් ප්‍රියමනාප තරුණයෙක් විය. මහා කතා කාරයෙක් නොවූ ඔහු ගැඹුරු දෑසකින් යුක්ත විය. එසේ විනීත වූ කඩවසම් පිරිමියෙකුට වයසින් කෙතරම් පරතරයක් තිබුණද ස්ත්‍රියක සිතේ ප්‍රේමයක් මෝදු වීම අරුමයක් යැයි කිව හැකිද?

වැහි කෝඩය අහසේ ඔරවාගෙන සිටිද්දී දාහක් කල්පනාවන් මැද ඉක්මන් පියවර මැන්න විමලසේන වේගයෙන් ඇවිද යන්නට වූයේ අසංඛාරික චෛතසිකයකට කිදා බැස්ස එකෙක් මෙනි.

විමලසේන එකවරම හිටි පියවර සිටින්නට විය. වට පිට බලන්නට විය. කිසියම් හෝ හුරු පුරුදු මඟහැරුණු යමක් හොයන්නට විය.

## නුවර කඩේ

අඩි කිහිපයක් පසු කර තිබූ තරමක් පරණ පන්නයේ වෙළඳ සැල ඔහුගේ ඇස ගැටුණි.

"ගම කොයිතරම් වෙනස් වුණත් නුවර කඩේ නම් කියන්න තරම් වෙනසක් නෑ වගේ. තාම තලබෝල විකුණනවා ඇති නේ? ඔයා ඉන්න. මං අරං එන්නම්"

තමාව අඳුනන එක්කෙනෙක් හෝ සිටී යන බලාපොරොත්තුව හා තමා තව දුරටත් ගමේ හුදකලා වූවෙකු නොවේ යන හැඟීමත් කැටි කරගනිමින් ඔහු ආ ගමන ආපසු හැරුණේය. ඒ සමඟම ඔහුගේ කිහිල්ලේ රුවාගත් කළු ඉටි බෑගය කඩි මුඩියේ අදින්නට විය. එහි වූයේ තවත් පරණ කමිසයක් සරමක් හා තවත් කුඩා සිලි බෑගයක දැමූ මුදල් නෝට්ටු කිහිපයකි. ඒ විමලසේන විසින් බන්ධනාගාරයේ සිටියදී වඩු කර්මාන්තයේ යෙදී උපයාගන්නා ලද්දයි.

සීරුවෙන් කුඩා සිලි බෑගය විවෘත කර එහි වූ සීයේ නෝට්ටු දෙකක් විමලසේන අතේ රදවා ගන්නා ලදි. ඒ සමඟම බලාපොරොත්තුවේ සිනහා ඇබින්දක් විමලසේනගේ වියළුණ දෙතොලග වූ අතර ආසාවේ දිස්නය තුළ දෑස් ගිල්වී තිබුණි.

කඩේ පඩි පෙළ නගිනවාත් සමඟම ඒ බලාපොරොත්තුවේ සිනහව කොහේදෝ ළිං පතුලකට වැටී නැතිවී ගියේය. ආසාවකින් නලියන දෙනෙතේ මොකද්දෝ වැරදිකාරී ලැජ්ජා ශීලී බවකින් වැසී ගියේ ය.

කඩය තුළට ආ පියවර යලි හරවාගත නොහැකි නිසාම අත වූ සීයේ නෝට්ටු දෙක ටොෆි බෝතලයක් උඩින් තැබීය. ලැජ්ජාවේත් නින්දාවේත් අඳුරු මතකයක් අදටත් ඔහු වටා හොල්මන් කරන බව තම සිතින් ඔහු තමාටම වටහා දුන්නේ ය.

"මුදලාලි මාමේ මට මේකේ තල බෝල දෙන්නකෝ"

වෙනදා මෙන්ම අදටත් හිස බිමට ඔබ්බවා ගත්වනම සිට විමලසේන මුදලාලිගේ මූණ දිහා නොබලාම ඉල්ලා සිටියේය.

දුඹුරු පැහැ කමිසයක් හා තද නිල් හා ලා  නිල් පැහැ කොටු කොටු සරමකින් සැරසුණ තට්ට හිසක් සහිත මහලු පුද්ගලයා තල බෝල දෙනවා වෙනුවට ඇස් රැඳි කන්නාඩිය හරි බරි ගස්වා විමලසේන වෙත උඩ සිට පහළටම තීව්‍ර බැල්මක් හෙළී ය.

කොහොමත් අවධානයෙන් සිටින, ගමට ආගන්තුකයෙක් ආ විට වඩාත් අවධානයෙන් සිට ඔහුගේ කල් ක්‍රියාව හදාරන සිරිසේන, එවර තම උපැස් යුවල තුළින් විමලසේනට යොමු කරමින් සිටි බැල්ම වෙනුවට ඇහි බැමි රැළි ගන්වා උපැස් යුවල උඩින් බැල්මක් හෙළී ය.

"මිනිස්සු මං ගැන කොහොම හිතනවා ඇත්ද? මිනිස්සු මාව මේ ගමට පිළිගනීවිද? ඒ අය මට සැනසිල්ලේ ඉන්න ඉඩ දේ විද? මාත් එක්ක මේ ගමේ අය කතා කරාවිද? සම්බන්ධතා පවත්වා ගනීවිද? අඩු තරමේ මූණ බලලා හිනාවත් වේවිද?

දාහකුත් එකක් පිළිතුරු නොවූ ප්‍රශ්න ගොන්නක් සමඟම ලැජ්ජාවේ මතක සටහනක් විමලසේනගේ දෑස් තව තවත් බිමට එබුවේ ය.

මුදලාලි අසල වූ බෝතලය ඇර තලගුළි දහයක් කඩදාසි බෑගයකට හැලූ නමුත් ඔහුගේ දෑස් එල්ල වී තිබුනේ විමලසේන වෙතටම ය. ඒ බැල්ම නිකම්ම නිකම් හිස් බැල්මකි. විමලසේන ඒ ඇස්වලට තම ඇස් ගැටීමට ඉඩ නොදුන්නේ ඒ හරහා වළ දැමූ අවුරුදු ගානක කළු ඉතිහාසයක කුණු ගඳ ගොඩ එන බව ඉවෙන් මෙන් දැනුණ නිසාවෙනි.

"එන්නම් මුදලාලි මාමේ"

මුදලාලි තමාව අඳුනාගත් බව තේරුම්ගත් විමලසේන ඔහු සමඟ දොඩමලු වීම වෙහෙසකර බවත් එසේ දොඩමලුවී අතීතයේ කුමන තොරතුරක් ගැන සාකච්ඡා කරන්නේද යන්න පිළිබඳ වැටහීමක් නොතිබූ නිසාත් එක් වචනයකින් දෙකකින් ඔහු ආමන්ත්‍රණය කර තල බෝල බෑගයත් රැගෙන පාරට පිවිසියේ ය.

ධම්මිකා ඔහු එන තුරු එහි සිටියාය. විමලසේන ඇය හට හෝ කිසිවක් නොපවසා පියවර තැබීම තවත් වේගවත් කළේ ය.. ඒ, ඔරවාගෙන බලා සිටින වැහි කෝඩය නිසාමත් නොවේ.

"කී දෙනෙක්ගෙන් කොයිතරම් කාලයක් හැංගිලා ඉන්නද? මං උන්ට වරදක් කරලා තියෙන එකක් ද?"

හෘදසාක්ෂිය හා ආරවුලක් ඇති කරගත් විමලසේන බිම එබූ හිස බිමම ඔබා ගනිමින් වේග අඩි තබන ගමන් තමන්ගෙන්ම ප්‍රශ්න කරන්නට විය.

නුවර කඩය පසු කල විමලසේන මතුවට තවත් කිසිඳු ඇසකට හසු නොවී තම නිවස වෙත යනවා යැයි දැඩි අධිෂ්ඨානයක් ඇති කරගන්නට විය.

නිදහසේ හුස්ම ගන්න, හිතූ හිතූ තැන යන්න එන්න, සැබෑවටම නිදහස භුක්ති විඳින්න වසර ගණනාවක් මුළුල්ලේ බලා සිටියත් ඒ සියලු බලාපොරොත්තු මහා ගං වතුරක් ඇවිත් විනාශ කළාක් මෙන් විය. කල්පනා සයුරේ ගිලී සිටි විමලසේන තම අතෙහි වූ තලගුළි බෑගය විවෘත කර ධම්මිකා වෙත දික් කරත් ඇය දැන් එපා ආකාරයට හිස දෙපසට සොලවන්නට විය.

වසර ගානක් අමතකව තිබූ රසයෙන් තම දිව සතුටු කිරීමේ අරමුණින් තලගුළියක් කටේ ඔබාගෙන එහි රස විඳවිඳ එම රසය නිසා හෝ ජීවිතයේ නිරස මැකී යාවි වැනි හැඟීමකින් නැවතත් විමලසේන පියවර මනින්නට විය.

නුවර කඩයෙන් පිටවී අඩි දෙක තුනක් ගියා පමණි. සැණකින්ම තළෙලු මිටි මහත ප්‍රියමනාප රවුම් මුහුණක් විමලසේන ඉදිරියේ සිටින්නට විය.

"කුසුම්? උඹ හුඟක් වෙනස් වෙලා බං. මහත් වෙලා. ඉස්සර තිබ්බ හැඩ වැඩ ගතිය ටිකක් අඩු වෙලා. උඹ ඒ කාලෙනම් හරි හැඩකාරි. කොණ්ඩෙ එහෙමත් දිගට තිබ්බා මට මතකයි. දැන් දරුවෙක් මල්ලෙක් එහෙමත් ඇති. ඉතින් කොහොමද බං? ඉස්සර මං උඹලා එක්ක කතා නොකරේ මගේ ලොකු කමකට නෙමෙයි. දන්නවනෙ ඉතින් අපේ අම්මලා....

සිය දාහක් අකුරු වචන වෙන, විමලසේනගේ මනස කම්මල් ගෙයක් මෙන් කලබලකාරී විය. නමුත් ඒ ගෙතූ එක වචනයක් හෝ මුවින් පිටට නැවිත් මනසේම මැකී ගියේය.

ආගන්තුක හැඟීමක් දරනා විමලසේන තමා අඳුනන අයෙක් මුණ ගැසුණද කතා බහ කළයුත්තේ කුමක් ගැනද? ප්‍රකාශ කළ යුත්තේ කුමන දෙයක්ද යන්න

තෝරාගත නොහැකිව තවමත් මුනිවත රකින්නට විය.

ඔබා ගත් හිස තවත් බිමට ඔබා ගත් විමලසේන නොකරා බැරි මොකද්දෝ හේතුවක් නිසාවෙන් දෑස් පමණක් ඉහළට ඔසවා කුසුම් සමඟ මඳ සිනහවක් පාන්නට විය. විමලසේන හිනා වුණාට හිනා වූවා මිස කුසුම් හට විමලසේන ගැන අබ මල් රේණුවක හෝ ඇඳිනීමක් නොවීය. සැබවින්ම කුසුම්ට විමලසේනගේ මතක ඡායාවේ තිබූ කිසිවක් මේ වනවිට විමලසේන සන්තකයේ නැත.

අතීතයෙන් වර්තමානය වෙත යාවී තිබූ විමලසේනට උරුම් එකම සම්පත ධම්මිකා පමණකි. ධම්මිකාගේ දෑඟිලිවල උණුහුමත් ඉඳ හිට හෙළන ප්‍රේම බැල්මනුත් ඇයගේ හිනා මල්වලත් සුන්දරත්වයත් විඳිමින් තවත් විනාඩි 10ක් පමණ ගුරු පාරක් දිගේ විමලසේන වේගවත් පියවර මනින්නට විය.

යාන්තම් වැහි පොදයකින් විමලසේනගේ කමිසය බොඳවී යන්න ඔන්න මෙන්න තිබියදී විමලසේන ජරාවාස වූ පාළු ගෙයක් ඉදිරියේ නතර විය. ඉඹුල් ගස් පවා අහස උසට වැඩී තිබූ නිදිකුම්බා ගාලකින් වැසී ගිය මෙම භූමිය මීට වසර ගානකට පෙර තම නිවස බව ඡායාවෙන් මෙන් ඔහුට හඳුනාගත හැකි විය. ඒ තිබූ ප්‍රියමනාප තේජාන්විත පෙනුම මැකී ගොස් හද්දා මූසල පෙනුමක් පමණක් එහි දිස් වේ.

"උඹට කියලා තනිවම මේක සුද්ද කරන්න බැනෙ බං. ඔහෙන් වරෙන් ඔය නිදිකුම්බා කටු ඇනගන්නේ නැතුව"

විමලසේන ධම්මිකාට පියවර තැබිය යුතු දිශාව පෙන්වා දෙමින්ම තම නිවසට ඇතුළු විය.

වඳුරෝ පැනීම නිසා එහෙට මෙහෙට විසි වී ගිය ලංකා උළු කැට, දිය සීරාව වැදී පෙඟී ගිය සුදු ආලේපිත ගේ බිත්ති සුදු පැහැය උනා දමා සමර පැහැයට හැරී තිබුණි.

කලාන්තරයකට කිසිවෙක් පය නොපෙවූ මේ බිම වසර ගණනාවකින් මිනිස් පහසක් ලැබූවේ ඒ මොහොතේ ය. දිරා ඇද වී ගිය ඉදිරිපස දොර අතින් හොලවා විවර කරගැනීමට විමලසේනට හැකි විය.

"මේක හිමින් සැරේ සුද්ද බුද්ද කරලා ගන්න ඕන. ඔයාට වෙලාවක් තිබ්බොත් මේ පැත්තේ එනවද? ඊබට් මාමටත් කියන්න පුලුවන්නම් හෙට අනිද්දා වගේ මෙහෙ එන්න කියලා"

විමලසේනගේ ඉල්ලීමට ධම්මිකා හිස සලා එකඟ විය.

"හරි විමලසේන අයියේ. මං එහෙනම් ගිහින් එන්නම්. තාත්තත් බලං ඇති මං එනකම්. විමලසේන අයියා පොඩ්ඩක් විවේකයක් ගන්න. මහන්සිත් ඇතිනේ. මං රෑට කන්න මොනා හරිත් අරං එන්නම්"

ධම්මිකාගේ ප්‍රියමනාප වචන විමලසේනට අස්වැසිල්ලක් විය.

ඊබට් මාමා දන්නවද මාව හම්බවෙන්න ආව විත්තිය?

"ඔව් මං කියලා ආවේ. තාත්තා ආවේ නෑ පල්ලෙහා රබර් කට්ටියේ වැඩ. කවුරුත් නෑ කියලා ඒවා පාළුවට යවලා බෑනේ විමලසේන අයියේ.

ඊබට් හා ධම්මිකා සැබැවින්ම තමාටත් තම පවුලටත් හිතවත්කමක් ඇති අය බව විමලසේන හොඳ හැටි දනී.

"මට මතකයි මාව මාංචු දාලා පොලිස්සියෙන් එක්කන් යන වෙලාවේ ඔයා මොකද්දෝ ලිහාගන්න බැරි ගැටයක් දිහා විමතියෙන් බලා සිටිනවා වගේ මගේ දිහා බලං හිටියා. ඒ ඇස් දෙකේ මොකද්දෝ දුකක් තිබ්බා ධම්මිකා. මට ඔයාව බදාගෙන සමාව ඉල්ලන්න හිතුණා. ඒත් කොහෙද පොලිසියේ උන් මාව සතෙක්ව අරං යන්නා වගේ මාංචු දාගෙනනේ එක්ක ගියේ"

විමලසේන මොනාදෝ ශෘංගාරාත්මක මතකයන් රැසක් අවදි කරවන්නට විය.

නමුත් ශෘංගාරාත්මක වින්දනයේ අවසානය වේදනාබර එකක් වග ප්‍රත්‍යක්ෂයෙන්ම අවබෝධ කරගෙන සිටි විමලසේන ඒ මතකයන්ගෙන් මිදී අත වූ ඉටි බෑගය ජනෙල් බැම්ම උඩ තබා අවපැහැ ගැන්වී තිබූ බිතක්කනයට හේත්තු විය.

"හරි එහෙනම්. ඔයා ගිහින් එන්න. මහ රෑ වෙලා කෑම අරං ආවෙ නැති වුණත් කමක් නෑ. ඇඟ පත ටිකක් සෝදගෙන මම නිදාගන්නවා. දැන්නම් මට කන්නත් බෑ වගේ.

"එහෙනම් මාව මුණගැහුන නිසා විමලසේන අයියගේ බඩ පිරිලා ඇති"

ආදර හිනාවක් මුව තුළ නංවමින් ධම්මිකා කළ ප්‍රකාශයට එවැනිම ආදර හිනාවකින් විමලසේන පිළිතුරු සැපයුවේය.

වෙහෙස ගතිය නිසාම ගේ තුළට හෝ ඇතුළු නොවී විමලසේන අගුව යටට වන්නට බිම ඉඳගෙන අත වූ කඩදාසි බෑගයේ වූ එක තලගුළියක් මුව තුළ ඔබාගනිමින් හපන්නට විය. කුඩා කල සිට මහත් පෙරේතකමින් ආදරේ සෙවූ ඔහුට ලැබුණ ආදර තලගුළිය වන ධම්මිකා ආපසු යන දෙස නිරුවත් දෑසින් බලා සිටියේ ය. වැහිබර සුළඟට නටන ඇය ගේ කලු දිග කෙස් වැටිය දෙසම දෑස් නොසලා බලා සිටින්නට විය.

"මේ තලගුළිවලටත් වඩා ඇය කොතරම් මිහිරිද?" විමලසේන සිතුවේය.

******************************

මුළු පෙදෙසම අඳුරේ ගිලී යන්නට ඉතා ආසන්න විය. වෙහෙස නිසා අගුවේම

නිදා සිටි විමලසේන හිරිකඩ වැදීමත් සමඟම අවදි විය. හිරිකඩ මහා වැස්සක් බවට පත්වීමට ප්‍රථමයෙන් තම කමිසය උනා දමා සරම පිටින්ම ඔහු වත්ත පහළ ළිඳ වෙත යාමට සූදානම් විය.

විමලසේනගේ දෑස් බොඳ විය... ළිං බැම්ම දෙස බලා සිටින්නට විය. බැම්මේ වූ ගුරු පැහැ පැල්ලමක් දෙස ඔහු තව තවත් කිට්ටු කර බැලුවේය. එක් තැනකදී ඒ දෙස බලාගත් අත බලා සිටින්නට විය.

ඔහු දැඩි ආවේගයකින් ළිඳේ වතුර ගෙන එය පිරිසිදු කිරීමට උත්සහ කළේය. පනිට්ටු කිහිපයක් ඇද්දේය. ඒ පැල්ලම පිරිසිදු කිරීමට උත්සහ කරේය. කොතරම් උත්සහ කරත් ඒ පැල්ලම මැකී නො යයි. ඔහු දත් මිටි කාගෙන ගල් කැට අරගෙන බැම්මේ වූ පැල්ලම මකා බැම්ම සූරා දැමීමට උත්සහ කළේ ය. විමලසේන අසාර්ථක විය. යළි යළිත් අසාර්ථක විය.

ළිං බැම්ම මත වූ එම පැල්ලම මතින් ලේ උල්පතක් මතු වී තිබිණි. ළිං බැම්මෙන් බේරී ආ රුධිරය ළිඳ පුරාම වසාගත්තේය. විමලසේන මහා හයියෙන් අඬන්නට විය. කෑගසන්නට විය. බැම්ම මත වූ ඒ පැල්ලම දෑතින් වසා ලේ උල්පත වැලැක්වීමට තැත් කළේය. අවසානයේ තමා ඇඳ සිටි සරම උනා බැම්මට කර තද කරගෙන සිටියේ ය. මේ සෑම වෑයමක් තුළම ඔහු තව තවත් අසාර්ථක විය.

සියලු වැයම් නිෂ්ඵල වූ තැන ලේ වැගිරෙන ළිං කණ්ඩිය අසල බිම ඉඳගත් විමලසේන දෑතින් මුහුණ වසා ගෙන මහා හයියෙන් කෑ ගසන්නට විය.

"මට සමාවෙන්න. මං හිතලා කරේ නෑ මං හිතලා නෙමෙයි ඒ දේ කරේ"

කඳුළු පිරී බොඳවූ ඇස් අස්සෙන් විමලසේනට ඡායාවක් පෙනිණ.

ධම්මිකා..... ඔව් ඒ ධම්මිකා.

විමලසේන ආලය කළ, විමලසේනටත් ආලය කළ ධම්මිකා....

නමුත් සවස වූ ප්‍රියමනාප කම ඈ තුළ නොවිණ. නොමැකෙන හිනාව කොහේදෝ සැඟවී ගොස් තිබුණි.

"ඇයි විමලසේන අයියේ ඔයා මට එහෙම දෙයක් කරේ? මං ඔයාට ගොඩක් ආදරේ කරා. මං ඔයාව රවට්ටන්න හිතුවේ නෑ. ඒත් මං කොහොමද තාත්තගේ කීමට පිටින් යන්නේ? මට හිටියේ තාත්තා විතරයි. ඔයා ඒ ගැන දන්නවා. ඒ ඇරත් ඔයාගේ අම්මා අප්පච්චි මට පොඩ්ඩක්වත් කැමති වුණේ නෑ විමලසේන අයියේ.

අපි කරාවේ ඇයෝ. මගේ සීයා මාළු කාරයෙක්. අපි දුප්පත් මිනිස්සු විමලසේන අයියේ. අපි දෙන්නා කොච්චර ආදරේ කරත් අපි දෙන්නා පෑහුණේ නෑ. මං ඔයාට ඒ ගැන කොයිතරම් තේරුම් කරලා දෙන්න හැදුවද? ඇයි ඔයා තේරුම් නොගත්තේ?"

දැස් කඳුලින් පුරවාගෙනම ඉකි ගසමින් කතා කරනා ධම්මිකා දෙස විමලසේන බලා සිටින්නට විය.

"අනේ කෙල්ලේ. මං හිතලා නෙමෙයි එහෙම කරේ. මං ඔයාට අත ඉස්සුවේ මගේ හිතට ආපු දුකටයි කේන්තියටයි කෙල්ලෙ. ඔයා ඇයි අපේ සම්බන්දෙ නවත්තමු කියලා එක පාර තීරණය කළේ? මං කොහොමද ධම්මිකෝ ඔයා නැතුව ඉන්නේ? මට හිටියේ ඔයා විතරයි. ඔයා ඒක දන්නවා. ඒ ගහපු පාරකින් එහෙම විනාසයක් වෙයි කියලා හීනෙකින්වත් හිතුවේ නෑ. අනේ මට සමාවෙන්න ධම්මිකා"

එසේ පවසන ගමන් විමලසේන ධම්මිකාගේ හිස අතගාන්නට විය. එය ඇයට ආදර අස්වැසිල්ලක් වේ යැයි ඔහු සිතුවේ ය. එසැණින් ඇයගේ මුහුණත් විමලසේනගේ අතත් තෙත්කරමින් මහා ලේ ගඟක් ඇද හැළෙනු විමලසේන දුටුවේය. විමලසේන කලබල විය. දෑතින් ඇයගේ හිස වසා සිටින්නට තැත්කළේ ය.

ධම්මිකා, මේ ඒ තුවාල වුණ තැන නේද? කෝ යං අපි යමු බෙහෙත් දාන්න..කෝ එන්න.

ධම්මිකාගේ හිස මතින් ලේ වහනය වීම කොතරම් වලක්වන්නට විමලසේන උත්සාහ දැරූවද එය අසාර්ථක විය. ලේ වහනය තව තවත් වැඩි වී යන සේ පෙනිණ. ධම්මිකාගේ හිසත් කම්මුලත් වසා සිටි ලේ ගැලීම පසුව ඇයගේ මුළු සිරුරම වසා සිටින්නට විය.

ඔහු මහා හයියෙන් කෑ ගැසුවේ ය. ළිං බැම්මට දෑතින් පහර දෙමින් කෑගැසුවේ ය. ඉන් ඔබ්බට ඔහුට කිරීමට අන් දෙයක් නොවිනි. අවසානයේ ඔහු ඉන් මිදීමට හැකිතාක් වේගයෙන් දිව යන්නට විය.

මට සමාවෙයන් ධම්මිකා අනේ මට සමාවෙයන්.....

********************************

නිසල වූ පාළු ගුරු පාරේ නිහැඩියාව මරා දමා නිලන්ති මර විලාප නැගුවාය. අවට සීසීකඩ විසිරී ගිය තල බෝල යමෙකුගේ ලෙයින් පෙඟී ගිය අයුරු ඇය දුටුවාය. විමලසේනගේ නිසල නිරුවත් සිරුර පාර අද්දර වූ නිදිකුම්බා ගාලක් මත ලේ විලක් මැද තවමත් දෑස් හැර සිටින්නට විය.

**-සුධීර කෝරළගේ -**

(නිදහස් චතුරස්‍ර ශාඛාව)

# "ලියුම....."

කණාමැදිරි එළියක් විනා කිසිදු ආලෝකයක් නොමැති ගන අන්ධකාරයෙන් රජයන අඳුරු කුහරය තුළ මමත් මගේ සගයාත් මේ ගතකරන දෙවැනි රාත්‍රියයි. මමත් මගේ සගයා වු සාගරත් පොළොවෙන් මීටර කිහිපයක් ගැඹුරට විහිදී ගිය මේ බංකරය තුළට පිවිසියේ පෙරේදා මධ්‍යම රාත්‍රියේය. කෑමට සලාක පැකට්ටු කිහිපයක් හා වතුර බෝතලයක් පමණක් ඉතිරි වී තිබිණි. මෙහි ආවාට කවදා යන්නට ලැබේදැයි අප දැන සිටියේ නැත.පණපිටින් මෙතැනට ආවාට පණපිටින් මෙතනින් යන්නට ලැබේදැයි අප දන්නේද නැත. සමහර විට මේ ජීවිතය ගතකරන අන්තිම තත්පර කිහිපය විය හැක. මට දර්ශනී හා දරු දෙදෙනා සිහි විය. අවසන් වරට නිවාඩුවට නිවසට ගොස් පැමිණි දැන් මාස පහකි. දුවගේ පාසලේ ප්‍රසංගයට පැමිණෙන බවට ඇය මගෙන් පොරොන්දු ගත් සැටි මට මතක් විය. මට දරුවන් සිහිවී පපුවේ පැත්තක් රිදුම් දෙන්නට විය. මේ වන්නියේ යුද ගිනි දරුණුවටම ඇවිලෙන කාලයයි. සතුරන් මෙන් ම එකට සිටි සගයන්ද සිය ගණනක් එකා පිට එකා මැරී වැටෙනු දැකීම දැන් අපට අමුතු දෙයක් නොවේ. ගිය සතියේ මා සමග එකට බත්පත කෑ වසන්ත අද ජීවතුන් අතර නැත. ඉපදී මාසයක් ගත වූ තම කිරි කැටි පුතු බැලීමට සාලිය පණ පිටින් ගෙදර ගියේ නැත. නිවසේ සිට දෙපයින් ආ ජයවර්ධනට යළි නිවසට දෙපයින් යාගත නොහැකි විය...වාසනාවට මා තවම ජීවතුන් අතරය. එහෙත් මේ හුස්මපොද වාතලයට නිකුත් වන්නේ කිනම් මොහොතේ දැයි මම නොදනිමි. මම සාගර දෙස බැලුවෙමි. කවදත් නිහඬ චරිතයක් වූ සාගර නිසොල්මනේ ඔහේ කළු කුහරය වෙත දෑස් යොමා බලා සිටී. එකතැන එකට සිටියද අප දෙදෙනාට කතා කිරීමට නොහැකිය. හුස්ම ගන්නා හඬ මිසක වෙනත් කිසිදු හඬක් අප අතර නැත. සතුරන් කොහේ කොතැනක සිටිනවාදැයි අප දන්නේ නැත. අප අතරින් නැගෙනා හඬ සතුරාට අප සොයාග ැනීමට පහසුවක් වනු ඇත. සතුරන්ට හසු වෙනවට වඩා මියයාම සැපතකි.

සාගර..සාගර ගැන කතා කරන්නට බොහෝ දේ නැත. සාගර යනු අප කණ්ඩායමේ වූ අතිශයින් ම නිහඬ සොල්දාදුවා ය. සාගර යම් තරමකින් හෝ කතා කළේ මා සමග පමණි. මට වඩා අවුරුදු පහක් පමණ බාල වූ සාගර දකින විට මට සිහි වූයේ මගේ ලොකු මල්ලීවය. ලොකු මල්ලි මිය ගියේ රිය අනතුරකිනි. ඒ මීට දැවුරුද්දකට කලිනි. මට ලොකු මල්ලී හදිසියේ මතක් වී දෑස් තෙත් විය. මාගේ සෝ සුසුම ඇසීදෝ සාගර මා දෙස බැලුවේය. අඳුරේදිත් මාගේ තෙත දෑස ඔහු දකින්නට ඇත. සාගර මාගේ උරහිසට අත තබා මා අස්වසන්නට උත්සාහ කළේය. පවුල් බරක් නැති ඔහු මට වඩා වාසනාවන්ත යැයි විටෙක මට සිතුණි. සාගර පවුල්කාරයෙකු නොවීය. සාගරගේ පවුලේ

ඇත්තේ අම්මාත් අප්පච්චීත් නංගිත් පමණක් බව ඔහු මට විටෙක කියා ඇත. ඉතින් ඔහුට මට තරම් අතහරින්නට දෙයක් නොතිබුණු බව මට සිතුණි. මට දර්ශනීගෙනුත් දරු දෙදෙනාගෙනුත් තොර ලෝකයක් තිබුණේ නැත. මට අහිංසක නොදරුවන්ගේ මුහුණු මැවී පෙනෙන්නට විය. දරු පවුලෙන් මා වෙන් කළ කාලකණ්ණි යුද්ධයට මම සාප කළෙමි.

මම කල්පනාවෙන් මිදුණේ සාගර මගේ උරහිසට අත බර කළ නිසාවෙනි. මට ඔළුව උඩින් අඩි ශබ්දයක් ඇසුණි. නියත ලෙසම ඒ සතුරන් විය යුතුය. අඩි ශබ්ද ළඟ ළඟම ඇසුණි. සතුරන් දහයක පමණ පිරිසක් එතන වෙතැයි මම අනුමාන කළෙමි. මම අවිය මානාගත්තෙමි. බංකරයේ වූ කුඩා සිදුරෙන් ඉහළ බැලුවේ පැහැදිලිව ඔවුන්ව හඳුනාගැනීමටය. අටදෙනෙකුගෙන් යුතු පිරිසක් එතන විය. ඔවුන් දමිළ බසින් මොනවදෝ කීහ. ඔවුන් මදක් යන්නට හැර මම එක පිට එක වෙඩි වරුසාවක් වැස්සුවෙමි. සාගරද මගේ සහයට පැමිණ වෙඩි වරුසාවක් සතුරන් වෙත එල්ල කලේය. සතුරාට වඩා අප ඉක්මන් විය. අපි ඔවුන්ගේ පහර වලකමින් දිගින් දිගටම පහර දුන්නෙමු. හත් දෙනෙකු එකා මත එකා වැටී මරු තුරුලට විය. එකෙක් වෙඩි පහර කමින්ම පැන කැලයට වැදුණේය. සාගරත් මමත් තුවක්කුව මානාගෙනම කැලය ඇතුළට වැදුණෙමු. පැන ගිය සතුරා අපට සොයාගත නොහැකි විය.

අප යලිත් කඳවුර වෙත පිවිසියේ දින හතරකට පසුවය. සීරුම් තුවාල හැරෙන්නට අප දෙදෙනාම යහතින් විය. දින කිහිපයක් සටන් බිම යම්තාක් දුරකට නිහඬ විය. මටත් සාගරටත් නිවසට යාමට අවකාශය ලැබිණි. මා නම් ඒ පිළිබඳව සිටියේ තදබල ප්‍රීතියකිනි...දර්ශනීගේත් දරු දෙදෙනාගේත් මුහුණු දැකීම තරම් සතුටක් තවත් නැත. සාගර ද නිවසට යාමට සූදානම් වුයේ වෙනදාට වඩා සතුටිනි. සමහර විට ඒ පිටුපස වෙනදාට නැති හේතුවක් තිබිය හැක. දන්නා තරමින් සාගරට පෙම්වතියක සිටියේ නැත. සාගරට කිසි දිනෙක වරු ගණන් ඇමතුම් ලැබුණේ නැත. පෙම්බස් දොඩන්නට අහුමුලු හෙව්වේ නැත. ගෙදරට කතා කලත් ඒ විනාඩි කිහිපයක් පමණි. කණ්ඩායමේ සගයන් අතර සාගර ප්‍රසිද්ධ වූයේ තනියා යන අන්වර්ථ නාමයෙනි. මට විටෙක සාගර ගැන අනුකම්පාවක් දැනුණි. ඔහු අහිංසකයෙකි.

"තනියා...උඹට ගමේ කෙල්ලෙක් නැද්ද බන්...."

සාගරගෙන් ලද විවේකයක මම අසමි. මට අවැසි ඔහුව කතාවට අල්ලා ගැනීමටය. මන්ද ඒ අතිශය නිහඬ බවට මා කැමති නැත. විටෙක ඔහු තනි වචනයෙන් "නැහැ" ලෙස කියයි. ඔහු හැඟීම් විරහිත මිනිසෙකු ලෙස මට හැඟෙයි. ඔහු සියල්ල සිතේ සඟවාගෙන ජීවත්වන්නට උත්සාහ දරයි. සාගර ගුප්ත මිනිසෙකි. ඔහුව කියවීම අපහසු නොව කළ නොහැක්කකි. සාගරත් මමත්

කඳවුරෙන් සූදානම් කර තිබූ බස් රථයෙන් ප්‍රධාන බස් නැවතුමට පැමිණියේ එකටය. මම සාගරගෙන් සමුගෙන මොනරාගල බස් රථයට නැගුණෙමි. සාගර තිස්ස බස් රථය සොයා යන්නට ඇත.

දින දහය ගත වූයේ පැය දහයක් ලෙසය. මම නැවතත් කඳවුර වෙත පැමිණියෙමි. මා එන විටත් සාගර පැමිණ තිබිණි. කඳවුරෙන් යද්දී තිබුණ සතුට ඒ මුහුණේ නොවීය. එය ඔහුට පමණක් නොව සෙබල අප සැමට පොදුය. මට සාගරගෙන් ඒ පිළිබඳව අසන්නට සිතුණද මම එය නොඅසා සිටියේ කියන්නට නොහැකි හේතුවක් ඒ කනස්සලු මුහුණ පිටුපස තිබෙන්නට හැකි නිසාවෙනි.

කඳවුරට ආපසු අපිට ලැබෙන සතුටුදායකම දෙය නම් අපේ නමට ලිපි ලැබීමය. අපේ කණ්ඩායමේ සිටි හැමගේම නමට එකම ලිපියක් හෝ ලැබිණි. මූලස්ථානය කඳවුරේ සිට හෙලිකොප්ටරයෙන් ලියුම් රැගෙන එන දිනට කඳවුර පොර පිටියකි. තමාගේ ආදරණීයයන් එවන ලිපි ඔවුන්ගේ කටහඬක්වත් අසන්නට නොහැකි මායිමේ සිටිනා අපට මහමෙරකි. ඒ දිනයට සාගර හැරෙන්නට අන් සියල්ලන්ම ලිපි සමඟ කාර්යබහුලය. ඔවුන්ගේ මුහුණුවල සිනහව ඉතිරෙයි. සමහරක් බිරින්දෑවරුන්ගෙනි. සමහරක් අම්මාගෙනි. බොහෝ ලිපි පෙම්වතියන්ගෙනි. ලිපි බෙදන දිනයේදී සාමකාමීවම සිටින්නේ සාගර පමණි . සාගරට කිසිදු දිනෙක තමා නමට ලිපියක් ලැබුණේ නැත.

අවසන් වරට නිවසේ සිට කඳවුර වෙතට පැමිණි දා සිට කඳවුරට ලිපි ලැබෙනා පළමු දිනයේදී කා හටත් පුදුමය ගෙන දෙන දෙයක් විය. කවරදාවත් නැති ලෙස ලියුම් මල්ල දිග හරිනා තැනට සාගර පැමිණියේය. ඒ ඇස්වල බලාපොරොත්තුවක සේයාවක් විය. වෙනදා නැති තරම් ඒ ඇස් දිලිසිණ. "සමහර විට සාගරට දැන් ගමේ ගෑනු ළමයෙක් ඇති" විටෙක මට සිතිණි. එහෙනම් හොඳයි. සාගර එතරම් කඩවසම් නොවුණද කියන්නට තරම් රූපයක හෝ ගතිගුණයක වරදක් නොතිබිණි. ඉතින් ආදරයක රසය ඔහුටත් උරුමය. සගයන්ගේ විසුළු හමුවේ ඔහු ලිපි බෙදා අවසන කඳවුරෙන් ඈතට ගියේ බලාපොරොත්තු කඩ වූ විලසිනි. ඔහු බලාපොරොත්තු වූ ලිපිය නොලැබෙන්නට ඇත. මාස කිහිපයක්ම එය එසේ සිදුවිය. ඔහුගේ ජීවිතයේ කුමක් හෝ බලාපොරොත්තුවක සේයාවක් මම දුටුවෙමි. අවංකවම එසේ වෙනසක් සිදුවෙනවා නම් මම සතුටුවෙමි. මන්ද සාගර වැනි ගුප්ත තරුණයෙකු සාමාන්‍ය ලෙස ජීවිතය ගෙන යනවා දැකීමට මට අවැසි විය.

වන්නිකරයේ සටන් දරුණු විය. සතුරන්ගේ ප්‍රතිප්‍රහාර හමුවේ අපේ සගයන් බොහෝ දෙනෙක් අහිමි විය. මමත් සාගරත් ඉදිරි ආරක්ෂක වළල්ලේ සටන්

කළෙමු. සාගරත් මමත් ඇතුළු අට දෙනෙකුගෙන් යුතු පිරිස සතුරන්ට පහර දෙමින් ඉදිරියටම ඇදුණහ. එක්වරම අවට ගුගුලමින් සතුරු පහරක් එල්ල විය. මාව උඩින් විසිවී ගොස් අකුලකට වැටිනි. හිස් වැස්ම ගැලවී විසි විය. හිස යමක තදින් වැදිනි. මට මතක එපමණකි.

මා සිහිය ලබන විට සිටියේ ටෙන්ට් එකක් තුළය. කවුරුන් විසින් හෝ මා කඳවුරු භූමිය වෙත ගෙන එන්නට ඇත. හිස ඉදිකටු තුඩු දහස් ගණනකින් අනින්නාක් මෙන් ඇදුම් කන්නට විය. හිස වෙළුම් පටි යොදා වෙළා තිබිණි. මට හදිසියේ සාගරව සිහියට නැගුණි. මම අවට බැලුවේ කවුරුන්ගෙන් හෝ සාගර පිළිබඳව අසන්නටය. කපිතාන් විජයවර්ධන මා වෙත පැමිණියේය. මම යන්තමට හිස ඔසවා බැලුවෙමි.

"බණ්ඩාර...කොහොමද දැන් ..."

"මොකද වුනේ සර්...."

"ටෙරාලා මේ පාර තදටම ඇටෑක් කලා....අපේ බර ගාණක් ගියා..."

"සර්....කෝ සර් අපේ තනියා.... දැක්කෙ නෑනේ ...ටෙරාලා ඇටෑක් කරද්දිත් අපිත් එක්ක හිටියෙ..."

විජයවර්ධන සර් නිහඬවම සාක්කුවේ දෑත් රුවා ගත්තේය. මට මොකක්දෝ අමුත්තක් දැනුණි.

"සාගර නැති වුණා බණ්ඩාර...."

මට උන්හිටි තැන් අමතක විය. ඒ වචන විශ්වාස කළ නොහැකි විය. අවසාන මොහොතේත් ඔහු සිටියේ මා සමඟය.

"ස...ර්...."

"මං දන්නවා සාගර බණ්ඩාරගෙ යාළුවා කියලා. අපි ඉන්නෙ රට වෙනුවෙන් බණ්ඩාර....ජීවිතේ මේ මොහොතට විතරයි අයිති..ඊළඟ තත්පරෙත් අපේ නෙමෙයි ..."

මම හිස් දෑසින් ඔහේ බලා සිටිමි. මා හිරි වැටී ඇති සෙයකි. මට කපිතාන් විජයවර්ධනගේ වචන විශ්වාස කළ නොහැකි සේය. මට මහා හිස්කමක් දැනුණි. මා ජීවිතයේ දුටු නිහඬම මිනිසා අද යන්නට ගොසිනි. මහා බරකින් පපුව පිරුණි. අඬන්නට තරම් දුකකින් පපුව පෑරිනි. මා කැනපියෙන් පිටතට ආවේ සිහිනයෙන් මෙනි. පසෙකින් බිම දිගා කර ඇති මගේ මිනිසුන්ගේ සිරුරුය. මම ඔවුන් අතර මගේ නිහඬ මිතුරා සෙව්වෙමි. සාගර නුඹ ඒ අතර නිදා හුන්නේය. මම අවසන් වරට ඒ නිසල දෑත මා දෑතට සිර කරගතිමි. නිසල ඔබ මා සිත අතිශය සසල කර තිබිණි.

දෙසවන් අගුල් වට්ටමින් හෙලිකොප්ටරය කඳවුරු භූමියට ගොඩ බැවේය. මගේ මිනිසුන්ගේ නිසල දේහයන් හෙලිකොප්ටරය වෙත ගෙන ගියහ. සාගර නුඹ යන්නටම ගියේය. මා ගුවනට නැඟෙන හෙලිකොප්ටරය දෙස බොඳ වූ දෑසින් බලා සිටියෙමි. දේහයන් රැගත් හෙලිකොප්ටරයෙන් ගෙනා ලියුම් මල්ල වෙනදා මෙන් අදත් විවර විය. නම් එකින් එක කියවිණි.

"එස් .ඒ.සාගර සමරසේකර..."

මගේ ඇස් එසවිණි. කිසිම දිනක නොආ ඔහු බලා සිටි ලිපිය අද ලැබිණි. සාගර නුඹ බලා සිටියේ මේ ලිපිය එන තෙක් විය යුතුය. ලිපිය ගෙන ආ හෙලිකොප්ටරයෙන්ම නුඹ අවසන් ගමන් ගියේය. දෛවය මෙතරම් කුරිරු නොවිය යුතුය. සාගර වෙනුවෙන් මම ඒ ලිපිය අතට ගත්තෙමි. ජීවිතයේ ප්‍රථම වතාවට අනුන්ගේ ලිපියක් කඩා බැලුවෙමි. මගේ දෑස් වේගයෙන් මුතුවන් බෝල අකුරු මත දිවිණි.

"තෙරුවන් සරණයි...

ආදරණීය ලොකු අයියා වෙත,

ඇත්තටම ලොකු අයියාට මෙහෙම ලියුමක් එවන්න හිත හදාගන්න මට සෑහෙන කාලයක් ගත වුණා . මං මේ පිරිමි ළමයෙක් වෙනුවෙන් ලියන පළවෙනි ලියමන...මං හිතන විදියට ලොකු අයියාත් ගෑනු ළමයෙක්ගෙන් ලබන පළවෙනි ලියමන මේක වෙන්න ඇති...සමහර දේවල් ලියන්න මට ගළපගන්නත් අමාරුයි...ලොකු අයියා නොදන්නවා වුණාට ගියපාර ගෙදර ආව වෙලාවේ ලොකු අයියා කියපු දේවල්වලින් මම හොඳටම කලබල වෙලා හිටියේ...

ලොකු අයියා හොඳටම දන්නව මම නරක කෙල්ලෙක් නොවෙන බව...ලොකු අයියා කවදා ඉඳල මං ගැන බලාපොරොත්තු තියාගත්තද කියන්න මම දන්නෙ නැහැ...ඒත් මට හැමදාම ලොකු අයියගෙ මූණ බලද්දි මං ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා කියලා යන්තමට තේරිලා තිබුණේ.. පුංචි කාලේ ඉඳන්ම ලොකු අයියා මට බොහොම ළෙන්ගතුයි...නැන්දයි මාමයිත් එහෙමයි...සාගරිකා නංගි වුණත් මට සැලකුවේ එයාගෙම අක්කට වගේ...මතකද ලොකු අයියට...නමයෙ පන්තියෙදි ඉස්කෝලෙ ඇරිලා එද්දි හන්දියෙ කඩේ හිටපු කොල්ලෙක් මට නොහොබිනා විහිළුවක් කළා කියලා ලොකු අයියා ඒ කොල්ලට හොඳටෝම තඩි බෑවා.. එදා ඉඳන් ගමේ එක කොල්ලෙක් නෙමෙයි මට වචනයක් කිව්වේ....ලොකු අයියා ඒ කාලේ ඉඳලම මාව හරියට පරිස්සම් කළා...ඒ විතරක් නෙමෙයි ලොකු අයියට මතකද පුංචි සන්දියෙ පහළ වෙලේ ඇලේ වතුර වැඩි කාලෙක මාව ගහගෙන යන්න හදපු වෙලේ ලොකු අයියා තමයි හනිකට වතුරට පැනලා මාව ගොඩට ගත්තෙ...මට ඒ දේවල් තාම හොඳට මතකයි...

ලොකු අයියා එදා ඕවිටේදි හම්බෙලා දෙයක් කියන්න තියෙනව කිව්ව වෙලාවෙ මගෙ හිත ගැස්සුණා...මොකද ලොකු අයියා දෙයක් ආවාට ගියාට කියන මනුස්සයෙක් නෙමෙයි නේ...ලොකු අයියා මං ගැන බලාපොරොත්තුවෙන් ඉන්නවා කියලා කිව්ව වෙලාවේ මට හිතාගන්න බැරුව ගියා මම කියන්න ඕන මොකක්ද කියලා...ඒ වෙනකොටත් අම්මලා කපු මහත්තයෙකුට කියලා තැන් දෙක තුනකින් මට මංගල යෝජනා ගෙනල්ලා තිබුණෙ...අප්පච්චි බල කරලම කිව්වා ඒ යෝජනාවලින් එකකට මට කැමති වෙන්න කියලා...ලොකු අයියා හොඳටම දන්නවා අපේ අප්පච්චිගේ හැටි..දෙයක් කිව්වොත් කිවුවොත් කිවුවම තමයි...අම්මටවත් ඒ දේවල් කතා කරලා වෙනස් කරගන්න බැහැ..මම ලොකු අයියා මගෙන් කැමැත්ත අහපු වෙලාවෙ ගත් කටටම බෑ කියල කිව්වෙ ඇවැස්ස නෑනයි මස්සිනයි වෙච්ච අපි දෙන්නට කසාදයක් කරගන්න අප්පච්චි කවදාවත් කැමැත්ත නොදෙන හින්දා...ලේ නෑකම් කසාදෙ යා දෙන්නේ නෑලු...හම්බවෙන දරුවො අංගවිකල වෙනවලු..අනේ මන්දා ඕවයෙ ඇත්ත නැත්ත...සරෝජනීත් ලොකු අයියගෙ යෝජනාව ගැන දැනගත්ත ගමන්ම මට කිව්වේ කිව්වේ නෑනයි මස්සිනයි වෙච්ච අපි දෙන්නට ගෙදරින් කවදාවත් කැමැත්ත දෙන්නේ නැති වෙයි කියලා...එයාලගෙ නෑ වෙන අක්කා කෙනෙකුත් ඔහොම කසාද බැන්දලු එයාගේ මස්සිනාව.. ගමේ ඇයො හරියට කයි-කතන්දර කිව්වලු...ගෙවල් විරසක උනා ලු...අන්තිමට දෙන්නා තනි තීරණයක් අරන් එක වහලක් යටට උනාලු ...දැන් කසාද බැඳලා නෑ දැවුරුද්දක් ලු...හරි අපූරු කොලු පැටියෙක් ඉන්නවලු...ගෙවල්වලිනුත් දැන් විරසකයක් නැලු...ඒ දෙන්න දෙන්න දෙමහල්ලෝ ගෙයක් දොරක් හදාගෙන සතුටින් ඉන්නවලු දැන් ....

ලොකු අයියා කීප වතාවක්ම නිවාඩුවට ගෙදර ආව වෙලාවෙ මගින් මගටම මගෙන් කැමැත්ත ඇහුවට මං උත්තරයක් නොදුන්නෙ ගෙදර අය ගැන හිතලා...නැන්දයි මාමයි මේකට මනාපය කියලා මම දැනගෙන හිටියා...ලොකු අයියා කිව්වනේ ගෙදර ගැන ලොකු අයියා බලාගන්නම් කියලා....ලොකු අයියාගේ හිතේ තියෙන ළෙන්ගතුකම මට නොදැනෙනවා නෙමෙයි....ඒත් මම ලොකු අයියයි ගෙදරයි අතරෙ අතරමං වෙලා...කාව තෝරගන්නද කියලා හිතාගන්න මට බැරි වෙලා තිබුණේ...ලොකු අයියා හමුදාවේ නිසා අපේ ගෙදරින් මේකට කැමැත්ත දෙන්නේ නැති වෙයි කියලා මගේ හිත නිතරම කිව්වා...ඒකමයි මම අම්මත් එක්ක මේ ගැන කතා කළේ....මුලදි නම් ගත් කටටම අම්මා කිව්වේ මේක සිද්ධ වෙන දෙයක් නම් නෙමෙයි කියලා...ඒත් මං අම්මට බල කරලම කිව්වා ලොකු අයියා මං ගැන තියෙන ආදරේ ළෙන්ගතුකම ඇත්තම ඇත්තක් බොරුවක් නෙවෙයි කියලා...ලොකු අයියා පුංචි කාලේ වගේම පරිස්සමට මාව බලාගනියි කියලා මං අම්මට කිව්වා...අම්මත් ලොකු අයියා ගැන නොදන්නවා

නෙවෙයි නේ...අප්පච්චි වුණත් ලොකු අයියට මනාපයි...හැබැයි ඒ මගේ සහෝදරයෙක් විදියට. අම්මට මම නිතරම පෙරැත්ත කළාට පස්සෙ අම්මා කිව්වා දෙන්නට එකට ඉන්න පුළුවන් නං ඒකට අම්මගෙ අමනාපයක් නෑ කියලා.. අප්පච්චිට අම්මා තමයි හිමිහිට මේ ගැන කියලා තිබුණෙ...මුලදි නම් දෙතුන් දොහක් යනකල්ම අප්පච්චි මයෙත් එක්ක කතා බහ කළෙත් නැහැ ...ඒත් කල් යද්දි යද්දි අප්පච්චිටත් තේරෙන්න ඇති...අප්පච්චි දවසක් මට දවසක් මට කතා කරලා කිව්වා ඊළඟ පාර නිවාඩුවට ලොකු අයියා ගෙදර ආවහම අප්පච්චිලත් එක්ක මේක ගැන කෙළින්ම කතා කරන්න එන්න කියන්න කියලා...මං මේක ලියන්නෙත් ඒ සතුටෙන්මයි ලොකු අයියේ...ඊළග නිවාඩුවට ගෙදර ආවහම ලොකු අයිය එන්න අප්පච්චිලත් එක්ක අපි ගැන කතා කරන්න... එනකොට මතක් කරලා ලොකු අයියාගේ හඳහන් කොපියක් අරන් එන්න...අප්පච්චි දෙන්නගෙ වෙලාවල් බලවන්න ඕනේ කියලා කිව්වා....

ලොකු අයියට නිවාඩු තියෙන්නෙ ආයෙ කවදද....ගෙදර ආවාම මාව බලල යන්න එනවා නේද..යුද කලබල අස්සේ ලොකු අයියට මට ලියන්න වෙලාවක් හම්බ වෙන එකක් නැහැ...ඒත් පුළුවන් නම් මේ ලිපිය ලැබුණු සැණින් මට ලියුමක් ලියලා එවන්න...අපේ නරක කාලෙ ගෙවිල ඉවරයි...මං ලොකු අයියට කැමැත්ත දෙන්න පමා උනාට මට සමාවෙන්න...ලොකු අයියා ඉන්නේ ඒ ගැන දුකෙන් කියලා මං දන්නවා....දැන් ලොකු අයියට දුක් වෙන්න දෙයක් නැහැ...දැන් අපිට ඉක්මනට අපේ වෙන්න පුළුවන්....ගෙදරින් අකමැත්තකුත් නැහැනේ..මාත් ආසයි ඉක්මනට අයියගේ මනමාලි වෙන්න...ඒ දවස එනකන් මං ඇඟිලි ගනිනවා...රට රකින විරුවෙක් මගෙ මහත්තයා වෙන එක ගැන මං ඉන්නෙ ආඩම්බරෙන්...අයියා පරිස්සමින් ඉන්න... මම ආයේ ඉක්මනින් ලියුමක් එවන්නම්...ලොකු අයියාට දළදා හාමුදුරුවන්ගේ පිහිටයි....පරිස්සමින් ඉන්න..

මේ ඔයාගෙම සුදු නංගි,

යශෝධා .

මගේ උගුරේ යමක් සිර වූවාක් මෙන් මට දැනුණි...මගේ කඳුළින් බොඳව ගිය ලිපිය හතරට නවා මම සාක්කුවේ රුවා ගතිමි...

**- ආර්.එම්.එම්.පී. රාජපක්ෂ -**

(කොච්චිකඩේ ශාඛාව)

# "කැර(ළ)ලිකාරයෝ "

වේගයෙන් දිව ආ ඉන්දියන් සාගරයේ රළ පහරක් ගල් ගෙඩියක් මත වැදී මහා ඝෝෂයක් නංවමින් බිඳී ගියේය. එයින් ඉවතට විසි වූ ජල පහරක් චිරිස් හඬ නගමින් අපේක්ෂ ගේ මුහුණ හරහා පතිත විය. රැවුල් ගස් අතරින් සීතලට වතුර බිඳු රූටා යත්දී තොලට අප්පිරියා සහගත ලුණු රසක් දැනෙන්නට විය. මුවෙහි වූ කුණු කෙළ රස සමග කළවම් වූ ඒ රසය ඔක්කාරයක් ගෙන ආවේය. අමාරුවෙන් දෑස් විවර කරන්නට තැතනූ ඔහුට උදෑසන හිරු රශ්මිය දෑස තුළට කාවැදුණේ ශල්‍යාගාරයක් තළ රෝගියෙකු සිහි නැති කරන්නට එල්ල කළ විදුලි පහනක එළිය මෙනි. ඔහු දෑස පියාගෙන තවත් විනාඩියක් ගත කළේය. මෙම ජල පහර ඔහුගේ පහුගිය වසර කිහිපය පුරා උදෑසන ඔහු අවදි කරන එලාමය මෙන් ක්‍රියා කරයි. ගාලු මුවදොර පිටිය වටා කණුවල එල්ලුණු ධජ සුළඟින් ලෙළදුන්නේ ස්වංක්‍රීය තුවක්කුවකින් උණ්ඩ නිකුත් වෙනවාක් මෙන් පට පට හඬ නංවමිනි. ඒ හඬ ඔහුට අනපේක්ෂිත බියක් ගෙන ආවේය. යන්තම් දෑස් විවර කළ ඔහුට ආයුධ දරා සිටින යුද හමුදා සෙබළුන් හතර වට සැරිසරනු දක්නට ලැබුණි. එය එතරම් නුපුරුදු දසුනක් නොවුණත් ඒ ප්‍රමාණය අද හතර පස් ගුණයකින් වැඩි වී ඇත. කෑමට යමක් සොයාගැනීමට වන් ගෝල් ෆේස් අවන්හල්වලින් ඉවත් කරන කෑම බාල්දි පිරික්සීම අරමුණු කොටගනිමින් ඔහු නැගිට්ටේය.

අරගල භූමියේ දැවැන්ත පිළිරුවක කටවුට් එකක් ඉදි කිරීමට චීන ජාතිකයින් පිරිසක් කඩියන් මෙන් දුව පනිනු ඔහු දුටුවේය. ඒ හාම හමුදා බණ්ඩයක් රැගත් බෆල් රථයක් හඬ නංවමින් ඇදී ගියේය.

එදින පාන්දර ජාමයේ ඔහු සිටියේ බණ්ඩාරනායක පිළිරුව අසළ තාවකාලික මඩුවේය. පාන්දර ගාලු මුවදොරින් හමන සීතල සුළඟට අතපය හකුළුවාගෙන නිදිබර දෑස පියවෙන්නට නොදී අමාරුවෙන් ඇරගෙනය. හතර වටින්ම රළ නඟාගෙන එන්නාක් මෙන් හමුදා භටයන් කඩාගෙන පැන්නේ ඒ මොහොතේය. තුවක්කු බටය හිසට තබා අත්දෙක හිසමත තබා ඔළුව දණහිස අස්සේ හොවාගන්නට අණ කළ අතර කූඩාරම් හුළගේ ගසාගෙන යන අයුරු දෙකකුල් අතරින් ඔහු දුටුවේය. අනතුරුව කොන්දට වැදුනු බූට් පහර මතක් වීමෙන් දැනුත් ඔහුගේ දෙපා හිරි වැටී ගියේය.

රූටමින් මෙන් ගෝල්ෆේස් අවන්හල් දෙසට ගාටමින් ගිය ඔහුට කුණු බාල්දි සියල්ල පවා ඉවත් කර තිබුණෙන් බඩට යමක් දමා ගැනීමට නොහැකි වන බව දැනීමෙන් හීන් බඩගින්නකින් කුස දැවී ගියේය. චීන කොඩි පට පට ගා රැළි නගන විට ජනාධිපතිවරයාගේ රුව ලයිට් කණු පුරා බැබළුනේය.

උදෑසන අව් රශ්මිය වෙනදාට වඩා දැනුණෙන් ඔහු පොල් ගසක් මුල ඇන තියාගත්තේය. විවෘත කිරීමට සූදානම් වන පෝර්ට් සිටියේ කටයුතු ලහි ලහියේ සිදු වන අයුරු ඔහුට පෙනුණේය. මෙරට තරුණයන්ද ගොඩනැගුමට පැතුවේ එවැනි සිහින රාජ්‍යයකි. අහම්බයෙන් වුවද ඒ ක්‍රියාවලියේ කොටස්කාරයෙකු වීම පිළිබඳව ඔහුට සතුටක් දැනුණේය.

ඔවුන් සිටියේ රාජ්‍ය බලය දිනා ගත් කැරලිකරුවන් මෙන් ප්‍රීතියෙනි. සමස්ත සමාජයම ඔවුන්ගේ පිටුපසින් සිටියෝය. නන්දෙසින් පිරිස් දිනාපතා ඔවුන් දකින්නට පෙළපාළි මගින් අරගල භූමිය කරා පැමිනුණෝය. අපේක්ෂ එම පිරිස්වල නොමඳ පැසසුමට හා ඇගයුමට ලක් වූවෙකි. එකල කෙල්ලෝ පමණක් නොව කොල්ලෝද වැඩි මහල්ලෝද ඔහු හා සෙල්ෆි ගැසුවෝය. තව ටික දිනකින් ඉදි වන සිහින රාජ්‍ය පිළිබඳ දහසක් අපේක්ෂා අරගල භූමියේ පිරිස් වෙත වූ අතර එම පිරිස අතර ගැවසීමෙන් තමාටද එම අරමුණු කා වැදෙන බව ඔහුට දැනුණේය.

"ඒ දවස් වල අපි හිටියේ බෙල්ලන්විල කැලේ උදේ පාන්දර ඉඳන් අපේ එවුන් පොලිසිවලට ගහලා පොලිසි අල්ලගන්නවා කියලා තොරතුරු එනවා. අපි හිතුවේ අපි සමාජවාදේ ස්ථාපිත කරලා ඉවරයි කියලා. හෙට ඉඳන් සමාජවාදී රටක හැමෝටම සමාන අයිතිවාසිකම් යටතේ සතුටෙන් ඉන්න ලැබෙයි කියලා. ඒත් ඒ හීන අපේ දෙපා ළගම බිඳිලා ගියා. මම හිතන්නේ නෑ ආයෙත් ඒ වගේ දවසක් එයි කියලා."

තාත්තා කියන්නට ඇත්තේ මෙවැනි දවසක් පිළිබඳව බව අරගල භූමියේ ඇවිදින ඔහුට දැනුණේය.

"ඒත් පුතේ ඒකෙන් පස්සේ ඔක්කොම වෙනස් වුණා. ගොඩක් අයට මැරුම් කන්න වුණා. අනික් අය හිරගත වුණා. ඒ හින්ද අපි වගේ අයට ජීවිතෙන් භාගයක් නැති වුණා. නොවිදිනා දුක් විඳින්න වුණා. පාලකයන්ට විරුද්ධව යන එක හිතන තරම් ලේසි නෑ. මොකද උන් ඉන්නේ අපි අතරම. විවිධ වේශයෙන් උන් අපි අතරම ඉන්නවා. ඒ ඉන්න උන් අඳුනගන්න හම්බ වෙන්නේ ඔක්කොම විනාශ වුණාට පස්සේ. ඒ හින්ද උඹලගේ ජීවිත කාලේ නම් ඒ වගේ දේවල්වලට සම්බන්ධ වෙන්න එපා."

තාත්තාගේ ඒ වදන් තමන්ට අමතක වූයේ කොයි මොහොතේදැයි අපේක්ෂට දැනුදු සිතාගත නොහැකිය. අනෙක් අතට තමන් එලෙසින් මේ කිසිවකට සම්බන්ධ වූයේද නැති වග ඔහුට කල්පනා විය. ඒ සියල්ල මහා අහම්බයක ප්‍රතිඵලයක් නොවේදැයි ඔහුට දැන් සිතේ. මේ ලෝකයේ සියල්ල අහම්බයන් නොවේද? හරියට එය අමරකීර්ති සර්ගේ අහම්බකාරක නවකතාවේ අහම්බයන් මෙනි.

අපේක්ෂ ජීවත් වූයේ මහරගමය. මහරගම ගම්මාන පාරේ නිවස ඔහුට පවුලෙන් හිමි වූවකි. අම්මාත්, තාත්තාත්, සහෝදරියකුත් සිටි නිවසේ ඔහු බාලයාය. අපේක්ෂගේ පියා 71 කැරැල්ලට සම්බන්ධවීම නිසා නොවිඳිනා දුක් විඳි හොඳ හදවතක් හිමි වාමාංශිකයෙකි. වැඩිමහල් සහෝදරිය විවාහ වී විදේශ ගතවීමත් දෙමාපියන්ගේ අභාවයත් සමග ඔහු නිවසේ තනි විය. ගලා යන සමාජ ප්‍රවාහයත් සමග ගලා ගිය ඔහුට විශේෂ ප්‍රශ්න තිබුණේ නැත. ජීවනෝපාය වශයෙන් ස්ථිර යමක් නොකළද ජීවිතය පවත්වාගෙන යාමට අවශ්‍ය තරමේ යමක් සොයා ගැනීමට ඔහුට නොහැකි වූයේ නැත.

එහෙත් සමාජයේ අන් අයට ජීවිතය එසේ පහසු වූයේ නැත. නව රජයක, නව ජනාධිපතිවරයෙක් යටතේ රට වැසියන් දුටු සිහින සුන් වෙමින් තිබූ කාලයකි. ඒ නිසා සතරවටින් ජන පීඩනය උත්සන්න වෙමින් පැවති සමයකි. දිනපතා ජන උද්ඝෝෂණ, ශිෂ්‍ය අරගල නිමක් නැතිව පැවති සමයකි. රජය රසායනික පොහොර ගෙන්වීම නතර කිරීමට ගත් තීරණයක් සමග කෘෂිකර්මාන්තයේ මහත් අර්බුධ රාශියක් පැන නැගුණු අතර ජනාධිපතිවරයාට විරුද්ධව විරෝධතාවන් උත්සන්න විය. ජනාධිපතිවරයාට ගෙදර යන ලෙස සඳහන් ෆේස් බුක් පෝස්ටුවක් නිර්මාණය කළ තරුණයකු සිරගත කිරීමත් සමග ජනාධිපති කාර්යාලය අසල තරුණ පිරිස් කඳවුරු බැඳ විරෝධතා දක්වන්නට වූ අතර එය රැල්ලක් මෙන් රට පුරා පැතිර යමින් බොහෝ පිරිස් කඳවුරු භූමියට රැස්ව විරෝධතාවන්ට සම්බන්ධ වූහ.

රටේ පැවති වාතාවරණය දිනෙන් දින උණුසුම් වූවද අගනුවර ආසන්නයේ සිටි අපේක්ෂට එය එතරම් දැනුණේ නැත. දෛනික ජීවිතයේ කොටසක් ලෙස පුවත්වලට සවන්දීම හැරෙන්නට ඒ පිළිබඳව ඔහුට එතරම් උනන්දුවක් පැවතියේද නැත.

ඒ දෛවෝපගත දිනය උදා වූයේ මේ සිදුවීම් අතරය. ජනාධිපති කාර්යාලය අසල රැඳී සිටි තරුණ පිරිස්වලට මැරයන් පහරදීම හේතුවෙන් සමාජය මහත් කැලඹීමකට පත් විය. දහස් ගණන් ජනී ජනයා අගනුවරට සේන්දු වන්නට වුහ. සමහරුන් ඇඳිවත පිටින් දුව එන්නට විය. වැඩ කරමින් සිටි පිරිස් ඒ සියල්ල අතැර කොළඹට දිව එන්නට වූහ. මහරගම නගරයට ගොස් සිටි අපේක්ෂද කොටු වූයේ එවැනි පිරිසක් වෙතය. නගරයේ සියල්ලෝම අහුවුණ අහුවුණ වාහනවල නැග කොළඹ එන්නට පිටත් වූහ. ඒ යන වාහන වලට කැමැත්තෙන්ම ගොඩ වූවෝ මෙන්ම බලයෙන් ඇද දමාගත් පිරිස්ද වූහ. සමහරුන් ගොඩව සිටියේ සිදු වූයේ කුමක්දැයි හෝ යන්නේ කොහිදැයි පවා නොදැනය.

"යමු...යමු මල්ලී අද යන්නැතුව වෙන කවදා යන්නද?....අද නම් ඕකුන් රජ මාලිගෙන් එළියට විසි වෙනවා."

ත්‍රීවිල් පාක් එක ස්වෙච්ඡාවෙන් සංවිධානය කළ ත්‍රීවිල් රථයකට අපේක්ෂද ඔබාගත්තේය.

හයිලෙවල් මාර්ගය වාහනවලින් පිරී තිබූ අතර සමහර පිරිස් ස්වේච්ඡාවෙන්ම ඉදිරිපත් ව වාහන හැසිර වූහ. තවත් සමහරු දන්සැල් සංවිධානය කොට මග යන්නන්ට සංග්‍රහ කළෝය. රටම වෙළී තිබුනේ අරගල සැණකෙළියක ය.

අතරමග එද්දී විකාශනය වූ පුවත්වලින් කියැවුණේ අරගලකරුවන් රජයේ මර්මස්ථාන එකිනෙක අත්පත් කරගන්නා බවයි. ජනාධිපති ලේකම් කාර්යාලය අත්පත් කරගත් ඔවුන් ඊළඟට ජනාධිපති මන්දිරයට ගොස් ජනාධිපතිවරයා අල්ලාගැනීමට ක්‍රියා කරන බව පුවත් විකාශය විය. ඒ සෑම පුවතක් සමගම මහා ඔල්වරසන් හඬ දසත රැව් දුන්නේය.

රථ පෙළපාලිය හැව්ලොක් ටවුම පසුකොට පොලිස් ක්‍රීඩාංගණය අසලට එන විට තවදුරටත් සෙලවිය නොහැකි පරිදි පාර පුරා වාහන ඇසිරී තිබිණ. පිරිස් වාහන එතනම අතැර දමා මහ මගට බැස ඉදිරියට යන්නට වූවෝය. අපේක්ෂද ත්‍රීවීලයෙන් බැස ඔවුන්ට එක් විය. තුන්මුල්ල හංදියට එන විට ඒ මහා ජන ප්‍රවාහයට හසුව ඔහු බෞද්ධාලෝක මාවතට පිවිස සිටියේය. තල්ලු වුණු මහා සෙනග අතරින් ඔහුද රූපවාහිනී සංස්ථාව ඉදිරියට ඇදී ගියේය. රූපවාහිනී සංස්ථාව ඉදිරිපිට ස්වේච්ඡාවෙන්ම අත්වැල් බැදගත් තරුණ පිරිසක් පේළියට සිටගෙන අනෙකුත් ජනයාට ඇතුළුවීම වළක්වා සිටියහ. රැස්ව සිටි අසීමිත ජනයාද ඔවුන්ගේ බසට අවනතව සීරුවෙන් සිටියහ. ජන සන්නිපාතයේ තල්ලුවෙන් අපේක්ෂද තල්ලු වී පිරිස ඉදිරියෙන්ම සිටියේය.

මග දිගට නොයෙකුත් තැන්වලින් ලද දන්සැල් සංග්‍රහ නිසාම අපේක්ෂට දැඩි මුත්‍ර බරක් හැදී තිබූ අතර එය තවදුරටත් ඉවසිය නොහැකි මට්ටමට පැමිණ තිබිණ.

රූපවාහිනී සංස්ථාව ඉදිරිපිට බැම්මට නැගුනු එක් තරුණයෙක් නිවේදනයක් කිරීමට සුදානම් වීමත් සමග පිරිස මීයට පිම්බාක් මෙන් නිසසල විය.

"මේ දැන් අපේ රටේ මහජනතාව රටේ පාලකයා ජීවත් වුණු මහා මන්දිරය අල්ලා ගනු ලැබුවා. ඒ වන විටත් ඒ බියගුල්ලා පලා ගිහිල්ලා මහජනතාවට ජය වේවා....."

රැස්ව සිටි පිරිස ප්‍රීති ඝෝෂා නගමින් ප්‍රීති වූ හඬින් අවට පරිසරය වෙව්ලා ගියේය. ඒ හඬින් අපේක්ෂගේ චූ බර තවත් වැඩි විය.

ඔහු සෙමින් අත්වැල් අල්ලමින් සිටි තරුණයන් අසලට ළඟා වීය.

"අයියේ.....අයියේ කොහෙද යන්නේ" තරුණයන් ඔහු වළකාලීය.

"නෑ.... මල්ලි පොඩි හදිසියක්....." ඔහු ආංගික අභිනයෙන් ඔහුගේ අපහසුතාවය කියා පෑවේය.

"හරි...හරි එහෙනම් ඉක්මනට ගිහිල්ලා එන්න. දැන් අරගලේ අය ලයිව් යන්න හදන්නේ."

ලද අවසරයෙන් ඔහු ඉක්මනින් රූපවාහිනියේ වැසිකිලියකට රිංගා ගත්තේය. එහි අවසන ඔහු මහා සුවයක් වින්දේය. එයද මහා අරගලයකින් ජයග්‍රහණය කළා වැන්න.

එළියට පැමිණි ඔහු වට පිට බලන විට ඉදිරියෙන් තිබුනේ ප්‍රවෘත්ති මැදිරියයි. දිනපතා තමන් දකින ප්‍රවෘත්ති විකාශනය වන තැන දැකීමට ඔහුට මහත් ආශාවක් පහළ විය. ඔහු සෙමෙන් එහි දොර විවර කර යන්තමට ඔළුව එබුවේය. හරි..හරි දැන් ලයිව් යනවා. කිසිවෙකු ඔහු අල්ලා පුටුවක ඉන්දවීය. එසැනින් ආලෝක ධාරා රැසක් දැල්වුන අතර කැමරා මුහුණත් රැසක් ඔවුන් දෙසට යොමු විය. එතැන ඔහුත් සමග තවත් තිදෙනෙක් හිද සිටි අතර එයින් මැද සිටි රැවුල වවාගත් තරුණයා පාලකයන්ගේ අයහපත් පාලනය හේතුවෙන් පීඩාවට පත් ජනතාව හා තරුණයන් අරගලයක් ආරම්භ කළ බවත් එම නිරායුද අරගලකරුවන්ට ම්ලේච්ඡ ලෙස පහරදීම හේතුවෙන් මහජනතාව පාලකයන් එළවා දමා පාලන බලය අල්ලාගත් බවත් මෙතැන් සිට රූපවාහිනියද අරගල කරුවන් අත්පත් කරගත් බවත් ඉතා නොබෝ දිනකින් ජනතාවගේ පාලනයක් බිහි වනු ඇතිබවත් ප්‍රකාශ කළේය.

සජීවී විකාශය එසේ නිමාවන විට සියලු රටවැසියන් රූපවාහිනී අසල පොර කමින් රැඳී සිටි අතර ප්‍රීති ඝෝෂාවන්ගෙන්ද රතිඤ්ඤා හඬින්ද මුළු අගනුවරම ගිගුම් දෙමින් පැවතියේය. රූපවාහිනී මැදිරියේ සිටි අය සමග අපේක්ෂටද එළියට එන්නට සිදු වූ අතර ඒ වන විටත් ඔවුන් රූපවාහිනිය හරහා රටේ සියලු ආලින්දයන්,කඩපිල් වෙත ගමන් කර තිබුණි. ඔවුන් එළියට එන විටම වටවූ පිරිස් විසින් ඔවුන් කර මත තබා ගනිමින් පෙළපාලියෙන්ම ගෝල්ෆේස් පිටියේ අරගල භූමිය වෙත රැගෙන ගියහ.

වන් ගෝල් ෆේස් අවන්හල් අසලින් කෑමට යමක් සොයා ගැනීමට නොහැකි වූ ඔහු පෝර්ට් සිටිය දෙසට යන්නට වත් නැගිට්ටේය. අරගල භූමියේ වූ දන්සලෙන් කී දෙනෙකුට නම් කුසපුරා කෑම ලබා දුන්නේද යන්න ඔහුට සිහි විය.

රූපවාහිනියේ සිදුවීමෙන් පසු ඔහු අරගලයේ කැපී පෙනෙන සාමාජිකයෙකු විය. දවසින් වැඩි කාලයක් ගත් වූයේද අරගල භූමියේය. සිය පියා විසින් සම්බන්ධ වූ අරගලයට හාත් පසින්ම වෙනස් තාක්ෂණික යුගයක සිදුවන මෙම අරගලයෙන් යහපත් සමාජ වෙනසක් සිදු වනු ඇතැයි ඔහු මෙන්ම රටේ සියලුම පොදු මහජනතාව ඇදහූහ.

අරගල භූමියෙන් පිටත්ව අපේක්ෂ හයිලෙවල් පාරට පිවිසියේ මහරගමට යන රෑ එකොළහේ අන්තිම බසය අල්ලා ගැනීමටය. ලේක් හවුස් නැවතුමට ඔහු එන විටත් ප්‍රදේශය පාළුවට ගොස් තිබුණේය. දහවලට කොපමණ කාර්යබහුල වූවද කොළඹ රාත්‍රියට බලු බල්ලෙක් නැති අමු සොහොන් පිටියකි. බස් නැවතුමේ ඒ වන විටත් සිටියේ තරුණ යුවලක් පමණී.

"ආ.....අයියේ "... ඔහු දුටුවනම ඔවුන් සිනා මුසුව කතා කළහ.

"මල්ලිලා මේ රෑ වෙලා කොහෙ යන්ඩද?"

"අපි රත්නපුරේ ...අරගලේට පොඩි සපෝට් එකක් දෙන්ඩ ආවා. දවස් කීපයක් ඉන්ඩත් හිත ඒත් අයියේ කොළඹ අපිට ඉන්න තැනක් නෑනේ. ආයේ හෙට අනිද්දට එනවා."

එකල රට වටින් තරුණ තරුණියෝ පමණක් නොව මහල්ලෝ පවා පැමිණ අරගල භූමියේ දින කිහිපයක් නතරව ස්වේච්ඡාවෙන් රැඳී සිටිමින් සේවය කළහ.

පාරේ ගමන් කළ වෑන් රථයක් නතර වූයේ බස් නැවතුමේ සිටි ඔවුන් දැකය.....කොට්ටාව...කොට්ටාවට යන්න පුළුවන්..

අපේක්ෂට එම රථයෙන් ගමන් පහසුව සලසා ගත හැකි වුවත් ඔහුට ආගන්තුක යුවල බස් නැවතුමේ දමා යන්නට සිත් නොවීය.

"මල්ලී දැන් රත්නපුරේට බස් නෑ.....අද යමු අපේ ගෙදර නැවතිලා හෙට යන්ඩ."

අරගලයට කෑම රැගෙන පැමිණි තරුණ පිරිසක් වූ ඔවුන් සමග මහරගමට යන්නට ඔවුන්ට හැකි වූ අතර රූපවාහිනිය අල්ලාගත් පිරිසේ සාමාජිකයෙකු වූ අපේක්ෂ හඳුනාගැනීම ඔවුන්ට මහත් ආඩම්බරයක් වූ අතර ඔවුන් සමග සෙල්ෆි ඡායාරූප රැසකට පෙනී ඉන්නටද ඔහුට සිදු විය. මහරගමින් තරුණ පිරිස වෙන් වුයේ රාත්‍රී ආහාරය සඳහා කෑම පැකට් කිහිපයක් ද ඔවුන් වෙත පිරිනමමිනි.

"බලන්ඩ අයියේ මේ දේශපාළුවෝ අපි කොච්චර නම් දුරස් කරලද තියලා තියෙන්නේ. ආයේ උන්ට ඒ සෙල්ලම් මේ කපේදී හම්බ වෙන්නේ නෑ...."

"මම විතරයි මෙහෙ ඉන්නේ මල්ලිලා ඕන තරම් කාලයක් මෙහෙ ඉන්න."

අරගලවාසීන්ට තම විරෝධයන් කරගෙන යා හැකි වූයේ කිහිප දිනක් වූ අතර රාජ්‍ය අරාජික වීමෙන් වැලැක්වීම සඳහා , නයි මුගටි මෙන් පසමිතුරු වූ පාලක පක්ෂය හා විපක්ෂය එකතුව රජයක් පිහිටුවා ගත්හ. අලුතින් පත්වූ ජනාධිපතිවරයා අරගලකරුවන්ගේ සියලු ඉල්ලීම් ලබා දීමට සාකච්ඡා කිරීමට සූදානම් බව මංගල කතාවෙන් ප්‍රකාශ කළේය. දිගු කාලයකින් සැනසුම් සුසුම්

හෙළු අරගලකරුවෝ ජනපතිවරයා හා සාකච්ඡාවට සිය යෝජනාවන් සකස් කොට සැනසිල්ලේ කලකට පසු රැයක් නිදන්නට වූහ.

අපේක්ෂද ඒ රාත්‍රියේ බණ්ඩාරනායක පිළිරුව අසල කුඩාරමේ නින්දත් නොනින්දත් අතර සිටි මොහොතක ඒ හමුදා බණ්ඩයන් කඩා පැන්නේය. තුවක්කු බඳවල පහරින් අවදි වූ අරගලකරුවන් අඩපණ කොට පෙළ ගැස්වූ අතර අරගල භූමියේ කුඩාරම් මොහොතින් ගිනිබත් විය.

කොළඹට එදින ඉර පායන විට සියල්ල සන්සුන්ව තුබූ අතර අරගලයේ ප්‍රචණ්ඩකාරිව හැසුරුණු අරගලකරුවන් පිරිසක් බන්ධනාගාර ගත කළ අතර අන් සියල්ලන් විසිර ගිය බව ප්‍රවෘත්ති විකාශනය වූ අතර ඒ නිවේදනය අසන ගමන් මහජනතාව නැවත සුපුරුදු ජීවන අරගලයට යොමු ව සිටියෝය.

දේශපාලකයෝ ඡන්දය ඉල්ලූහ. ජනතාව ඔවුන්ට ඡන්දය දුන් අතර පසුව බැණ වැදුණෝය. පාසල් ළමයින් බරැති පොත්මලු එල්ලාගෙන පාසල් යන කල විශ්වවිද්‍යාල ශිෂ්‍යයෝ උද්ඝෝෂණ කළෝය. බෙබද්දෝ සූර් වන කල රජයේ සේවකයෝ උන්ට ඉරිසියා කරමින් අතිකාල කළහ. ඉරක් නැගී බැසයන විට මුදු රළ මෙන් ඔවුහු තරගයට දුවන්නට සූදානම්ව සිටියහ. එහි වෙනසක් දැනුණේ නම් අරගලකරුවන්ගෙන් කොටසකට පමණි. ඔවුහු දිවා රෑ වෙනසක් නොමැති සිරගෙයි ලැග සිටියෝය.

වසර හතරකට පසු වැලිකඩින් එළියට එන විට වෙනස්ව පැවතියේ වැවී පැසුණු තම කොණ්ඩය පමණක් බවද එළියේ සමාජය තවදුරත් එලෙසම බවද තේරුම් යාමට වැඩි වේලාවක් ගත නොවීය. සිරගෙට යන විට පසු පසින් ආ මහජන පෙරහැරවල්ද අත්පොළොසන් දෙන නීතීඥයෝද ගේට්ටුව පාමුල ඔහු පිළිගන්නට රැඳී නොසිටියෝය.

මහරගමින් බසයෙන් බැසගත් ඔහුට උවමනා වුයේ හැකි ඉක්මනින් ගෙදර බලා යාමටය. ඔහුට මැවී පෙනුණේ වල් බිහිව කැලෑ වැදුණු නිවසකි. එහෙත් එහි පැවතියේ නව නිවෙසකි. එපමණක් නොව කුඩා දරුවන් දෙදෙනෙකුද නිවසේ සෙල්ලම් කරමින් සිටියේය. මේ දසුනින් තිගැස්සුණු ඔහු දොර ළගට වී උගුර පැදුවේය. නිවෙසින් එළියට ආවේ මහරජාණන්ගේ පච්චයක් පපුවේ කොටාගත් හැඩි දැඩි පුරුෂයෙකි.

"ඇයි.....මොකද?...

"නෑ...මේ මගේ ගේ තිබුණු තැන....ඔයාල කව්ද?"

"අපි තමයි මෙතන සල්ලිවලට අරගෙන ඉන්නේ...මේ ගෙදර හිටපු නංගියි මල්ලියි ගේ විකුණලා රට ගියා."

"ඒක වෙන්න බෑනේ මේ මගේ ගෙදර......"

"මේ මහත්තයෝ පිස්සු කෙළින්න එපා.... ගෙදර තමන්ගෙ නම් මෙච්චර කල් මකබෑවිලා හිටියද?"

"නෑ......මල්ලි මේ අර අරගලේ කේස් එකට හිරේ යන්න උනානේ.. ඇයි මතක නැද්ද අපිනේ රූපවාහිනිය අල්ලගත්තේ......."

"ආ... අරගලකාරයෙක්ද ...උන් තමයි රට කාපු උන්......." ගෙදර මිනිසා ගේ කෑ ගැසීමට වට වූ අවට මිනිසුන්ගෙන් පහර කෑමට ලක් වූ අපේක්ෂ ගැලවීගත්තේ බොහෝ අපහසුවෙනි. ඔහුට තම පියා සිහි විය. හසරක් නොදැන පිය මැන්න ඔහු නතර වී සිටියේ ගෝල් ෆේස් පිටියේය. එය එදා පටන් ඔහුට නිවහන විය.

පෝට් සිටිය පැත්තට යන්නට හැරුණු ඔහුට අද එය මනරම් ලෙස සරසා ඇති බව පෙනුණේය. එහි කෑමට යමක් නියත බව ඔහුගේ සිත ඔහුට ඉඟි කළේය. ඉක්මනින් එදෙසට හැරුණු ඔහුගේ දෙඅත් උරහිස් අසලින් දඬු අඬුවකට හසු වූවාක් මෙන් සිර විය. එලෙස දෙපසින් අල්ලාගෙන ඇදගෙන යන්නට වූ කල ඔහු "මෙන්න අරගලයට පහර දෙනවෝ " යි මර හඬ නැගුවේය. ඒ නොතකූ ඔවුන් ඔහු බස් රියකට දමා ඉන්ද වූ අතර එසැණින් බස් රිය පිටත් විය.

බස් රථයෙහි ඉදිරියේ සවිකර තිබූ රූපවාහිනියේ විකාශය ආරම්භ වූයේ පෝර්ට් සිටිය චීනයට වසර සියයකට ලබාදීම සඳහා ගිවිසුම් ගතවීමේ උත්සවයයි. රාජ්‍ය නායකයින් දෙපළ ගිවිසුම් හුවමාරු කරන විට අත් පොළසන් දෙමින් සිටි බහුතරයක් ඔහුගේ අරගල සගයන්ය. රූපවාහිනී තිරයෙන් ඈතුළත සිටි ඔවුහු අපේක්ෂ නොදුටුවෝය.

මේ අතර රූපවාහිනියෙන් කියැවුණේ කොළඹ නගරයේ අයාලේ යමින් සිටි යාචකයන් පිරිසක් රන්මිණිතැන්නේ අලුතින් ඉදිකරන ලද රැඳවුම් මධ්‍යස්ථානයක් වෙත යොමු කල බවයි.

චීන ජනාධිපතිවරයා කොළඹ නගරයේ සිරි නරඹන විට අපේක්ෂ රැගත් බස් රිය අධිවේගී මාර්ගයේ සැර දමා ධාවනය විය..

**-ඩබ්.එම්.එච්.ඒ.එස්.එස්.බී. ඒකනායක -**

(අගනුවර ශාඛාව)

## පද්‍ය රචනා (ළමා)

## ප්‍රථම ස්ථානය

# "අම්මා ගෙදර නෑ"

ඉර ආවේ නෑ අද
උදෙන්ම මගෙ මිදුලට
නින්ද ගිහින් කුරුල්ලන්ට
නෑ ඒ ගොල්ලන්ට බඩගිනි
කෙසෙල් කන්න එන
කොණ්ඩ කුරුල්ලා
තරහ වෙලාද කොහෙද අද
බත් ගුළි අරගෙන යන
ලේන් බබා
යන්න ඇති වෙන කොහේ හරි
වහලට උඩින් වෙනදාට
වී කරල් හොයාගෙන යන
ගිරා රංචුව
දැක්කෙ නෑ මම අද
අන්න මගෙ නංගියා
අඬනව ඇහැ ඇරිලා
කියන්න ඕන දුවලා ගිහින්
පාළුයි මුලු ගෙදරම
අම්මා ගෙදර නෑ අද

**කේ.බී.ඩෙවින් තේශක අබේසේකර**
මවගේ නම - බී.කුංචනා රංසිමාලි කාරියවසම්
(ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානය -ගාල්ල)

## දෙවන ස්ථානය

# "අහසෙයි මුහුදෙයි යාළුවො දෙන්නා"

**ගුවන් යානය -**

අහසේ ඉන්නයි පොළොවෙ රැඳෙන්නයි
උඩ ඉගිලෙන්නයි සිරි නරඹන්නයි
මිනිසුන් හැම රට රට ගෙන යන්නයි
අහස් යන්තරේ මගේ නම තමයි

**නෞකාව -**

මුහුදේ යන එන මිතුර මමයි
මාළු යාළු මට බොහෝ හිතයි
මහ සාගරයම මගේ ළඟයි
නැව කියන්නෙ නම් මගේ නමයි

**ගුවන් යානය -**

වලාකුළින් සීතලක් දැනෙයි
සීත සුළං රැල් ඇගේ හැපෙයි
කුරුලු යාළුවන් කතා කරයි
වැහි පොද එක දෙක ඇඟට වැටෙයි

**නෞකාව -**

මුහුදෙ සීත රළ ඇගේ හැපෙන්නේ
මුතු බෙල්ලන් මගෙ තනියට ඉන්නේ
තෝරු මෝරු ඇතින් පිහිනන්නේ
ක්ෂිතිජය අල්ලන්නයි මම යන්නේ

**ගුවන් යානය -**

ඔබට හැකිද අහසේ පියඹන්නට
තරු පිරිවර හා කතා කරන්නට
පාට සරුංගල් හා හිනැහෙන්නට
මට හැකි පවනට බඳු ඉගිලෙන්නට

**නෞකාව -**

කොහොමද ඔබ මහ බර ඔසවන්නේ
කුණාටු සමඟින් සටන් කරන්නේ
අකුණු ගසන කොට නොසැලී ඉන්නේ
මම මිස වෙන කවුදෝ එය දන්නේ

**ගුවන් යානය -**

මහා සුළි සුළඟක් එන අතරේ
කොහොමද ඉන්නේ සිඳු කතරේ
මුහුදු නිධානය ගැන වතුරේ
කියලා දෙනවද මගේ මිතුරේ

**නෞකාව -**

තරු මොනවද ඔබ හට පවසන්නේ
කුරුලු සුරපුරය මට නොපෙනෙන්නේ
කවදද මහවැසි බිමට වැටෙන්නේ
වලාකුළින් අනෙ දැන් අහපන්නේ

**ගුවන් යානය සහ නෞකාව -**

රණ්ඩු නොවී සාමෙන් ඉඳිමු
දෙන්නම රැකියා ඉටුකරමු
මිනිසුන් සමඟින් මිතුරු වෙමු
ලොවටම යහපත ඉටු කරමු

**එල්.එල්.විනුක සේමිත ලියනගේ**

මවගේ නම - එන්.එස්. මදනසිංහ

(ගෝනපල ශාඛාව)

## තෙවන ස්ථානය

# "නංගියේ"

ලැබුණු සුන්දර ත්‍යාගයකි මට
මුවග මත පිපි පොඩි සිනා කට
තුසිත දෙව්ලොව දෙවඟනකි නුඹ
මලකි නංගියෙ සුවඳ විහිදෙන

කුඩා කල මගෙ ළඟම කැරකෙන
ලොකු වෙලා දැන් අටකි වයසින
කල් ගොසින් මගෙ ඇකෙන් ගිලිහෙන
බයට නංගියෙ තැළුවෙ නුඹ හට

මද පවන මෙන් ගතෙහි දැවටෙන
පිපුණු මානෙල් මලක සිරියෙන
කිරි කටේ මුව අගින් හිනැහෙන
කරන් තරණය සයුර ජීවිත

**ප්‍රනාන්දු වෙනුති සුහස්නා මෙත්නදී**

මවගේ නම - ජී.ඩබ්. එරන්දි ශිරංගිකා පෙරේරා
නිමැවුම් සංවර්ධන සහ ව්‍යාපාර සැලසුම් ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය

**කුසලතා**

# "අලියා"

| | |
|---|---|
| කළු ගලක් | වගෙයි |
| හරිම හරි | ලොකුයි |
| ගොඩබිම | වෙසෙනා |
| අලියා මම | තමයි |

| | |
|---|---|
| ශාක | භක්ෂකයි |
| රංචු රංචු | සිටියි |
| කළු අළු | පාටයි |
| හරි ම | ලස්සනයි |

| | |
|---|---|
| දිග ම දිග | හොඬයි |
| වංගෙඩි | පාදයි |
| ලොකු ම ලොකු | බඩයි |
| හරි ම හරි | හැඩයි |

**එස්.එම්.සසිඳි දහම්සා සමරවීර**
මවගේ නම - යූ.ඒ.ඩී.අයි.ගයත්‍රි
(ගුරුගොඩ ශාඛාව)

**කුසලතා**

# "කුරුලු ලෝකය"

වනන්තරේ පිට්ටනියක මොනරු ඉන්නවා
එක මොනරෙක් පිල් විදහන් රැඟුම් රඟනවා
ගිරා පැටව් සේරම ටික ගීත ගයනවා
ගිරා පියා හරි සතුටින් රබන් වයනවා

දෙමලිච්චොත් ගිරවු එක්ක ගීත ගයනවා
නොයෙක් ජාතියේ කුරුල්ලො එතනට එනවා
තවත් මොනරු පිල් විදහන් රැඟුම් රඟනවා
ඒ ගොල්ලොත් හරි සතුටින් විනෝද වෙනවා

පිළිහුඩුවා මයිනා එක්ක රහස් ගොතනවා
කොට්ටෝරුවා ටක්! ටක්! ගා බාද කරනවා
දියකාවත් දියේ ගිලී නැටුම් නටනවා
ඒ අස්සෙත් නිසොල්මනේ වවුලෝ ඉන්නවා

**ඕහේන් මෙත්නුල මල්ලවාරච්චි**
මවගේ නම - ශානිකා අදිකාරම්
(පිළියන්දල ශාඛාව )

## ළමා රචනා (වයස අවු.09-12 කාණ්ඩය)

## ප්‍රථම ස්ථානය

# "මම සමනළයෙකු වෙමි."

එකමත් එක කාලයක හොඳින් හිරු බැබළෙන උදෑසනක දින හතක් බිත්තරයක් තුළ සිටීමෙන් පසු මාගේ සහෝදර සහෝදරියන් ද සමඟ පිටතට ආ හැටි මට තවමත් අද මෙන් මතකය. මම එම අඹ ගසේ ළපටි දළු කමින් නිදහස් ජීවිතයක් ගත කළෙමි. මා සමඟම ජීවත් වූ අනෙකුත් සමනළ දළඹුවන් සමඟ බලනා විට මගේ විශේෂය නම් මගේ සිරුර පුරා දීප්තිමත් කහ පැහැති ළප තිබීමයි. එහෙත් මට සතුරන්ද බොහෝය. එනම් පරපුටුවන් වන දෙබරුන් හා මැස්සන්ය.

නමුත් සති දෙකකින් පසු මම දළු කෑම නවතා මගේ වෙනත් මිතුරන් කළාක් මෙන් රන්වන් පැහැති කෝෂයක් අඹ ගසේ පහළ අත්තක බැඳ ගත්තෙමි. එම කෝෂය තුළදී මගේ ශරීරය කෙමෙන් වෙනස් වන ආකාරය මට දැනිණි. සති එක හා තුන අතර කාලයකදී මට මගේ කෝෂයෙන් පිටතට පැමිණිය හැකි විය.

කෝෂයෙන් පිටතට පැමිණෙන විට මගේ විශේෂ වෙනස්කම් කිහිපයක් සිදුවී තිබුණි. මට ඉතා අලංකාර, කහ පැහැති තිත් ඇති දුඹුරු පියාපත් පැමිණ තිබුණි. කෝෂයෙන් පිටතට ආ විගසම මා පියඹා ගියේ අඹ ගස අසලම තිබූ රෝස පඳුර වෙතටය. මගේ මිතුරන් වන හෙළ වනසරා, පිටනිල් කොළයා, රජතපති සමඟ මල්වතු කරා පියාඹමින් විවිධ මල් කුමරියන්ගෙන් පැණි බොමින් මම ඉතා සතුටු කාලයක් ගත කරමි.

නමුත් අතීතයේ මාත් සමග අඹ ගසේ වාසය කළ මිතුරන්ගෙන් බොහෝ දෙනා දැන් මා සමඟ නැත. ඒ ගෙම්බන්, කටුස්සයන් වැනි සතුන්ගේ ගොදුරු බවට පත්වීමට ඔවුන් හට සිදුවූ බැවිනි. වර්ෂාව යනු අපගේ තවත් සතුරෙකි. වර්ෂාව ඇද හැලෙන විට අප සෙවණක් සොයා පියඹා යන්නේ වැසි බිඳු වලට අපේ අත්තටු තෙමී පියැඹීමට නොහැකි වන බැවිනි. එබැවින් අපි නිතරම විමසිලිමත් ලෙස පරිසරයට සම්බන්ධ වෙමින් කාලය ගත කිරීමට නිතරම උත්සාහ දරමු.

සමනලයින් වන අපගේ ජීවිත කාලය ඉතා කෙටිය. නමුත් ජීවිත ගමනින් සමුගැනීමට පෙර සිදු කිරීමට මා බලාපොරොත්තු වන්නේ මා කිසි දිනක නරඹා නැති සමනළ කන්ද දැක බලා ගැනීමටයි. එබැවින් මා මගේ මිතුරු මිතුරියන්ද සමඟ මුනි සිරිපා වැඳ පුදාගැනීමට ලබන දෙසැම්බර් මස වනතුරු දින ගනිමින් සිටිමි.

**පී.සනුති වින්සඳී අනුරුද්ධ**

මවගේ නම - ඩබ්.ජී.ගොත්මි ධනුෂ්කා ආරියරත්න

ජාත්‍යන්තර අංශය

## ළමා කෙටිකතා (වයස අවු. 13-15)

## ප්‍රථම ස්ථානය

# "සැබෑ මිතුදම"

ඇන් කියන්නේ පුංචි ගැහැණු ළමයෙක්. ඇය ජීවත් වුණේ පුංචි ගමක ලස්සන ගෙදරක. හැබැයි ඇයට සොයුරු සොයුරියන් කවුරුත් හිටියේ නැහැ. අම්මයි, තාත්තයි එක්කයි ඇය ජීවත් වුණේ. ඒ වගේම ඇන් ඉගෙනීමටත් හරිම දක්ෂයි. ඇය හැම විභාගයකින්ම හොඳින් ලකුණු ගන්නවා. ඒ නිසා ඇගේ දෙමව්පියන් ඇයට හොඳින් උගන්වන්න වෙහෙසෙනවා.

නමුත් ඇන්ට ගැටළුවක් තිබුණා. ඒ තමයි එයාට යාළුවෝ නැහැ. සොයුරු සොයුරියන් කවුරුත් නැති නිසා ඇන්ට ඒ අඩුව හොඳින්ම දැනුනා. ඉතින් ඒවා අමතක කරන්න එයා හොඳට පාඩම් කළා, ඉගෙන ගන්න කටයුතුවලම යෙදුණා. ඒ නිසාම තමයි ඇන්ට යාළුවො නැත්තේ. හැමතිස්සෙම පොත පතේ වැඩ කරන නිසාත්, පන්තියේ ඉහළම ලකුණු ගන්න නිසාත් ළමයි ඇන්ට ඊර්ෂ්‍යා කළා. ඒ නිසා ඇන්ව කොන් කළා. ඒත් ඇය සැලුණේ නැහැ. හොඳින් වැඩ කළා.

දිනක් ඇන් හවස විවේක ගන්න වත්ත පහළට ගියා. එහෙම යනකොට පොඩි එළියක් දැක්කා. ළඟට යනකොටම ඒ එළිය වැඩි වෙලා ලස්සන සුරංගනාවක් මතු වුණා. ඇන්ගේ අතට පුංචි බලු පැටියෙක් දීපු ඇය "සැබෑ මිතුදම හඳුනගන්න" කියා අතුරුදහන් වුණා.

ඇන්ට ඒ කියූ කිසි දෙයක් තේරුණේ නම් නැහැ. ඇය බලු පැටියා දිහා බැලුවා. ඌ සතුටින් වලිගය වැනුවා. ඌට තිබුණේ දිලිසෙන ඇස් දෙකක්, ඇස් වලට උඩින් දුඹුරු තිත් දෙකක් තිබුණා. ඇඟම කළු පාටයි. ඒ අතර බඩ දෙපස හා මුහුණේ යම් දුඹුරු පැහැයක් තැවරී තිබුණා. ඇන් උගේ හිස අතගාමින් "මම ඔයාට රෝවර් කියලා නම තියෙනවා" යැයි කිව්වා.

ඉතා ඉක්මනින් රෝවර් උස් මහත් වුණා. ඇන් ඌට ආදරයෙන් සැළකූ නිසා රෝවර් ඇන් ළඟින්ම හිටියා හිටියා. පාසල් ආවේ ගියෙත් එකට, සෙල්ලම් කළෙත් එකට, කෑම කෑවෙත් එකට. අම්මාට හොරෙන්ම ඇන් මේසේ යටට මාළු විසි කරන්නේ රෝවර්ට තමයි. ඒ තරමට දෙන්නා යාළුයි. පාසලේ තියන්න සූදානම් වෙන නාට්‍යයටත් ඇන්ට ලැබුණේ බලු පැටියෙකුගේ චරිතය. ඒත් මේ සතුටු කාලයේ ගෙවී ගිහින් එක්වරම දුක්ඛිත කාලයක් උදාවුණා.

ඇන් බරපතල ලෙස රෝගී වුණා. මුළු ගෙදරම කලබල වෙලා. දෙමව්පියන්

දන්න හැම වෛද්‍යවරයෙකුටම කතා කළා. ප්‍රතිකාර කළා. නමුත් සුව වුණේ නැහැ. රෝවර් දවස ගෙව්වේත් දුකින් බිම වැතිරීගෙනමයි. මෙහෙම ඉන්නකොට දවසක් උං වත්ත පහළට ගියා. එවිට ලස්සන සුරංගනාව ආයෙත් මතු වුණා. සුරංගනාව දන්නවා රෝවර් මායා බල්ලෙක් බවත්, ඕනෑම දෙයක් මිනිසෙකුට වගේ තේරෙන බවත්. ඒ නිසා ඇය උගේ කනට ළං කරලා කිව්වා "කැලේ ඇතුළට වෙන්න තියෙන රාස්ස කන්දේ මුදුනේ තියෙන ගෙදර මායාකාරියක් ඉන්නවා. ඇය ළඟ තිබෙනවා ඕනෑම රෝගයක් සුව කරන්න පුළුවන් රතුපාට බෙහෙතක්. එය ගෙනැවිත් ඈන්ට දෙන්න" කියලා.

රෝවර් සතුටින් වලිගය වනා ස්තුති කර කැලය ඇතුළට දිව්වා. සීරීම්, තැලීම් ගැන පොඩ්ඩක්වත් හිතුවේ නැහැ. අන්තිමට දුවගෙන කන්දේ මුදුනටමත් ආවා. එතනදී රෝවර් දැක්කා අමුතු ගෙදරක්. වහලේ උළු පවා කැඩිලා. ජනෙල් වීදුරුත් කැඩිලා. හරියට කඩන් වැටෙන්න ඔන්න මෙන්න වගේ. ඒ තරම්ම අබලන්. රෝවර් ජනේලයකින් එබිලා බැලුවා. මායාකාරී ලොකු කල්දේරමක මොනවදෝ හදනවා. රෑ වෙලා ගියොත් හොඳයි කියා සිතූ රෝවර් පඳුරක් අස්සේ ගුලි වෙලා හිටියා.

ටික වේලාවකින් මායාකාරී නින්දට ගිය පසු රෝවර් කැඩුණු ජනේලයකින් ගේ ඇතුළට ගියා. ඇතුළ හරිම අඳුරුයි. රෝවර් කළුවරේ රාක්ක දිගේ බලමින් ගියා. එතකොටම රතු පාට දීප්තිමත් දෙයක් දැක්කා. මේ බෙහෙත තමා යැයි සිතූ රෝවර් එය රැගෙන කලබලේම එන්න හැදුවා. ඒත් කළුවරේ අර කල්දේරමේ හැපිලා ඒක බිම පෙරළුණා. ඒ සද්දෙට ඇහැරුණු මායාකාරී විදුලි වේගයෙන් දුවගෙන ආවා. "කවුද මගේ ගෙදරට රිංගුවේ? අපෝ මේ බලු පැටියෙක් නේද? අපොයි මෙන්න මූ මගේ රෙෆ්ලින් බෙහෙත අරගෙන යනවා. ඒයි ඔහොම ඉන්නවා..."යැයි කෑ ගසමින් රෝවර් පස්සෙන් එලෙව්වා. රෝවර් හරිම වේගවත්. ඒත් කළුවර නිසා උං අතරමං වුණා. මායාකාරී අල්ලගන්න අත ළං කරනකොටම අත සපා කෑ රෝවර් පසු නොබලාම දුවගෙන ආවා.

රෝවර් ඈන්ගේ ගෙදරට යනකොට හොඳටම රෑ වෙලා. ඈන් ඇඳේ නිදාගෙන හිටියා. රෝවර් හෙමින් ඈන්ගේ අත යන්තමට පහුරු ගෑවා. ඈන් ඇහැරුණාම බෙහෙත බොන්න දුන්නා. නිදිමතේ හිටිය නිසා ඈන් අම්මා දෙන මොනවහරි බෙහෙතක් කියලා හිතලා එක හුස්මට බීගෙන ගිහින් ආයෙත් නිදා ගත්තා. රෝවර් ඈන් දිහාම බලාගෙන හිටියා. එක පාරටම ඇය ප්‍රබෝධමත්ව අවදි වුණා. අම්මාටත් කතා කළා. "අම්මේ මට දැන් සනීපයි වගේ. කිසිම අමාරුවක් නෑ. ඔළුව රිදෙන්නෙත් නැහැ." අම්මා ඇවිත් බැලුවා. උණ පොඩ්ඩක්වත් නැහැ. තාත්තාත් ආවා බලන්න. හැමෝටම පුදුමයි. එතකොටම සුරංගනාව මතුවුණා. ඇය රෝවර්ගේ අපූරු වික්‍රමය ගැන කිව්වා. හැමෝම ඒක කට ඇරගෙන

අහන් හිටියා. ඊට පස්සේ සුරංගනාව ඈන්ගෙන් ඇහුවා "ඔයාට තේරුණාද සැබෑ මිතුදම මොකක්ද කියලා?" ඈන් පහළ බැලුවා. රෝවර්ගේ දඟකාර ඇස් දිලිසෙනවා. "ඔව්. සැබෑ මිතුදම කියන්නේ දුකේදීත්, සැපේදීත් එකටම එක වගේම ළඟින් ඉන්න යාළුවාගේ මිතුරුකමයි. හරියට රෝවර් වගේ" ඈන් එහෙම කියා රෝවර්ව ආදරයෙන් බදාගත්තා.

ටික දවසකින් තිබුණු පාසල් නාට්‍යයේ හොඳම නළුවා සම්මානයත් ඈන්ට ලැබුණා. ඈන් පාසලේ ජනප්‍රිය වුණා. යහළුවෝ ගොඩක් ලැබුණා. ඒත් ඒ කාටවත් රෝවර්ගේ තැන ගන්න බැහැ. ඈන් සහ රෝවර් හැමදාමත් හොඳම යහළුවන් වුණා.

**මිනුදි මෙත්සඳි වීරසිංහ**

මවගේ නම - ඩබ්.කේ.එල්.බී.එන්.සමන්ති

ශාඛා ණය (කලාප 2)

ළමා රචනා (වයස අවු.09-12 කාණ්ඩය)
දෙවන ස්ථානය
**විනුක සේමිත ලියනගේ**
මවගේ නම - නිසංසලා ස්වර්ණමාලි මදනසිංහ
ගෝනපල ශාඛාව

තෙවන ස්ථානය
**කේ.පී.සෙතුලි මිහිනදි කනුවන**
මවගේ නම - ඩබ්.ඒ.සුලෝචනී විජේසිංහ
තොඩුවාව ශාඛාව

කුසලතා
**හඳුන්නෙත්ති නිම්කි ප්‍රසත්මි ද සොයිසා**
මවගේ නම - යසිතා අලුත්ගෙදර
වෙළඳ සේවා - ආයතනික හා අක්වෙරළ අංශය

ළමා කෙටිකතා (වයස අවු.13-15 කාණ්ඩය)
දෙවන ස්ථානය
**කේ.පී.බිනුරි එක්මිණි**
පියාගේ නම - කේ.පී.සනත් ප්‍රියන්ත
හක්මණ ශාඛාව

තෙවන ස්ථානය
**මිණිපළඟ හුණුගේ හිරාන් සස්මිත**
පියාගේ නම - මිණිපළඟ හුණුගේ අරවින්ද ක්‍රිශාන්ත
රඹුක්කන ශාඛාව

ළමා කෙටිකතා (වයස 16-18 කාණ්ඩය)
කුසලතා
**එම්.ආර්.අමෝදි ඉරුදිනී ජයසූරිය**
එම්.ඒ.එම්.එස්.ජයසූරිය
රඹුක්කන ශාඛාව

ඡායාරූප (කළු සුදු)

ප්‍රථම ස්ථානය

"සමුද්‍රිමත්"



පසිඳු රණසිංහ

ආයතනික අයකරගැනීම් අංශය

ඡායාරූප (කළු සුදු)

දෙවන ස්ථානය

"මට මහළු වයසේ බැරිද වෙන වාදනා පෙරසේ"



රණගලගේ නලින්ද ලක්ෂාන්

පුහුණුකිරීම් සහ සංවර්ධන දෙපාර්තමේන්තුව - (tvBOC)

ඡායාරූප (කළු සුදු)

තෙවන ස්ථානය

**"Happiness"**




එච්.එස්.එන්. ෆොන්සේකා

මානව සම්පත් අංශය

ඡායාරූප (කළු සුදු)

කුසලතා

"ලෙන් වියන්"



එස්.යූ.ජයසූරිය

පදියපැලැල්ල

ඡායාරූප (කළු සුදු)

කුසලතා

"පිළිකන්න"



නදීශා පෙරේරා

අගනුවර ශාඛාව - චාරිකා අංශය

ඡායාරූප (කළු සුදු)

කුසලතා

"තුරු අතරින් අහස්ගැබ"



ඊ.පී.ඩී.මධුභාෂිනී

පිටකොටුව ශාඛාව

ඡායාරූප (වර්ණ)

ප්‍රථම ස්ථානය

"ගනඳුර විනිවිද"



ඩී.පී.ටී.එන්.බණ්ඩාර

නගර කාර්යාලය

ඡායාරූප (වර්ණ)

දෙවන ස්ථානය

"උරගාලංකාර"



ඊ.ඒ.ඩී.ඩී.ඒ. එදිරිසිංහ

නගර කාර්යාලය

ඡායාරූප (වර්ණ)

තෙවන ස්ථානය

**"Coming out from Sand"**



එච්.එස්.එන්.ෆොන්සේකා

මානව සම්පත් අංශය

ඡායාරූප (වර්ණ)

කුසලතා

"රැල්ලයි, වෙරළයි, බෝලෙයි, මමයි"



ආර්.යූ. දුලන්තිකා කලංසූරිය

අලෙවි අංශය

ඡායාරූප (වර්ණ)

කුසලතා

"කිරි දරුවෝ"



එස්. යූ. ජයසූරිය

පදියපැලැල්ල ශාඛාව

ඡායාරූප (වර්ණ)

කුසලතා

"දෙන්නෙ නෑ දෙන්නෙම නෑ"



පසිඳු රණසිංහ

ආයතනික අයකරගැනීම් අංශය

## කාර්ය මණ්ඩලීය චිත්‍ර

## ප්‍රථම ස්ථානය



**"චක්‍ර"**
නදීශා පෙරේරා
අගනුවර ශාඛාව-චාරිකා අංශය

## කාර්ය මණ්ඩලීය චිත්‍ර

## දෙවන ස්ථානය



**"පාසල් දිවියේ සොඳුරුම පන්ති-අඹ ගහ යට"**
ටී.එම්. ප්‍රභාගයා තිලකරත්න
පදියපැළැල්ල ශාඛාව

## කාර්ය මණ්ඩලීය චිත්‍ර

## තෙවන ස්ථානය



**"අවුරුද්ද"**

ආර්.ඒ.ඩී.එම්.අයි. රණසිංහ

මහරගම අධිශ්‍රේණි ශාඛාව

**කුසලතා**



**“සෙනෙහසක අරුත”**

ජේ.එස්.එස්. ද සොයිසා
ව්‍යාපෘති මූල්‍ය අංශය- ආයතනික ශාඛාව

## කාර්ය මණ්ඩලීය චිත්‍ර

## කුසලතා



**"මහමෙරක් තරම් වූ මව් සෙනෙහස"**

ඩබ්.ඒ.ඒ.යූ.ප්‍රේමචන්ද්‍ර

පැල්මඩුල්ල ශාඛාව

# කාර්ය මණ්ඩලීය චිත්‍ර


## කුසලතා



**"ගැමි අසිරිය"**
එම්.ඩබ්.අයි.එස්. ජයරත්න
කුරුණෑගල දෙවන නගර ශාඛාව

## කාර්ය මණ්ඩලීය චිත්‍ර

### කුසලතා



**"නාරි"**

ආර්.එම්.එම්.පී. රාජපක්ෂ

කොච්චිකඩේ ශාඛාව

## කාර්ය මණ්ඩලීය චිත්‍ර

**කුසලතා**



**"ජීවිතය"**

ජී.කේ. සුපිපි පබෝදිනී ගලබඩ

නීති අංශය- ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානය, රත්නපුර

ළමා චිත්‍ර - අවු. 03-05 වයස් කාණ්ඩය

**ප්‍රථම ස්ථානය**




**"මගේ අම්මා, තාත්තා, මම සහ අක්කා"**

කේ.එම්. අබිනු විදස් මනුමිත කුරුප්පු

**මවගේ නම :** ජී.කේ. සුපිපි පබෝදිනි ගලබඩ

නීති අංශය - ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානය, රත්නපුර

## ළමා චිත්‍ර - අවු. 03-05 වයස් කාණ්ඩය

### දෙවන ස්ථානය



**"බළල් පොරය"**

කේ.එම්.දිනිරු නෙතුම් තෙව්සස්

**මවගේ නම :** යූ.ඒ. පූර්ණි නුවන්දිකා පියවර්ධන

කඩවත අධිශ්‍රේණි ශාඛාව

**ළමා චිත්‍ර - අවු. 03-05 වයස් කාණ්ඩය**

**තෙවන ස්ථානය**



**"මමයි, මගේ යාළුවා සනුකියි"**

කේ.ඩී. අනුකි රුවන්සා දෙව්ලිනී චන්ද්‍රසේන

**මවගේ නම :** කේ.පී.ඩී.ආර්. සමෘද්ධි වික්‍රමරත්න

ව්‍යාපාර පුනර්ජනන හා පුනරුත්ථාපන බැංකු ඒකකය - කෑගල්ල

## ළමා චිත්‍ර - අවු. 03-05 වයස් කාණ්ඩය - කුසලතා



**"ඔරු පදිමු"**
ගමගෙදර ඔනිරු බෝතුස බණ්ඩාර
**මවගේ නම :** ඩබ්.එම්. නදීෂා රත්නායක
මධ්‍යම පළාත් කාර්යාලය



**"මම"**
ඉනුකි ජෙනාරා ද සිල්වා
**මවගේ නම :** එච්.එම්.එස්. හිඳුරංගල
මධ්‍යගත මෙහෙයුම් අංශය

## ළමා චිත්‍ර - අවු. 03-05 වයස් කාණ්ඩය - කුසලතා



**"අම්මා"**
ලිෂ්නි දිසංසා සේනානායක
**මවගේ නම :** ටී ඩිලීෂා මේධවී පියසේන
විජේරාම ශාඛාව



**"පෙරහැර"**
කේ.ජී.එස්.වයි. කාරියවසම්
**මවගේ නම :** පී.එච්.එස්. ලක්මාණි
නීති අංශය

## ළමා චිත්‍ර - අවු. 03-05 වයස් කාණ්ඩය - කුසලතා



**"අපි නිවාඩුවට ගමේ යනවා"**

කේ.එස්. තිංසනි දුලන්සා

**මවගේ නම :** එස්.පී. රශෝමා රත්නමාලි පියරත්න

අභ්‍යන්තර විගණක දෙපාර්තමේන්තුව

## ළමා චිත්‍ර - අවුරුදු 6- 10 වයස් කාණ්ඩය

## සම ප්‍රථම ස්ථානය



**"නංගිට උණ හැදිලා අම්මයි, මමයි බෙහෙත් ගේන්න යනවා"**
කේ.ඒ.එම්.පී. කස්තුරිආරච්චි
**මවගේ නම :** ඩබ්.එල්.පී.සී.ජී. විජේසිංහ
කිරිදිවැල ශාඛාව

ළමා චිත්‍ර - අවුරුදු 6- 10 වයස් කාණ්ඩය

සම ප්‍රථම ස්ථානය



**"අවුරුද්දේ මම වැඩියෙන්ම සතුටු වූ දවස"**

අමරකෝන්ගේ ඩිඇන් සෙයන්සා අමරකෝන්

**මවගේ නම :** ඊ එච් ඒ නිසංසලා

මිද්දෙණිය ශාඛාව

## ළමා චිත්‍ර - අවුරුදු 6- 10 වයස් කාණ්ඩය

## දෙවන ස්ථානය



**"අපේ ගෙදරට හාමුදුරුවෝ නමක් පිඬුසිඟා වැඩියා"**

සෙසලි අනුම්කා ප්‍රනාන්දු

**මවගේ නම :** අනුෂ්කා ඉඳුනාලි

කොල්ලුපිටිය දෙවන ශාඛාව

## ළමා චිත්‍ර - අවුරුදු 6- 10 වයස් කාණ්ඩය

## තෙවන ස්ථානය



**"ඇති යන්තම් ශිෂ්‍යත්ව විභාගය ඉවරයි"**

කේ.ඩී. චනුග එක්මින් සෙන්දිනු චන්ද්‍රසේන

**මවගේ නම :** කේ.පී.ඩී.ආර්. සමෘද්ධි වික්‍රමරත්න

ව්‍යාපාර පුනර්ජනන හා ප්‍රතිස්ථාපන බැංකු ඒකකය- කෑගල්ල

## ළමා චිත්‍ර - අවුරුදු 6- 10 වයස් කාණ්ඩය - කුසලතා



**"අපේ ගමට බොම්බයි මොටයිකාරයෙක් ආවා"**

බී.එම්. දිනුල දම්හිරු බාලසූරිය

**මවගේ නම :** දිනිති මධුභාෂිනී

පිටකොටුව ශාඛාව



**"ගහ උඩ සෙල්ලම් ගෙදර"**

කේ.පී. වත්නුලි හන්සදි කනුවන

**මවගේ නම :** ඩබ්.ඒ. සුලෝචනී විජේසිංහ

තොඩුවාව ශාඛාව

## ළමා චිත්‍ර - අවුරුදු 6- 10 වයස් කාණ්ඩය - කුසලතා



**"පාට පාට ගිරා පැටියා"**
දිනදි සෙහස්නා පල්ලෙවෙල
**මවගේ නම :** චතුරිකා රසංගි වික්‍රමනායක
අගනුවර ශාඛාව



**"වනයේ අසිරිය"**
ඒ.ඒ.එම්.ඩී. අධිකාරි
**පියාගේ නම :** ඒ.ඒ.ඩී.එම්.අධිකාරි
වයඹ පළාත් කාර්යාලය

## ළමා චිත්‍ර - අවුරුදු 6- 10 වයස් කාණ්ඩය - කුසලතා



**"සිරි මාමගෙ ගොවිපල"**
කේ.බී. ඩෙවින් තේශක අබේසේකර
**මවගේ නම :** බී. කුංචනා රංසිමාලි කාරියවසම්
ප්‍රාදේශීය ණය මධ්‍යස්ථානය- ගාල්ල



**"අපේ බුදුන් අපි වැන්දා"**
එස්.එම්.ඩී. මෙතුලි සෙහන්සා
**මවගේ නම :** ඒ.ඒ.කේ.ටී. අමරසිංහ
බේරුවල ශාඛාව



**"වැසි දිනයක අක්කයි මමයි"**
සයුනි සෙයන්සා ජයසිංහ
**මවගේ නම :** ජී.කේ.ඩී. ලක්මිණි චතුරිකා රත්නසිරි
මහරගම අධිශ්‍රේණි ශාඛාව



**"මගේ යාළු මාළු"**
ගීනුක විශ්වජිත් කාරියවසම් වැරණියගොඩ
**මවගේ නම :** ශලින්ද්‍රා මදුරාවල
වෙළඳ මූල්‍ය ව්‍යාපෘති අංශය

**ළමා චිත්‍ර අවුරුදු 11- 14 කාණ්ඩය**

**ප්‍රථම ස්ථානය**



**"අලුත් පාසලට මං ගියදා"**

ඩී.කේ.නෙතුකි නෙතාරා

**මවගේ නම :** පී.කේ.අයි.වසන්ති

කරාපිටිය ශාඛාව

## ළමා චිත්‍ර අවුරුදු 11- 14 කාණ්ඩය

## දෙවන ස්ථානය



**“නිවාඩු කාලේ සෙල්ලම් ලෝකේ”**

කේ.පී. සෙතුලි මිහිනදි කනුවන

**මවගේ නම** : ඩබ්.ඒ. සුලෝචනී විජේසිංහ

තොඩුවාව ශාඛාව

**ළමා චිත්‍ර අවුරුදු 11- 14 කාණ්ඩය**

**තෙවන ස්ථානය**



**"වනයක අසිරිය"**

මිනුකි ලෙසාරා කාරියවසම් වැරැණියගොඩ

**මවගේ නම :** ශලින්ද්‍රා මදුරාවල

වෙළෙඳ මූල්‍ය ව්‍යාපෘති අංශය

**ළමා චිත්‍ර අවුරුදු 11- 14 කාණ්ඩය - කුසලතා**



**"නයි නටවනවා"**

ඒ.ජී. තිනිරි තුමංෂා

**මවගේ නම :** ජී.පී. තිලකා අයිරාංගනී සෝමරත්න

ඇඹිලිපිටිය ශාඛාව




**"සන්නිදර්ශන - සොබාදහම් අසිරිය"**

පී.එච්. උමායා පබසරී රණසිංහ

**මවගේ නම :** එම්. කාංචනා සඳමාලි ප්‍රනාන්දු

වල්ගම ශාඛාව

## ළමා චිත්‍ර අවුරුදු 11- 14 කාණ්ඩය - කුසලතා



**"අවුරුදු කාලය"**

ආර්.එම්.කේ. සෙතුමි දහම්සා

**පියාගේ නම :** ආර්.එම්.කේ. සුසන්ත ගුණතිලක

මහව ශාඛාව



**"යහළුවන් සමඟ මුහුදු පතුලේ සංචාරයක්"**

ජේ.එම්. එසඳි තිසික්ෂා බෝධිරත්න

**පියාගේ නම :** ජේ.එම්.කේ.එච්. බෝධිරත්න

ව්‍යාපාර පුනර්ජීවන හා ප්‍රතිස්ථාපන අංශය

ළමා චිත්‍ර අවුරුදු 11- 14 කාණ්ඩය - කුසලතා



**"මගේ ගෙවත්ත මම ආසම විදිහට"**

පී. සනුති වින්සඳී අනුරුද්ධ

**මවගේ නම :** ඩබ්.ජී. ගොත්මි ධනුෂ්කා ආරියරත්න

ජාත්‍යන්තර අංශය

## ළමා චිත්‍ර අවුරුදු 15- 18 කාණ්ඩය

## ප්‍රථම ස්ථානය



**"යුද්ධය සහ ළමා මනස"**
එම්.එම්. රුවිනි අමන්දා නෙත්මිණි මානවිල
**මවගේ නම :** එල්.ජී.ඒ.ආර්.කේ. වේරගොඩ
අරණායක ශාඛාව

**ළමා චිත්‍ර අවුරුදු 15- 18 කාණ්ඩය**

**දෙවන ස්ථානය**



**"හෙළ කුල කත"**

එස්.එම්.ඩී. ගිම්හානි ගයාෂා

**මවගේ නම :** ඒ.ඒ.කේ.ටී. අමරසිංහ

බේරුවල ශාඛාව

## ළමා චිත්‍ර අවුරුදු 15- 18 කාණ්ඩය

## තෙවන ස්ථානය




**"සුන්දර පරිසරයක අසිරිය"**

යූ.එච්. තරුෂ සංදීප

**පියාගේ නම :** යූ.එච්. සරත් බන්දුල

ඇඹිලිපිටිය ශාඛාව



ලංකා බැංකුවේ සිංහල සාහිත්‍ය සංගමය